(*c*) Does not arise.

ලෝරි මරියදසන් මහතා, වාණිජ අධ්‍යක්ෂ

திரு. லோறி மரியதாசன், வர்த்தகப் பணிப்பாளர்

MR. LAWRIE MARIADASON, DIRECTOR OF COMMERCE

255/85

13. සරත් මුත්තෙට්ටුවෙගම මහතා (කලවාන)
(திரு. சரத் முத்தெட்டுவெகம — கலவான)
(Mr. Sarath Muttetuwegama–Kalawana)

වෙළඳ හා නාවික ඇමතිතුමා ගෙන් ඇසූ ප්‍රශ්නය:

(අ) ලෝරි මරියදසන් නැමැත්තෙකු වාණිජ අධ්‍යක්ෂ තනතුරට පත්කරනු ලැබුවේද ?

(ආ) ඔහු තවම මේ තනතුර දරයිද ?

(ඇ) ඩසෙල්ඩොර්ෆ්හි ශ්‍රී ලංකා ආයෝජන සහ වෙළඳ කාර්යාලයේ නියෝජිතයා ලෙසටත් ඔහු සමගාමීව පත්කර ඇත්ද ?

(ඈ) ඩසෙල්ඩොර්ෆ්හි පදිංචිව සිටිමින් ශ්‍රී ලංකාවේ වාණිජ අධ්‍යක්ෂකවරයා ලෙසින් ඔහුට කටයුතු කළ හැකියයි එතුමා විශ්වාස කරන්නේද ?

(ඉ) මේ පත්වීම් දෙක එකම තැනැත්තෙකුට දී තිබෙන්නේ මන්ද ?

வர்த்தக, கப்பற்றுறை அமைச்சரைக் கேட்ட வினா :

(அ) திரு. லோறி மரியதாசன் என்ஞெருவர் வர்த்தகப் பணிப்பாளர் பதவிக்கு நியமிக்கப்பட்டாரா ?

(ஆ) அவர் தற்பொழுதும் அப்பதவியில் தொடர்ந்து இருக்கின்ருரா ?

(இ) இப்பதவியிலிருந்தவாறே அவர் டுசல்டோப்பிலுள்ள இலங்கை முதலீட்டு, வர்த்தக அலுவலகத்தில் பிரதிநிதியாகவும் நியமிக் கப்பட்டுள்ளாரா ?

(ஈ) இலங்கையின் வர்த்தகப் பணிப்பாளர் டுசல்டோப்பில் வதிந்த படி பணியாற்ற முடியும் என அவர் நம்புகிருரா ?

(உ) இந்த இரட்டை நியமனங்கள் ஏன் ஒரே ஆளுக்கு கொடுக்கப் பட்டுள்ளன ?

asked the Minister of Trade and Shipping :

(*a*) Was one Mr. Lawrie Mariadason, appointed to the post of Director of Commerce ?

(*b*) Does he still continue to hold this post ?

(*c*) Has he concurrently been appointed representative at the Sri Lanka Investment and Trade Office in Dusseldorf ?

(*d*) Does he believe that Sri Lanka's Director of Commerce, can function while resident in Dusseldorf ?

(*e*) Why have these twin appointments been given to one person ?

එම්. එස්. අමරසිරි මහතා
(திரு. எம். எஸ். அமரசிறி)
(Mr. M. S. Amarasiri)

(අ) ඔව්. 81. 02. 25 දිනදිය.

(ආ) ඔව්.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[එම්. එස්. අමරසිරි මහතා]

(ඈ) ඩසෙල්ඩොර්ෆ්හි ශ්‍රී ලංකා වෙළෙඳ හා ආයෝජන මධ්‍යස්ථානයෙහි නියෝජිත වශයෙන් කටයුතු කිරීම සඳහා 84.08.16 දින සිට ඔහු මුදාහැර ඇති අතර, ඊට විකල්ප වශයෙන් දෙපාර්තමේන්තුවෙහි වඩාත්ම ජ්‍යෙෂ්ඨ ඊළඟ නිලධාරියා වාණිජ අධ්‍යක්ෂ ලෙස වැඩබැලීම සඳහා කටයුතු යොදන ලදී.

(ඇ) ඉහත (ඇ) අනුව පැන නොනඟී.

(ඉ) ඉහත (ඇ) අනුව පැන නොනඟී.

සරත් මුත්තෙට්ටුවෙගම මහතා
(திரு. சரத் முத்தெட்டுவெகம)
(Mr. Sarath Muttetuwegama)

This is a very peculiar situation. Surely, the Hon. Minister will agree that the Director of Commerce cannot be concurrently the representative at the Sri Lanka Investment and Trade Office in Dusseldorf. Or how can he concurrently be the Director of Commerce? Either that or the other one is a job that carries no functions.

එම්. එස්. අමරසිරි මහතා
(திரு. எம். எஸ். அமரசிறி)
(Mr. M. S. Amarasiri)

An Additional Director has been appointed to act.

සරත් මුත්තෙට්ටුවෙගම මහතා
(திரு. சரத் முத்தெட்டுவெகம)
(Mr. Sarath Muttetuwegama)

Will the Hon. Minister agree – No, I will not ask that.

එච්. ඊ. පියරත්න මහතා : පාරිතෝෂිකය

திரு. எச். ஈ. பியரத்ன : பணிக்கொடை

MR. H. E. PIYARATNA : GRATUITY

263/85

14. **සරත් මුත්තෙට්ටුවෙගම මහතා**
(திரு. சரத் முத்தெட்டுவெகம)
(Mr. Sarath Muttetuwegama)

වෙළඳ හා නාවික ඇමතිතුමාගෙන් ඇසූ ප්‍රශ්නය :

(අ) (i) පැල්මඩුල්ලේ සතොස සිල්ලර ගබඩාවට අනුයුක්ත කම්කරුවකු වන එච්. ඊ. පියරත්න නමැත්තා 1983/11/15 වැනි දින සේවයෙන් පහකළ බවත් ;

(ii) ඔහුගේ අංකය 6634 බවත් ;

(iii) සේවක පාරිතෝෂික නීතිය යටතේ ඔහු, 1984/11/15 වැනි දින දරන ලිපියෙන් ඔහුගේ පාරිතෝෂිකය ඉල්ලා සිටි බවත් ;

(iv) මේ දක්වාම ඔහුගේ ලිපිය ලැබුණු බැව් දැන්වීමක් හෝ ඔහුගේ පාරිතෝෂිකය හෝ ඔහුට ලැබී නොමැති බවත් ;

එතුමා දන්නේද ?

(ආ) එය වහාම ගෙවන ලෙසට එතුමා නියෝග කරන්නේද ?

வர்த்தக, கப்பற்றுறை அமைச்சரைக் கேட்ட வினா :

(அ) (i) பெல்மதுளை கூ. மொ. வி. சில்லறைக்கடை சிற்றூழியர் திரு. எச். இ. பியரத்ன என்பவர் 15.11.1983 இல் பதவி நீக்கம் செய்யப்பட்டுள்ளார் என்பதையும்;

(ii) இவருடைய இலக்கம் 6634 என்பதையும்;

(iii) ஊழியர் பணிக்கொடைச் சட்டத்தின்படி 15.11.1984 இல் இவர் தமது பணிக்கொடைக்கு விண்ணப்பித்துக் கடிதம் எழுதினார் என்பதையும்;

(iv) இவர் கடிதத்துக்கு மறுமொழியோ அல்லது பணிக் கொடையோ இதுவரை பெறவில்லை என்பதையும், அவர் அறிவாரா ?

(ஆ) இது உடனடியாக வழங்கப்பட அவர் உத்தரவிடுவாரா ?

asked the Minister of Trade and Shipping :

(*a*) Is he aware–

(i) that one Mr. H. E. Piyaratna, a labourer attached to the C.W.E. retail depot, Pelmadulla was dismissed from service on 15.11.1983 ;

(ii) that his number was 6634 ;

(iii) that under the employees gratuity law, he applied for his gratuity by letter dated 15.11.1984 ;

(iv) that he has receive neither an acknowledgement not his gratuity so far ?

(*b*) Will he order that this be paid forthwith ?

එම්. එස්. අමරසිරි මහතා
(திரு. எம். எஸ். அமரசிறி)
(Mr. M. S. Amarasiri)

(අ) ඔව්.

(ආ) ඔව්. මෙය ඉතාම ඉක්මණින් ගෙවීමට කටයුතු කරනවා.

රාජ්‍ය අමාත්‍යාංශය යටතේ ඇති ආයතන වෙනත් ආයතනවලට දුන් ණය

இராஜாங்க அமைச்சின் கீழுள்ள தாபனங்களுக்குக் கொடுக்கப்பட்ட கடன்கள்

LOANS GIVEN BY INSTITUTIONS UNDER THE MINISTRY OF STATE TO OTHER INSTITUTIONS

279/85

15. **අමරසිරි දොඩන්ගොඩ මහතා**
(திரு. அமரசிறி தொடங்கொட)
(Mr. Amarasiri Dodangoda)

රාජ්‍ය ඇමතිතුමාගෙන් ඇසූ ප්‍රශ්නය :

(අ) එතුමා යටතේ ඇති දෙපාර්තමේන්තු, සංස්ථා, සංයුක්ත මංඩල, මංඩල, රජයට පවරාගත් ආයතනවලට අයත් මුදල්වලින්, යම් කොටසක් එම අමාත්‍යාංශය යටතේ හෝ වෙනත් අමාත්‍යාංශයක් යටතේ ඇති දෙපාර්තමේන්තුවකට, සංස්ථාවකට, සංයුක්ත මංඩලයකට, මංඩලයකට, රජයට පවරාගත් ආයතනයකට හෝ පෞද්ගලික සමාගමකට ණය හෝ ආධාර වශයෙන් 1977 අගෝස්තු මස සිට 1985 මැයි මස දක්වා ලබා දී තිබේද ?

(ආ) එසේ නම්–

(i) ණය හෝ ආධාරය ලබා දුන් දිනය සහ ප්‍රමාණය ;

(ii) ලබා දී ඇත්තේ කිනම් ආයතනයකට ;

(iii) කුමක් සඳහාද ;

(iv) එම ණය හෝ ආධාරය ලබා ගැනීම පිණිස ඉල්ලුම් කරන ලද්දේද ? ඒ කවදද ?

(v) එම ණය හෝ ආධාරය ලබා දිය යුතු බවට නිර්දේශ කර ඇති අයගේ නම් සහ තනතුරු ;

(vi) ණය හෝ ආධාරය ලබා ගත් ආයතනය, එය ලබා ගන්නා විට එහි ප්‍රධානීන්, අධ්‍යක්ෂ මංඩලය හෝ අයිතිකරුගේ නම සහ ලිපිනයත් ;

(vii) ණය හෝ ආධාරය ලබා දීමේ ගිවිසුම් ;

(viii) එම ණය මුදල හෝ ආධාරය ආපසු ලබා දී තිබේද යන කරුණු එතුමා සඳහන් කරනවාද ?

(ඇ) එසේ නොවේ නම් ඒ මන්ද ?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

இராஜாங்க அமைச்சரைக் கேட்ட வினா :

(அ) அவரின் நிருவாகத்தின் கீழுள்ள திணைக்களங்கள், கூட்டுத் தாபனங்கள், இணைக்கப்பட்ட சபைகள், சபைகள், அரசாங்கம் கையேற்ற நிறுவனங்கள் ஆகியவைகளுக்குரிய பணத்தில், ஏதாவதொரு தொகை மேற்குறிப்பிட்ட அமைச்சின்கீழ் அல்லது வேறு அமைச்சின்கீழ் உள்ள திணைக்களத்திற்கு, கூட்டுத்

(ஆ) அவ்வாறெனில்,

(i) கடன் அல்லது உதவி நன்கொடையைப் பெற்றுக்கொடுத்த தேதி, தொகை;

(ii) எந்த நிறுவனத்திற்குப் பெற்றுக் கொடுக்கப்பட்டது ?

(iii) எதற்காக ?

(iv) குறித்த கடனை அல்லது உதவி நன்கொடையைப் பெறுவதற்காகக் கோரப்பட்டதா ? எப்போது ?

(v) குறித்த கடனை அல்லது உதவி நன்கொடையைப் பெற்றுக் கொடுக்க வேண்டுமெனச் சிபார்சு செய்திருப்பவர்களின் பெயர்களும் பதவிகளும் ;

(vi) கடனை அல்லது உதவி நன்கொடையைப் பெற்றுக் கொண்ட நிறுவனத்தில், இதனைப் பெற்றுக் கொண்டபோது இருந்த முக்கிய அதிகாரிகள், பணிப்பாளர் சபை, அல்லது உரிமையாளர் ஆகியோரின் பெயரும் முகவரியும்;

(vii) கடன் அல்லது உதவி நன்கொடையைப் பெற்றுக் கொண்டது தொடர்பான உடன்படிக்கைகள்;

(viii) இக்கடன் அல்லது உதவி நன்கொடை மீளப் பெறப்பட்டுள்ளதா ? இவ்விபரங்களை அவர் கூறுவாரா ?

(இ) இன்றேல், ஏன் ?

asked the Minister of State :

(*a*) Has any part of the funds of Departments, Corporations, Statutory Boards, Boards, Business Undertakings vested with the Government under his Ministry been given as loans or aid, to a Department Corporation, Statutory Board, Board or an institution vested with the Government or to a Private Company under his Ministry or any other Ministry during the period August 1977 to May 1985 ?

(*b*) If so, will he state–

(i) the date on which the loan or aid was given and the amount ;

(ii) the institution to which it was given ;

(iii) the purpose for which it was given ;

(iv) whether such loan or aid was applied for, and if so when ;

(v) the names and designations of those who recommended that the loan or aid should be granted ;

(vi) the names and addresses of Heads, Board of Directors, or owners of the institution at the time it obtained the loan or aid ;

(vii) the loan or aid agreements ; and

(viii) whether this loan or aid has been repaid ?

(*c*) if not, why ?

එම්. වින්සන්ට් පෙරේරා මහතා
(திரு. எம். வின்சன்ற் பெரேரா)
(Mr. M. Vincent Perera)

I answer on behalf of the Minister of State.

(*a*) No.

3 – A 084784 (85/07)

(*b*) (i), (ii), (iii), (iv), (v), (vi), (vii), (viii) and

(*c*) Do not arise.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

Question No. 8.

වීරවන්නි සමරවීර මහතා
(திரு. வீரவன்னி சமரவீர)
(Mr. Weerawanni Samaraweera)

මෙම ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා මාසයක් කල් අවශ්‍යයි.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

නොපැමිණීමේ අවසරය : මොන්ටේගු ජයවික්‍රම මහතා

வராதிருக்க அனுமதி : திரு. மொண்டேகு ஜயவிக்கிரம

LEAVE OF ABSENCE : MR. MONTAGUE JAYAWICKREME

එම්. වින්සන්ට් පෙරේරා මහතා
(திரு. எம். வின்சன்ற் பெரேரா)
(Mr. M. Vincent Perera)

I move,

"That Mr. Montague Jayawickreme, Minister of Public Administration and Minister of Plantation Industries, be granted leave under Article 66 of the Constitution, to be absent from the Sittings of the Parliament for a period of three months from today, 9th July, 1985."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பெற்று ஏற்றுக் கொள்ளப்பட்டது.
Question put, and agreed to.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

There are two matters of privilege that have been brought to my notice. The first has been raised by the hon. Member for Attanagalla (Mr. Lakshman Jayakody).

අත්තනගල්ල මන්ත්‍රී ලක්ෂ්මන් ජයකොඩි මහතාගේ පෞද්ගලික කරුණු පැහැදිලි කිරීම

அத்தனகல்ல அங்கத்தவர் திரு. லக்ஷ்மன் ஜயக்கொடியினது சொந்த விளக்கம்

PERSONAL EXPLANATION BY MR. LAKSHMAN JAYAKODY, MEMBER FOR ATTANAGALLA

ලක්ෂ්මන් ජයකොඩි මහතා
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)
(Mr. Lakshman Jayakody)

ගරු කථානායකතුමනි, 1985 ජුනි මස 21 දින පාර්ලිමේන්තුවේ පැවැති හදිසි නීතිය දීර්ඝ කිරීම පිළිබඳ විවාදයයේදී අගලවත්ත ගරු මන්ත්‍රීතුමා (මෙරිල් කාරියවසම් මහතා) මෙසේ ප්‍රකාශ කළා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

Hon. Member, this should be a personal explanation. By mistake, this has been down as a matter of privilege.

ලක්ෂ්මන් ජයකොඩි මහතා
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)
(Mr. Lakshman Jayakody)

Very well. I have also given notice of three questions for Written Answer today. I hope they will get into HANSARD.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

They always get into HANSARD.

ලක්ෂ්මන් ජයකොඩි මහතා
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)
(Mr. Lakshman Jayakody)

අගලවත්ත ගරු මන්ත්‍රීතුමා මෙහෙම කියා තිබෙනවා :

" ....ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි පොඩ්ඩක් කල්පනා කර බලමු. සිරිමා බණ්ඩාරණායක මැතිනිය ඇගේ සිවිල් අයිතිවාසිකම් ඉල්ලනවා. බැරිවෙලාවත් අතිගරු ජනාධිපතිතුමා එතුමියට සිවිල් අයිතිවාසිකම් දුන්නොත් අද ඇති වන තත්ත්වය මොකක්ද ? ඒ අට දෙනා මේ වෙලාවේ මේ ගරු සභාවේ නැති වුණත් අපි මේ ප්‍රශ්නය අහනවා. කොයි එක්කෙනාද නැගිටලා එතුමියට මෙතැනට එන්නට ඉඩ සලස්වන්නේ ? අත්තනගල්ලේ ගරු මන්ත්‍රීතුමා (ලක්ෂ්මන් ජයකොඩි මහතා) අස් වෙයිද ? "

මා මේ කියවූයේ 1985 ජූනි මාසයේ 21 වනද හැන්සාඩ් වාර්තාවේ අංක 951 දරන තීරුවෙන්.

තමුන්නාන්සේට මතක ඇති, මම මෙයට පැහැදිලි පිළිතුරු 1984 නොවැම්බර් මාසයේ 26 වැනිද හැන්සාඩ් වාර්තාවේ 8 වන තීරයේ සදහන් කර තිබෙනවා.

මම පැහැදිලි කරන්නට බලාපොරොත්තු වන්නේ මෙන්න මෙයයි. එතුමා ඉදිරිපත් කළ කාරණා සාධාරණ වූ හෝ වගකීමක් ඇති හෝ ඒවා නොවෙයි. ඒ මන්ද, ගරු සිරිමාවෝ බණ්ඩාරණායක මැතිනිය මෙම ගරු සභාවේ මන්ත්‍රීවරියක් වශයෙන් පත් වී ආවා. එතුමිය අස්වුණාට පසුව, පක්ෂයේ තීරණය අනුව හා එතුමියගේ විශේෂ තීරණය අනුව, මන්ත්‍රීවරයෙකු වශයෙන් මා මෙම ගරු සභාවට පත්වීම ලැබුවා. මම නැවත වරක් කියන්නට කැමතියි, යම් දවසක එතුමියට පුරවැසිභාවය ලැබුණාද එදිනට ක්ෂණිකව ඒ මොහොතේම මා මගේ ආසනයෙන් ඉල්ලා අස්වෙනවා. එසේම, එතුමියට දියයුතු අයිතිවාසිකම් සැම දෙයක්ම ලබා දීමට කටයුතු කරන ලෙස ඉල්ලන අතර, අගලවත්ත ගරු මන්ත්‍රීතුමාගෙන් ඉල්ලා සිටින්නට කැමතියි, එවැනි වැරදි හැඟීමක් හිතේ තියාගන්න එපාය, මේ ගරු සභාවටත්, මේ රටටත් එවැනි වැරදි හැඟීමක් ඇති කරවන්නට එපාය කියා. එවැනි අස් නොවන තත්ත්වයක් මා දැනට නියෝජනය කරන ආසනය සම්බන්ධයෙන් නොමැති බව මම කියන්නට කැමතියි.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

The second matter is a matter of Privilege raised by the hon. Member for Akmeemana (Mr. Richard Pathirana).

වරප්‍රසාද ප්‍රශ්නය : 1985 ජූනි 22 වන හා 24 වන දින "දිනමිණ" වාර්තා

சிறப்புரிமை விடயம் : 1985 ஜூன் 22, 24 ஆம் திகதிய 'தினமின' பத்திரிகைச் செய்திகள்

QUESTION OF PRIVILEGE : NEWS ITEMS IN THE "DINAMINA" OF 22nd AND 24th JUNE, 1985

රිචඩ් පතිරණ මහතා (අක්මීමන)
(திரு. றிச்சட் பத்திரன — அக்மீமன)
(Mr. Richard Pathirana–Akmeemana)

ගරු කථානායකතුමනි, පසුගිය 21 වනද හදිසි නීතිය දීර්ඝ කිරීම පිළිබද විවාදයේදී ගරු වෙළද හා නාවුක කටයුතු පිළිබද ඇමතිතුමා විසින් මෙම ගරු සභාවේදී කරන ලද ප්‍රකාශයක් උඩ ඊට පසු දින " දිනමිණ " ප්‍රවෘත්ති පත්‍රයේත්, ඊවාගේම එම මාසයේ 24 වනද " දිනමිණ " ප්‍රවෘත්ති පත්‍රයේත් වැරදි ආකාරයෙන් කරුණු පළ කර තිබුණා.

එම නිසා මම මේ අවස්ථාවේදී ගරු වෙළද හා නාවුක කටයුතු පිළිබද ඇමතිතුමා විසින් එදින කළ කථාවේ ඒ සම්බන්ධ කොටස හැන්සාඩ් වාර්තාවෙන් උපුටා දක්වන්න කැමතියි. එතුමා කියා තිබෙන්නේ මෙන්න මෙයයි. එතුමා, හාමුදුරුවන්ගේ ගාල්ලේ තිබුණු සත්‍යග්‍රහය සම්බන්ධ සිද්ධිය ගැන මෙහෙම කියා තිබෙනවා.

" ...එවිට නායක හාමුදුරුවෝ කිව්වා අපි එච්චර දෙයක් දන්නේ නැත, අපි මෙය කලින් යොද ගත් වැඩපිළිවෙළක්ය, ඒ අනුව සහභාගී වුණාය කියා. අපේ අක්මීමන ගරු මන්ත්‍රීතුමාත්, හබරාදූව කලින් සිටි මන්ත්‍රීවරයෙකු වූ ප්‍රින්ස් ගුණසේකර මහතාත්, බද්දේගම ගරු මන්ත්‍රීතුමාත් මා යන්නට කලින් ඒ ස්ථානයට ගොස් තිබුණා. මට එතැනදී දැන ගන්නට ලැබුණා කිසියම් පිරිසක් පත්‍රිකා වගයක් ගෙනැවිත් ඒ ස්වාමීන් වහන්සේලාට බෙදන්න දුන්නාය කියා. "

ගරු ඇමතිතුමාගේ කථාව හැන්සාඩ් වාර්තාවේ සදහන් වන්නේ එහෙමයි. නමුත් පසුවද 22 වනද " දිමිණ " පත්‍රයේත්, ඒවගේම 24 වනද " දිනමිණ " පත්‍රයේත් එම වාර්තාව සදහන් වී තිබුණේ මෙන්න මේ ආකාරයටයි.

"අක්මීමන, බද්දේගම ශ්‍රීලනිප මන්ත්‍රීවරුනුත් හබරාදූව හිටපු මන්ත්‍රී ප්‍රින්ස් ගුණසේකර මහතාත්, උදේ එහි ඇවිත් ගිහිත් තිබුණා. ඒ අය පෝස්ටරයක් බෙද දී තිබුණා. "

" දිනමිණ " පත්‍රය, වුවමනාවෙන්ම මෙම වාර්තාව වැරදි ආකාරයෙන් සදහන් කර තිබෙනවා. මෙයින් අදහස් වෙන්නේ අපි පෝස්ටර් බෙදුවාය කියලයි.

ගරු කථානායකතුමනි, අපි කරුණාවෙන් ඉල්ලා සිටිනවා මේ සම්බන්ධයෙන් කටයුතු කර, මේ වාර්තාව සම්පූර්ණයෙන්ම නිවැරදි කර දෙන හැටියට. එසේම මේ ගැන ඔබතුමා ඇතුළු පාර්ලිමේන්තුවෙන් සමාව ඉල්ලන හැටියටත් " දිනමිණ " පුවත් පතේ කර්තෘතුමාට, නියම කරන්නට ඕනෑ.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

The relevant newspaper should please note that an immediate correction has to be published in tomorrow's newspaper with an apology to the hon. Member concerned.

විශ්‍රාම වැටුප් (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත

ஓய்வூதியம் (சிறப்பேற்பாடுகள்) சட்டமூலம்

PENSIONS (SPECIAL PROVISIONS) BILL

දෙවන වර කියවීමේ නියෝගය කියවන ලදී.
இரண்டாம் மதிப்பிற்கான கட்டளை வாசிக்கப்பட்டது.
Order for Second Reading read.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

එම්. වින්සන්ට් පෙරේරා මහතා
(திரு. எம். வின்சன்ற் பெரேரா)
(Mr. M. Vincent Perera)

On behalf of the Prime Minister and Minister of Local Government, Housing and Construction and Minister of Highways and Minister of Emergency Civil Administration, I move,

"That the Bill be now read a Second Time."

This Bill seeks to make provision to reckon for the purpose of pension –

(*a*) service as a civilian employee under the British Government in the former British Services Establishment in Sri Lanka ; or

(*b*) service in the armed forces of the British Government or in their bases in Sri Lanka.

Officers who had such prior service under the British Government have now retired and this Act provides for the revision of their pensions so that they will be eligible to draw a higher pension.

Where any gratuity has been paid under any regulation in respect of any person with civilian service or service in the armed forces of the British Government or their bases in Sri Lanka, such gratuity will be deducted from any payment due to such person as commuted gratuity or pension as a result of this revision.

I commend this Bill to the House.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

வினா எடுத்தியம்பப்பெற்றது.

Question proposed.

සරත් මුත්තෙට්ටුවෙගම මහතා
(திரு. சரத் முத்தெட்டுவெகம)
(Mr. Sarath Muttetuwegama)

ගරු කථානායකතුමනි, විශ්‍රාම වැටුප් විශේෂ විධිවිධාන පනත් කෙටුම්පත පිළිබඳ මෙම විවාදයේදී, මෙම විශ්‍රාම වැටුප්වලට අදාළ නොවුණත්, විශ්‍රාම වැටුප් පිළිබඳ කාරණයක් මේ ගරු සභාවේ අවධානයට යොමු කරවන්න කැමතියි. හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට විශ්‍රාම වැටුප් සකස් කිරීමේදී අනුගමනය කර තිබෙන වැඩපිළිවෙළ තමි, දැනට මන්ත්‍රීවරුන්ට ගෙවන වැටුප අනුව ඒ විශ්‍රාම වැටුප් සකස් කිරීමයි. එනම්, වැඩිකළ මන්ත්‍රී දීමනාව අනුව හිටපු මන්ත්‍රීවරුන්ගේ විශ්‍රාම වැටුප් වැඩිකිරීමයි. එයට සම්පූර්ණයෙන්ම අනුමතිය දක්වන බව මා කියන්න කැමතියි. නමුත් රජයේ සේවකයින් සම්බන්ධයෙන් ඒ තත්ත්වය නැහැ. රජයේ සේවකයින්ගේ වැටුප් වැඩි වූ විට ඒ අනුව විශ්‍රාම වැටුප් සකස් වෙන්නේ නැහැ. මෙහි විෂමතාවයක් තිබෙනවා. රජයේ සේවකයින්ටත් ඔවුන්ගේ වැඩිවන වැටුප් අනුව විශ්‍රාම වැටුප් වැඩි කිරීම සඳහා කටයුතු යොදන්නය කියා මා පළමුවෙන්ම කියන්න කැමතියි.

අනික් කාරණය, අපි මේ සභාවේ අවුරුදු ගණනක් තිස්සේ කියන එකක්. තමුන්නාන්සේලාගේ ආණ්ඩුවෙන්ම විශ්‍රාම වැටුප් සකස් කිරීමේදී 1978 න් පසුව විශ්‍රාම වැටුප් ගන්නා උදවියත්, 1978 ට පෙර සිට විශ්‍රාම වැටුප් ගන්න පටන් ගත්ත උදවියත් අතර විෂමතාවයක් ඇති වුණා. මේ විෂමතාවය නැති කර සැම දෙනාටම සම්පූර්ණ පඩිය මත විශ්‍රාම වැටුප් ගෙවීමට කටයුතු යොදන්නය කියා මා රජයෙන් ඉල්ලා සිටිනවා.

ලක්ෂ්මන් ජයකොඩි මහතා
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)
(Mr. Lakshman Jayakody)

ගරු කථානායකතුමනි, බ්‍රිතාන්‍ය කඳවුරු තිබෙන කාලයේදී හමුදා ශ්‍රේණිවල, සිවිල් ශ්‍රේණිවල සිටි උදවියට විශ්‍රාම වැටුප් හා අතිකුත් දීමනා දීම නීත්‍යානුකූල කිරීමේදී එම කාල සීමාවත් ඒකරාශි කර විශ්‍රාම වැටුප් සකස් කිරීම පිණිස ඉදිරිපත් කර ඇති මේ පනත ඉතාම කාලෝචිතය කියා මා කියන්න කැමතියි.

මට මතකයි, පසුගිය ආණ්ඩුව කාලයේදී යම් යම් ශ්‍රේණිවල සේවය කළ උදවියට විශ්‍රාම වැටුප් ගෙව්වා. නමුත් සමහර ශ්‍රේණිවල කාල සීමාව අවසන් වන්නට පෙර විශ්‍රාම වැටුප් ගෙවන්නට බැරි නිසා ඒ කටයුත්ත ඉටු කිරීම කල් දැම්මා. විශ්‍රාමලත් සොල්දාදුවන් සහ සිවිල් සේවකයින් වෙනුවෙන් මේ ගෙවන මුදලට අපි සම්පූර්ණයෙන්ම අනුකූලතාව දක්වනවා.

විශ්‍රාම වැටුප් ලබමින් සිටින්නාවූ, එහෙම නැත්නම් පෙන්ෂන් ගිය හමුදා සේවකයින් සම්බන්ධයෙන් මා වචනයක් දෙකක් කියන්න ඕනෑ. මෑතකදී මා හිතන්නේ, විශ්‍රාම ගිය හමුදා සේවකයින් නැවත සේවයට බඳවා ගැනීම ගැන රජය කටයුතු කර තිබෙනවා. එය ඉතාමත්ම ප්‍රඥාගෝචර ක්‍රියාවක්. ඒ මන්ද, ඒ විශ්‍රාම ලත් උදවිය බ්‍රිතාන්‍ය ආණ්ඩුව යටතේ මලයාසියාව, සිංගප්පූරුව සහ ඊජිප්තුව යන රටවල සේවය කරළ යුදමය පුහුණුවක් ලබාගත් උදවිය බව අපට කියන්න පුළුවන්. නමුත් කණගාටුයි කියන්න, මා ඊයේ – පෙරේදා පත්‍රයක දැක්කා මේ රජය ග්‍රාමාරක්ෂකවරුන් – හෝම් ගාඩ්ස් – සිය දෙනෙක් යුද පුහුණුව සඳහා පාකිස්තානයට යවන්න කටයුතු කරන්න යනවාය කියා. එවැනි පියවරක් අපි සම්පූර්ණයෙන්ම හෙළා දකිනවා. ග්‍රාමාරක්ෂකවරුන්ට දෙන යුද පුහුණුව පිළිබඳ ප්‍රතිපත්තිය මොකක්ද කියා පැහැදිලි කර නැහැ. ඒවා ඒ ඒ වකවානුවලදී වෙනස් වෙනවා. මේ ඊයේ පෙරේදා වෙන්නප්පුවේත් එක්තරා සිද්ධියක් ඇති වුණා. එමෙන්ම තවත් තැනකත් යම් සිද්ධියක් ඇති වී හරියාකාරව තුවක්කුව පාවිච්චි කරන්නට නොහැකි වී නිරපරාදේ සිවිල් ජීවිත ගණනාවක් නැති වී ගියා. යුද්ධ හමුදාවේ සේනාංකයක සිටි කෙනෙකුට වෙඩි තබා ඔහු මරණයට පත් වුණා. ඒ අයට යුද පුහුණුවක් නැහැ. එසේ තිබියදී අපි දන් ග්‍රාමාරක්ෂකවරු පුහුණු කරන්නට පාකිස්තානයට යවන්නත් හදනවා. පාකිස්තායට යැවීම හොඳයි. නමුත් අපි එකක් දැන ගන්නට කැමතියි.

වීරවන්නි සමරවීර මහතා
(திரு. வீரவன்னி சமரவீர)
(Mr. Weerawanni Samaraweera)

ගරු කථානායකතුමනි, ග්‍රාමාරක්ෂකවරු නොවෙයි, එය වැරදියි [බාධා කිරීමක්].

ලක්ෂ්මන් ජයකොඩි මහතා
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)
(Mr. Lakshman Jayakody)

පත්තරේ තිබුණා ග්‍රාමාරක්ෂක කියා. එය නැහැයි කියන්න එපා. තමුන්නාන්සේලා දන්නේ නැහැ. [බාධා කිරීමක්].

වීරවන්නි සමරවීර මහතා
(திரு. வீரவன்னி சமரவீர)
(Mr. Weerawanni Samaraweera)

අතිගරු ජනාධිපතිතුමා ගැසට් නිවේදනයක් නිකුත් කර තිබුණා ස්වදේශ ආරක්ෂක හමුදාවක් ඇති කරන්නය කියා. එය මාස 3 ක පමණ පුහුණුවක්. [බාධා කිරීමක්] සම්පූර්ණයෙන් වැරදියි. ඒක ග්‍රාමාරක්ෂක නොවෙයි. [බාධා කිරීමක්].

ලක්ෂ්මන් ජයකොඩි මහතා
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)
(Mr. Lakshman Jayakody)

May I say this ? There is what you call a National Auxiliary Force. That is a separate force, a voluntary force, coming under a Unit Commander of the Army. That is a different force. Here we have what is called the Home Guards. I am saying that 100 Home Guards

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ලක්ෂ්මන් ජයකොඩි මහතා]

are to be sent to Pakistan. Not only that. They are going to have a total of 25,000 Home Guards in this country. I am not saying that 25,000 are going to be sent to Pakistan. No. But they will train these 100 there and bring them here.

Now, my question is this. Why do you want to send these people to Pakistan ? Why can you not get your ex-servicemen, ex-army officers, ex-military officers, to train our young people here ? they know the conditions here. Sir, what is going to happen is this. We know how they rule in Pakistan today. We know the system of Government there. It is not that I am going to condemn the system of Government or condemn the attitude of the Government or condemn that Government or condemn anyone there. But we know the system of Government there. Do we want to impose the very same system of Government here, to have a *grama arakshaka* system here ? That is what I want to find out. I think, Sir, the correct position must be stated in this House.

If anyone wants to be trained, by all means let him be trained, because I thimk everyone should be trained. I know that there are some constables today, some young boys who have been brought in, who do not know which eye to close when they have to shoot with a gun. They even close the wrong eye because they are not trained. There are these ex-servicemen. They are prepared to come forward at a time of need. They are prepared to come and support the army, the navy, the air force, the police or any other security organization the country needs.

Once again, Sir, I think we should denounce any desire of the Government to send Home Guards for training abroad. Certainly send your army men for training. I have no objection at all to that. After all, we must learn about the new weapons that are being produced and we must be able to use the new weapons in case we want to defend ourselves. That is perfectly all right. But just imagine having 25,000 Grama Arakshakas !

It may be that very soon the ethnic problems are going to be solved. Then what is going to happen ? We will have the army and various groups of people of this type in this country. Therefore it is going to be a very serious matter. You should never have parallel armies. I have always been saying that. In this country one failure is this. Along with the police we are going to have the Grama Arakshakas. So there will be two categories of people doing the same job. You will be having parallel organizations doing the same job. That will never succeed. The cause of the death at Wennappuwa was because you had a parallel army.

Now, I would like the Government to clear this point. This was reported in the press, and the whole country knows about it. Let the correct position be stated in this House.

Thank you, Sir.

අමරසිරි දොඩන්ගොඩ මහතා (බද්දේගම)
(திரு. அமரசிறி தொடங்கொட — பத்தேகம)
(Mr. Amarasiri Dodangoda–Baddegama)

ගරු කථානායකතුමනි, මේ අවස්ථාවේ මමත් අදහස් කීපයක් ඉදිරිපත් කරන්නට කැමතියි. විශේෂයෙන්ම බ්‍රිතාන්‍ය හමුදාවල සේවය කළ විශාල පිරිසක් මේ රටේ සිටියා. මීට මාස දෙකකට පමණ කලින් එවැනි පුද්ගලයෙකුගේ විශ්‍රාම වැටුප පිළිබඳව මම මේ ගරු සභාවේදී ප්‍රශ්නයක් ඉදිරිපත් කළා. එයට පිළිතුරු වශයෙන් මට ලැබුණේ "බ්‍රිතාන්‍ය හමුදාවල සේවය කළ පිරිස්වලට විශ්‍රාම වැටුප් ගෙවීමේ වගකීම තිබෙන්නේ බ්‍රිතාන්‍ය ආණ්ඩුවටයි ; විශ්‍රාමිකයින්ගේ අරමුදලෙන් විමසලයි, ඒ වගකීම බාරගත්තේ" කියන එකයි. විශේෂයෙන්ම මේ විශ්‍රාමික කොටස්වලින් වැඩි දෙනෙක් දැනට ජීවතුන් අතර නැති බව මතක් කරන්න කැමතියි. ඒ අයගේ විශ්‍රාම වැටුප ලබා ගන්නට සිදු වන්නේ ඒ අයගේ යැපෙන්නන්ටයි ; ඒ අයගේ දරුවන්ටයි. එම නිසා විශේෂයෙන්ම දැනට ජීවතුන් අතර නැති එම විශ්‍රාමිකයින්ගේ වැටුප් ඒ අයගෙන් යැපෙන්නන්ට, මෙම විශ්‍රාම වැටුප් විශේෂ විධිවිධාන පනත යටතේ ගෙවනවාද කියා මම දැනගන්නට කැමතියි. ගරු කථානායකතුමනි, ශ්‍රී ලංකාව තුළ බ්‍රිතාන්‍ය ආණ්ඩුවේ හෝ බ්‍රිතාන්‍ය කඳවුරුවල හෝ සිවිල් සේවා නියුක්තයන්ගේ සහ සේවා මුක්ත භටයන්ගේ සේවාවන් පිළිබඳවයි, මේ පනතේ සඳහන් වෙන්නේ. නමුත් මෙයින් සමහර අය බ්‍රිතාන්‍ය රජය වෙනුවෙන් ලංකාවේත්, ලංකාවෙන් පිටස්තරවත්, ඒ කියන්නේ විදේශවලට ගිහිනුත් සේවය කළා. අන්න ඒ අය පිළිබඳවත් මෙම විශ්‍රාම වැටුප් සංශෝධන බලපානවාද කියා දැනගන්නට කැමතියි.

ගරු කථානායකතුමනි, මෙම පනතේ 2 වන වගන්තියේ විශ්‍රාම වැටුප් සඳහා ගණන් ගනු ලැබිය යුතු දිනය පිළිබඳව මෙන්න මේ ආකාරයට සඳහන් කර තිබෙනවා :

..... ඒ නියෝග හෝ ව්‍යවස්ථා සංග්‍රහය හෝ යටතේ විශ්‍රාම වැටුප් ගෙවනු ලැබිය යුතු සේවය ද සමග ඔවුන් සේවයේ නියුක්ත කර ගනු ලැබූ දිනය හෝ 1939 සැප්තැම්බර් මස 3 වන දිනය හෝ යන දින දෙකින් පසුව යෙදෙන දිනයෙහි සිට, විශ්‍රාම වැටුප් කාර්යය සඳහා ගණන් ගනු ලැබිය යුතු ය.

ඇත්තවශයෙන්ම මේ දිනය දෙවන මහා යුද්ධයට සම්බන්ධිතවයි, සඳහන් කර තිබෙන්නේ. නමුත් මෙම සේවයේ නිරත වුණු විශාල පිරිසක් අද ජීවතුන් අතර නැති නිසා බොහෝ දෙනෙකුගේ විස්තර සොයා ගන්නට අපහසුව තිබෙනවායයි මම සිතනවා. කීප දෙනෙකු මේවා පිළිබඳ විස්තර දැනගෙන සිටියත්, මේ විස්තර හුඟක්ම සටහන් ව තිබෙන්නේ බ්‍රිතාන්‍යයේ සේවාවන් පිළිබඳව විශ්‍රාමිකයන්ගේ අරමුදලට සම්බන්ධවයි. එම නිසා එම අරමුදලෙන් විස්තර ලබා ගෙන, මෙම සේවාවේ සිටි අපේ රට වැසියන් ගැන සොයා බලා, ඒ හැම කෙනෙකුටම විශ්‍රාම වැටුප් ලබා ගන්නට සැලැස්සුවොත් එය ඉතා වැදගත් බව මේ අවස්ථාවේදී මතක් කරනවා.

ගරු කථානායකතුමනි, මෙම විශ්‍රාම වැටුප් විශෙෂ විධිවිධාන පනතට අදාළ නොවුණත් මා සඳහන් කරන්නට කැමතියි, විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂතුමාට අද සෑහෙන තරම් දුරට තම කටයුතු කර ගෙන යාමට අපහසු වී ඇත්තේ විවිධ දෙපාර්තමේන්තුවලින් එතුමාට විශ්‍රාම වැටුප් විස්තර එවීමේ ප්‍රමාදය බව. ඇතැම් අවස්ථාවලදී මෙම විස්තර එවීම අවුරුදු තුනකින් පමණ පමා වෙනවා. විශේෂයෙන්ම අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ මේ පමාව දකින්නට ලැබෙනවා. මේ වාගේ සේවක සංඛ්‍යාව බහුල දෙපාර්තමේන්තුවල විශ්‍රාම වැටුප් විස්තර එවීම ඉක්මන් කළොත් විශ්‍රාම වැටුප් ගෙවීම ඉක්මනින් කරන්නට පුළුවන් වෙනවා. එම නිසා, විශ්‍රාම වැටුප් ක්ෂේත්‍රය ගැන මෙයට වඩා සැලකිලිමත් වන ලෙස ගරු ඇමතිතුමාගෙන් මා ඉල්ලා සිටිනවා. මොකද, වැටුප් ලබන අවස්ථාවටත් වඩා පුද්ගලයකු විශ්‍රාම ගත්තාට පස්සේ, විශ්‍රාමයෙන් ගත කරන කාලයේදී තමන්ගේ අබල - දුබල තත්ත්වය නිසා කිසියම් ආදායමක් අවශ්‍ය අවස්ථාවකයි පසුවෙන්නේ. එම නිසා ඒ අවශ්‍යතාව පිළිබඳව දෙපාර්තමේන්තුත්, සංස්ථාත්, ඒ වාගේම විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවත් ගනු ලබන ක්‍රියා මාර්ග ඒකාබද්ධ වැඩ පිළිවෙළකින් ඉටු

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කළ යුතු වෙනවා. එම නිසා විශ්‍රාම වැටුප් ලිපිගොනු සකස් කිරීම, විස්තර ලබා ගැනීම, විශ්‍රාම වැටුප් ගණනය කිරීම, මේ ආදී වශයෙන් විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂතුමාගේ කටයුතු ඒකාබද්ධ කර, විශ්‍රාම වැටුප් කොමිෂන් සභාවක් පිහිටුවීම පිළිබඳව යෝජනාවක් වශයෙන් කරුණු පැහැදිලි කිරීමක් කරන්න කැමතියි. ඇත්තවශයෙන්ම මේ අයුරින් හැම අංශයක්ම ඒකාබද්ධ කරන්නට පුළුවනි. මන්ද ? සමහර අවස්ථාවලදී සංස්ථාවල සමහර අය විශ්‍රාම වැටුප් ක්‍රමයට ඇතුළත් කරනවා. සමහර අය ඇතුළත් කරන්නේ නැහැ. නිදර්ශනයක් වශයෙන් මා ළඟ තිබෙනවා, වරාය කොමිෂන් සභාවේ සේවකයන් පිළිබඳ විස්තර. සමහර සේවකයන් නියමිත කාල සීමාවේ සේවය කර තිබුණත් විශ්‍රාම වැටුප් ලැබී නැහැ. මම ඒ ප්‍රශ්නය වෙනත් අවස්ථාවකදී ඉදිරිපත් කරනවා. කෙසේ වෙතත් විශ්‍රාම වැටුප් ක්‍රමයෙහි විධිමත් බව සඳහා විශ්‍රාම වැටුප් කොමිසමක් පත් කරන්නට පුළුවන් නම්, එමඟින් සියලුම දෙපාර්තමේන්තුත්, අමාත්‍යාංශත් විශ්‍රාම වැටුප් අංශය සමග ඒකාබද්ධ කරන්නට පුළුවන්ය කියන කාරණය මේ අවස්ථාවේදී අවසාන වශයෙන් මා සඳහන් කරනවා.

වෛද්‍යාචාර්ය පී. එම්. බී. සිරිල් මහතා (හම්බන්තොට දිසා ඇමතිතුමා)
(வைத்திய கலாநிதி பீ. எம். பி. சிறில்—ஹம்பாந்தோட்டை மாவட்ட அமைச்சர்)
(Dr. P. M. B. Cyril – District Minister, Hambantota)

ගරු කථානායකතුමනි, විශ්‍රාම වැටුප් (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත විවාදයට භාජන වන මේ අවස්ථාවේදී මාද වචන ස්වල්පයක් කථා කරන්නට බලාපොරොත්තු වෙනවා. මා ඉදිරිපත් කරන්නට බලාපොරොත්තු වන මේ කාරණය ත්‍රිවිධ හමුද විශ්‍රාම වැටුප් සම්බන්ධ විෂයයට අදාළ නොවූවත් ඒවාගේම මෙම සංශෝධන පනතට අදාළ නොවූවත් එය රාජ්‍ය සේවය හා රාජ්‍ය සේවකයන් සම්බන්ධව නිසා එයද ඉතා වැදගත් කරුණක් හැටියට සලකන්න පුළුවන්.

මම විශේෂයෙන් සඳහන් කරන්න බලාපොරොත්තු වන්නේ අද විශ්‍රාම යන රජයේ සේවකයන්ට මුහුණ පාන්න වන ගැටළු හා ඒ සම්බන්ධයෙන් ඔවුන්ට ඇති දුක්ගැනවිලි සම්බන්ධවයි. මෙසේ විශ්‍රාම යන රජයේ සේවකයන් ඇත්තෙන්ම තම ජීවිතයේ හොඳම කාලය රට වෙනුවෙන්, ජාතිය වෙනුවෙන්, රටේ සංවර්ධනය වෙනුවෙන් කැප කළ උදවියයි. මේ උදවියට විශ්‍රාම වැටුප් නියමිත වෙලාවට ලබාගන්න බැරුව කාර්යාල ගානේ දෙපාර්තමේන්තු ගානේ, නිලධාරීන් පස්සේ යාමට වන අවස්ථා අනන්තව තිබෙන බව අපට මේ කාලය තුළදී පෙනී ගොස් තිබෙනවා. එහෙම අවස්ථා ඇති වීමට ඉඩ තැබීම ඒ රජයේ සේවකයන්ට පමණක් නොවෙයි ජාතිය වෙනුවෙන් කරනු ලබන වරදක් කියා මේ අවස්ථාවේදී මම මතක් කරනවා.

පසුගිය දවස්වල අධ්‍යාපන ඇමතිතුමාත් සහභාගි වූ තිස්සමහාරාමයේ උත්සවයකදී අපට දකින්න ලැබුණා අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ අවුරුදු 35 ක් සේවය කර විශ්‍රාම ගිය ගුරුවරියකට මාස 9 ක් ඉක්මවලත් විශ්‍රාම වැටුප් නොලැබූ අවස්ථාවක්. අවුරුදු 35 ක් තරම් දීර්ඝ කාලයක් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ සේවය කළ එතුමියට උපහාර කිරීමටයි ඒ උත්සවය පැවැත්තුවේ. නමුත් අධ්‍යාපනය වෙනුවෙන් ජීවිතය කැප කර විශ්‍රාම ලබා මාස 9 ක් ගිහිල්ලත් තමාට විශ්‍රාම වැටුපක් ලැබුණේ නැත කියා එතුමිය අපට කරුණු දැක්කුවා. එතුමිය අපට කරුණු දැක්කුවා. එතුමිය අපට කිව්වා කීප වරක්ම දෙපාර්තමේන්තුවට යාම් ඊම් කරන්න සිදු වුණාය කියා. ඒ වාගේම අම්බලන්තොට බෝලාන විද්‍යාලයේ සේවය කරමින් සිට විශ්‍රාම ගිය ඉංග්‍රීසි ගුරුවරයෙකුට අවුරුද්දක් පමණ ගත වෙලත් තවමත් විශ්‍රාම වැටුප් ලැබී නැහැ. එතුමා ඉතාමත් දුක්ඛිත තත්ත්වයෙනුයි, අද ජීවිතය ගත කරන්නේ.

මේ කරුණු ගැන කල්පනා කරන විට තම ජීවිතයේ හොඳම කාලය රට වෙනුවෙන් ජාතිය වෙනුවෙන් කැප කර විශ්‍රාම ගත් පසුව ඒ විධියේ උපහාර උළෙලවල් පවත්වනවාටත් වඩා ඉතාමත් හොඳයි, ඒ සේවකයා විශ්‍රාම ගිය මාසයේදීම ඔහුගේ විශ්‍රාම වැටුප ලැබෙන විධියට ක්‍රියා කරනවා නම්. ඒ තැනැත්තාට දීර්ඝ කාලයක් මහත් ශ්‍රමයක් ගනිමින් විශ්‍රාම වැටුප් පිළිබඳ සෙවීමට බැලීමට ඉඩ නොතබා ඒ මාසයේදීම විශ්‍රාම වැටුප ලැබෙන්නට සැලැස්වීම තමයි, යුතුකම. එය ඒ තැනැත්තාගේ උරුමයක්. එම නිසා විශ්‍රාමිකයන්ට එවැනි අපහසුකම්වලට මුහුණ පාන්නට ඉඩ නොතබා විශ්‍රාම යන අවස්ථාවේදී ඔවුන්ගේ සිත් කලකිරීමට ඉඩ නොතබා විශ්‍රාම යන මාසයේ සිටම විශ්‍රාම වැටුප ලබා දෙන තත්ත්වයක් උදා කරන්නය කියා ඉල්ලා සිටිමින් මම නිහඬ වෙනවා.

පූ. භා. 10.43

රිචඩ් පතිරණ මහතා
(திரு. றிச்சட் பத்திரன)
(Mr. Richard Pathirana)

ගරු කථානායකතුමනි, විවාදයට භාජන වන මෙම විශ්‍රාම වැටුප් සංශෝධන පනතට කෙළින්ම අදාළ නොවුණත් විශ්‍රාම යාම පිළිබඳ කරුණු කීපයක් රජයේ අවධානයට යොමු කරන්න කැමතියි. පළමුවෙනි කාරණය දීර්ඝ කාලයක් තිස්සේ ඉදිරිපත් වී තිබෙන රජයේ සේවකයන්ගේ—විශේෂයෙන් අධ්‍යාපන සේවයේ ගුරුවරුන්ගේ—ඉල්ලීමක් ගැනයි. එනම්, අවුරුදු 20 ක් සේවය කළ පසු විශ්‍රාම යාමේ අවස්ථාව ලබා දෙන්නය කියා කරුණු දක්වා ඇති ඉල්ලීම ගැනයි. මෙය දීර්ඝ කාලයක් තිස්සේ රජයේ සේවකයන් විසින් කරනු ලබන ඉල්ලීමක්. ඇත්තවශයෙන්ම එවැනි අවස්ථාවක් සැලසූ විට ඒ කාල සීමාව සම්පූර්ණ වී විශ්‍රාම ලබන සේවක සංඛ්‍යාවට අනුකූලව අලුත් සේවක සංඛ්‍යාවක් බඳවා ගැනීමටත් අවස්ථාව ලැබෙනවා. එම නිසා රජය මේ කාරණය කෙරෙහි සැලකිල්ලක් දක්වා අවුරුදු 20 ක සේවා කාලයක් සම්පූර්ණ වී ඇති, තමන්ගේ කැමැත්තෙන් විශ්‍රාම ලබන්නට කැමති රජයේ සේවකයන්ට ඒ සඳහා අවස්ථාව සලසනවා ඇතැයි අපි බලාපොරොත්තු වෙනවා.

විශේෂයෙන්ම දැනට නොයෙක් අංශවල පළපුරුදුකම් ඇති රජයේ සේවකයින් සිටිනවා. ඒ අයගේ සේවය අවශ්‍යයි. සමහරවිට ඒ අයගේ සේවය නැතිව ඒ කටයුතු කරන්න බැරුවෙන්න පුළුවන්. ඒක එහෙම වුනත්, සමහර අංශවල රජයේ සේවකයින් සිටිනවා, ඔවුන් විශ්‍රාම ගියාම ඒ වෙනුවට අළුතෙන් අය බඳවාගන්නට පුළුවන්කම තිබෙනවා. ඒ නිසා මේ කාරණය ගැන කල්පනා කර, වර්ෂ 20 ක් සේවය කළාට පසුව, ස්ත්‍රී පුරුෂ භේදයක් නැතිව, ඕනෑම රජයේ සේවකයකුට සම්පූර්ණ විශ්‍රාම වැටුප් සහිතව විශ්‍රාම ලබන්නට අවකාශ සලසන හැටියට මම මේ අවස්ථාවේදී ඉල්ලා සිටින්නට කැමතියි.

හම්බන්තොට ගරු දිසා ඇමතිතුමාගේ කතාව මමත් අනුමත කරනවා. අධ්‍යාපන දෙපාර්තමේන්තුව යටතේ සේවය කරන ගුරුවරුන් විශ්‍රාම ලැබුවාට පසුව, බොහෝවිට, වර්ෂ ගණනාවක් ගතවෙනවා ඒ අයට නියමිත විශ්‍රාම වැටුප ලැබෙන්නට. සමහරවිට වර්ෂ දෙකක් පමණ ගතවෙනවා. ඒ කාලය තුළදී ඔවුනට ලැබෙන සුළු දීමනාව ඒ අයට ජීවත්වෙන්නට ප්‍රමාණවත් නැහැ. එම නිසා කෙනෙක් විශ්‍රාම ලැබුවාම ඉතාම ඉක්මණින් විශ්‍රාම වැටුප ලබාගන්නට පුළුවන් තත්ත්වයක් ඇති කිරීම අත්‍යවශ්‍යයි. මේ සම්බන්ධයෙන් පසුගිය දිනවල ලිපි රාශියක් පුවත්පත්වල පළවුණා. ඒ ගැන විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂවරයා කරුණු පැහැදිලි කර දී තිබුණා. ඔහු කියා තිබුණා විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ ප්‍රමාදයක් නිසා නොවේය කියා මේ තත්ත්වය ඇති වී තිබෙන්නෙ. අනික් අදාළ දෙපාර්තමේන්තුවලින් අවශ්‍ය තොරතුරු නියමිත වේලාවට විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට ලැබෙන්නෙ නැහැ. විශේෂයෙන්ම අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ මේ පිළිබඳව සෑහෙන ප්‍රමාදයක් තිබෙනවා. ඒ බව විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂවරයාත් පැහැදිලි කර තිබෙනවා මම පුවත්පත්වල දුටුවා. ඒ නිසා ගුරුවරුන් විශ්‍රාම ලැබුවාම නියමිත කාලයට විශ්‍රාම වැටුප් ලබාගන්නට පුළුවන් කමක් ලැබෙන්නෙ නැහැ.

අනික් කරුණ පෙන්ෂන් එක ඉක්මණට ලබා දුන්නාට මදි, මේ විශ්‍රාම ලැබූ අය තමන්ගේ පෙන්ෂන් එක ගන්න දිසාපති කාර්යාලයට ගිහිල්ලා විඳින දුක දැක්කාම සෑහෙන වේදනාවක් ඇති වෙනවා. ගාල්ලේ දිසාපති කාර්යාලයට ගියවිට අපට පෙනෙනවා ඒ අය විශ්‍රාම වැටුප ගන්නට කොපමණ කරදරයක් විඳිනවාද කියා. රජය මේ ගැන අනුකම්පාවෙන් කටයුතු කළොත් ඒ අයට, ඒ තත්ත්වය නැතිකර සහනයක් ලබා දෙන්නට පුළුවන්. සමහරවිට උදේ සිට හවස් වනතුරු නොයෙකුත් තරාතිරමේ රජයේ විශ්‍රාමිකයින් පෝලිමේ සිටිනවා. දීර්ඝ කාලයක් රටට සේවය කර, විශ්‍රාම ලැබුවාට පසුව තමන්ගේ මාසික විශ්‍රාම වැටුප ලබාගන්න සෑහෙන දුකක් විඳින්න ඒ අයට සිදුවී තිබෙනවා. එම නිසා විශ්‍රාමිකයාට සැනසිල්ලේ ගෙදර ඉඳගෙන තමන්ගේ මාසික විශ්‍රාම වැටුප ලබාගන්නට පුළුවන් තත්ත්වයක් ඇති කරනවා ඇතැයි බලාපොරොත්තු වෙමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.
පනත් කෙටුම්පත ඊට අනුකූලව දෙවන වර කියවන ලදී.

வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.
அதன்படி, சட்டமூலம் இரண்டாம் முறையாக மதிப்பிடப்பெற்றது.

Question put, and agreed to.
Bill accordingly read a Second time.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

මතු පළවන යෝජනාව සභාසම්මත විය. :

"පනත් කෙටුම්පත පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවකට පැවරිය යුතුය."– [එම්. වින්සන්ට් පෙරේරා මහතා]

தீர்மானிக்கப்பட்டது :

"சட்டமூலம் முழுப் பாராளுமன்றக் குழுவுக்குச் சாட்டப்படுமாக." [திரு. எம். வின்சன்ற் பெரேரா]

Resolved :

"That the Bill be referred to a Committee of the whole Parliament." – [Mr. M. Vincent Perera]

කාරක සභාවේදී සලකා බලන ලදී.

[කථානායකතුමා මූලාසනාරූඪ විය.]

குழுவில் ஆராயப்பட்டது.

[சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.]

Considered in Committee.
[MR. SPEAKER in the Chair.]

1 සිට 4 තෙක් වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

ප්‍රඥප්ති වගන්තිය සහ නාමය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

පනත් කෙටුම්පත, සංශෝධන රහිතව, වාර්තා කරන ලදී.

1 ஆம் வாசகத்திலிருந்து 4 ஆம் வாசகம் வரை சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமென கட்டளையிடப்பட்டது.

சட்டமாகு வாசகமும் தலைப்பும் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமென கட்டளையிடப்பட்டது.

சட்டமூலம் திருத்தமின்றி அறிக்கை செய்யப்பட்டது.

Clauses 1 to 4 ordered to stand part of the bill.
Enacting Clause and Title ordered to stand part of the Bill.
Bill reported without Amendment.

එම්. වින්සන්ට් පෙරේරා මහතා
(திரு. எம். வின்சன்ற் பெரேரா)
(Mr. M. Vincent Perera)

I move,

"That the bill be now read the Third time."

ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

පනත් කෙටුම්පත ඊට අනුකූලව තුන්වන වර කියවා සම්මත කරන ලදී.

வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

அதன்படி, சட்டமூலம் மூன்றும் முறையாக மதிப்பிடப்பெற்று நிறைவேற்றப்பெற்றது.

Question put, and agreed to.

Bill accordingly read the Third time, and passed.

ජනවසම : ප්‍රාග්ධනය වැඩි කිරීම
ஜனவசம : மூலதன அதிகரிப்பு
JEDB : INCREASE OF INITIAL CAPITAL

එම්. වින්සන්ට් පෙරේරා මහතා
(திரு. எம். வின்சன்ற் பெரேரா)
(Mr. M. Vincent Perera)

On behalf of the Prime Minister and Minister of Local Government, Housing and Construction and Minister of Highways and Minister of Emergency Civil Administration, I move,

"That in terms of section 22(3) of the State Agricultural Corporations Act, No. 11 of 1972, this Parliament resolves that the initial capital of Rupees Ten Million (Rs. 10,000,000) of the Janatha Estates Development Board, as published in the Gazette Extraordinary No. 199/IM of 6th February, 1976, be now increased to Rupees One Thousand Two Hundred Million (Rs. 1,200,000,000)."

I wish to explain that the Authorised Capital is being increased from Rs. 10,000,000 to Rs. 1,200,000,000 to accommodate (i) contributed capital of Rs. 990,600,000 disclosed in the accounts for the year ended 31st December, 1983 (ii) contributions from Government amounting to Rs. 64,900,000 received in the year 1984 and (iii) anticipated contributions from Government as grants in future amounting to Rs. 144,500,000.

This increase in the Capital Contribution has to be authorised by a Resolution in Parliament in terms of Section 22(3) of the State Agricultural Corporations Act, No. 11 of 1972.

I commend this Resolution.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.
வினா எடுத்தியம்பப்பெற்றது.
Question proposed.

ලක්ෂ්මන් ජයකොඩි මහතා
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)
(Mr. Lakshman Jayakody)

Sir, I think we would like to have more and better information about the JEDB. The Deputy Minister for Janatha Estates Development Board is here. If he can give an explanation at this moment, it will be very easy for us to make our observations about this increase of capital because a lot of money is being pumped into it. The initial Capital of Rs. 10 million is going to be increased to Rs. 1,200 million. That means there is a massive movement in the capital structure of the entire Janatha Estates Development Board, and I believe, Sir, it is going to be the same in regard to the SPC in time to come. Therefore, we would like to deal with this subject with reference to the structure and the activities of the JEDB because for us, Sir, it is the three crops that we have tea, rubber and coconut, are the life blood of this country. Before I make my comments, I would like if the Hon. Minister could explain to us as to why and for what reason is this increase sought. It is not that we do not know as to why and for what reason it has been increased up to Rs. 1,200 million from Rs. 10 million. Will the Hon. Minister agree to that ? I will make my comments after that.

හැරල්ඩ් හේරත් මහතා (ඇමතිතුමා සහ නියෝජ්‍ය ජනතා වතු සංවර්ධන ඇමතිතුමා)
(திரு. ஹரல்ட் ஹேரத் — அமைச்சரும் ஜனதா தோட்ட அபிவிருத்திப் பிரதி அமைச்சரும்)
(Mr. Harold Herath–Minister and Deputy Minister of Janata Estates Development)

The Resolution before the House is only to accommodate a prudent accounting practice, to maintain the authorized capital at a value in excess of the contributed capital in order to accommodate further increases in contributed capital.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

Sir, the Janatha Estates Development Board was formed in 1976 under the State Agricultural Corporation Act, No. 11 of 1972. At that time the initial authorized capital was only Rs. 10 million and the contributed capital was only Rs. 2,500,000. Since then, Sir, the contributed capital of the Janatha Estates Development Board has increased. The contributed capital has increased by contributions in cash ; then the value of the vested plantations being capitalized is likely to increase with lands of the LRC being vested in the JEDB. So, we have to make accommodation in the form of authorized capital. The proper accounting practice is to maintain authorized capital at a value in excess of the contributed capital. The contributed capital as it stands today, is Rs. 990,600,000. That is contributions in cash Rs. 503,936,000, the value of vested plantations capitalized Rs. 486,664,000 making a total of Rs. 990,600,000. Now we are asking the sanction of Parliament to increase the original authorized capital from Rs. 10 million to Rs. 1,200 million for this reason.

ආනන්ද දසනායක මහතා (කොත්මලේ)
(திரு. ஆனந்த தஸநாயக்க — கொத்மலே)
(Mr. Ananda Dassanayake–Kotmale)

What are the reasons ? I was not here. I am sorry.

එම්. වින්සන්ට් පෙරේරා මහතා
(திரு. எம். வின்சன்ற் பெரேரா)
(Mr. M. Vincent Perera)

Read the HANSARD !

හැරල්ඩ් හේරත් මහතා
(திரு. ஹரல்ட் ஹேரத்)
(Mr. Harold Herath)

The value might be further increased as a result of the contributions received from Government during 1984. I mentioned only up to 1984. That will be about Rs. 64,900,000. Then in regard to the value of the current account balances in respect of State Plantations Management Agencies, as a result of the vesting of plantations in terms of the recommendation of a Inter-Ministerial committee, His Excellency the President obtained the concurrence of the Hon. Minister of Finance and Planning to transfer these balances also to the Government Contributions Account by a Resolution in Parliament. Follow-up action in this connection is pursued at present. The approximate value of that contribution will be about Rs. 20,000 million. Provision for contributions from Government in future and the value of additional plantations transferred from the Land Reform Commission in 1983 – approximate provision Rs. 124,500,000. So to cover all this we went the authorized capital, which was Rs. 10 million to be increased to Rs. 1,200 million. It is a matter of formality, Sir, because this is already in operation and this is an accounting practice to maintain the authorized capital at a value in excess of the contributed capital and also in order to accommodate further increases in contributed capital.

ලක්ෂ්මන් ජයකොඩි මහතා
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)
(Mr. Lakshman Jayakody)

I am happy that he gave an explanation on the skeleton structure of what he wants to do. But all what I want to find out from him is whether, in terms of a circular that was sent out by the Hon. Minister of Finance that all Corporations making profit shall pay 50% of its profits to the consolidated Fund of the Treasury, the JEDB had made its contribution. Now this is piously followed by all the manufacturing sectors, all the agricultural corporation sectors like the Sugar Corporation and so on and all the profit making trading sectors like the Petroleum Corporation, which is one of the big Corporations. They are all making their 50% contribution of the profits. Has the JEDB or the SPC, I do not want to deal with the SPC now, given this money ? If it has, then of course, they are fulfilling their obligations but if they have not, let us know why ? That was one question I wanted to ask the Hon. Minister. I would like to tell him that the JEDB, was first formed as a Management Agency. It was only an agency to manage all the lands that were vested in the Land Reform Commission, and it was acting like an agency Company in doing their work. I agree they did not have much work other than planning as to what they are going to do with the lands that have been taken over by the State.

ආර්. ප්‍රේමදාස මහතා
(திரு. ஆர். பிரேமதாச)
(Mr. R. Premadasa)

I rise to a Point of Order. How can the hon. Member speak for a second time ?

ලක්ෂ්මන් ජයකොඩි මහතා
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)
(Mr. Lakshman Jayakody)

No, Sir, we got permission.

ආර්. ප්‍රේමදාස මහතා
(திரு. ஆர். பிரேமதாச)
(Mr. R. Premadasa)

No, no !

ලක්ෂ්මන් ජයකොඩි මහතා
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)
(Mr. Lakshman Jayakody)

I asked for the Hon. Speaker's permission.

ආර්. ප්‍රේමදාස මහතා
(திரு. ஆர். பிரேமதாச)
(Mr. R. Premadasa)

No, no. It is not fair.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

He reserved his right to speak after the Deputy Minister's explanation.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ආර්. ප්‍රේමදාස මහතා
(திரு. ஆர். பிரேமதாச)
(Mr. R. Premadasa)

It is all wrong procedure. This is not the committee stage.

ලක්ෂ්මන් ජයකොඩි මහතා
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)
(Mr. Lakshman Jayakody)

With due agreement with the Hon. Speaker we have the right.

ආර්. ප්‍රේමදාස මහතා
(திரு. ஆர். பிரேமதாச)
(Mr. R. Premadasa)

You can intervene or interrupt, but not make speeches like this. Then the others too will have the right to speak more than once. You are violating Standing Orders.

ලක්ෂ්මන් ජයකොඩි මහතා
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)
(Mr. Lakshman Jayakody)

What happened was this. With all due respect to the Hon. Prime Minister – the Hon. Minister read what was in the resolution.

Then, Sir, I said that we would like to know the reason because the Deputy Minister was here. Then the Deputy Minister got up and said: "All right I will explain."–

ආර්. ප්‍රේමදාස මහතා
(திரு. ஆர். பிரேமதாச)
(Mr. R. Premadasa)

But it is a wrong procedure. I must tell you. You cannot conduct business in the House like this. You are governed by Standing Orders.

ලක්ෂ්මන් ජයකොඩි මහතා
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)
(Mr. Lakshman Jayakody)

But anyway the Hon. Speaker has given me permission.

ආර්. ප්‍රේමදාස මහතා
(திரு. ஆர். பிரேமதாச)
(Mr. R. Premadasa)

Now he will have to reply again and you will have to –

ලක්ෂ්මන් ජයකොඩි මහතා
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)
(Mr. Lakshman Jayakody)

No, no, we are not going to talk after that.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

Before he sat down in the first instance, the hon. Member indicated to me that after the Hon. Deputy Minister's explanation he hoped to make his observations.

ආර්. ප්‍රේමදාස මහතා
(திரு. ஆர். பிரேமதாச)
(Mr. R. Premadasa)

But, Sir, that is all wrong procedure. You will not be able to conduct business in this House if you create these bad precedents. Then it will be just argument after argument, where you will sit down and another person will get up and so on; but what about the Committee stage?

ලක්ෂ්මන් ජයකොඩි මහතා
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)
(Mr. Lakshman Jayakody)

There is no Committee stage in this matter.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

This matter is not going to the Committee stage.

ආර්. ප්‍රේමදාස මහතා
(திரு. ஆர். பிரேமதாச)
(Mr. R. Premadasa)

Then he will have to take it up in some other manner.

ලක්ෂ්මන් ජයකොඩි මහතා
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)
(Mr. Lakshman Jayakody)

That is not fair.

ආර්. ප්‍රේමදාස මහතා
(திரு. ஆர். பிரேமதாச)
(Mr. R. Premadasa)

Sir, he can have a personal discussion with him somewhere else.

ලක්ෂ්මන් ජයකොඩි මහතා
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)
(Mr. Lakshman Jayakody)

No, personal discussions are not going to help us. After all, this is a place where we can voice our views.

ආර්. ප්‍රේමදාස මහතා
(திரு. ஆர். பிரேமதாச)
(Mr. R. Premadasa)

There is the Consultative Committee on that.

ලක්ෂ්මන් ජයකොඩි මහතා
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)
(Mr. Lakshman Jayakody)

I object to this idea of referring this to the Consultative Committee.

ආර්. ප්‍රේමදාස මහතා
(திரு. ஆர். பிரேமதாச)
(Mr. R. Premadasa)

Then, follow the rules of Debate.

ලක්ෂ්මන් ජයකොඩි මහතා
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)
(Mr. Lakshman Jayakody)

I got permission from the Hon. Speaker to speak.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ආර්. ප්‍රේමදාස මහතා
(திரு. ஆர். பிரேமதாச)
(Mr. R. Premadasa)

You are an experienced parliamentarian. You should know that you cannot convert this Parliament into a debating society !

ලක්ෂ්මන් ජයකොඩි මහතා
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)
(Mr. Lakshman Jayakody)

This is a debating forum.

ආර්. ප්‍රේමදාස මහතා
(திரு. ஆர். பிரேமதாச)
(Mr. R Premadasa)

No, this is Parliament governed by Standing Orders. There are no Standing Orders in debating societies.

ලක්ෂ්මන් ජයකොඩි මහතා
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)
(Mr. Lakshman Jayakody)

My goodness ! Why not ?

ආර්. ප්‍රේමදාස මහතා
(திரு. ஆர். பிரேமதாச)
(Mr. R. Premadasa)

They may have their own rules in debating societies, but these are accepted rules.

ලක්ෂ්මන් ජයකොඩි මහතා
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)
(Mr. Lakshman Jayakody)

This is the point, Sir. I do not want you and the Hon. Prime Minister to cross swords over this matter. I will certainly accommodate you.

I would like to say that this was originally a management agency.

ආර්. ප්‍රේමදාස මහතා
(திரு. ஆர். பிரேமதாச)
(Mr. R. Premadasa)

Is the Hon. Minister going to reply to this again ?

ලක්ෂ්මන් ජයකොඩි මහතා
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)
(Mr. Lakshman Jayakody)

I think the Hon. Minister of Parliamentary Affairs and Sports who moved the motion can reply.

එම්. වින්සන්ට් පෙරේරා මහතා
(திரு. எம். வின்சன்ற் பெரேரா)
(Mr. M. Vincent Perera)

I must ask the Deputy Minister to do that.

ලක්ෂ්මන් ජයකොඩි මහතා
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)
(Mr. Lakshman Jayakody)

That is right. The Hon. Minister of Parliamentary Affairs and Sports who made the original proposal can reply.

Now, Sir, it was originally a management agency, but now they have been given land from the Land Reform Commission. The estates are being vested in them. Therefore they have to raise it up to Rs. 1,200 million. In the meantime, these are the little problems which I am worried about. There was a Government component that you got from the Treasury totalling between Rs. 250 million and Rs. 300 million very recently or perhaps last year, for a particular project expenditure. Now, what has happened to that project expenditure or the Government contribution ? I can understand if you had given back 50 per cent of the profits, but if you have not yet given that back, what has happened to this Rs. 250 million to Rs. 300 million of project expenditure ?

We know, before 1983, the JEDB had massive liquidity problems, but suddenly – and very happily, with the will of God – the prices of tea rose and therefore we got enough money so that the JEDB and the SPC could carry on with the activities that they wanted to do. In fact, they are not only well away now, they have also wiped out all the commercial loans other than the money given by Treasury, and now they are anticipating further monies to be pumped in from three organizations.

One is the Maskeliya Project. They have a Project called the Maskeliya Project and that is completed. Therefore we would like to know what the result of the Maskeliya Project is, whether the total rehabilitation programme of tea is completed in that Project, whether it was done according to the estimates that were given. We would also like to have the estimated expenditure, the actual expenditure, the cost of tea per acre and also the number of hectares that have been replanted and infilled.

Now, there is also the second project in the Badulla area where you get all the best teas, the Uva highlands tea. Then, there was another Project called the Tree Crop Development Project, which is known as the Third Project, in Badulla itself. This year that is also being completed. Now, the Maskeliya Project is completed, the Tree Crop Development Project in Badulla is completed – these are the best teas that we have, the good flavoured teas.

So now we are going into the other phase of tea production, that is, the MTIP, the Medium Term Investment Programme.

Now, all these are coming on and steaming ahead. With all the monies that are infused by the ADB and all the monies that are coming in from the other commercial organizations, we are going to invest Rs. 5,000 million to Rs. 7,000 million in this particualr field of tree crops. I suppose the JEDB will be investing a little less than half this amount because 40 per cent of the tea comes from the JEDB and the SPC will be investing the balance amount.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ලක්ෂ්මන් ජයකොඩි මහතා]

So, our management practices must be very skilled. I say this because up to this date the JEDB are only doing a system which is called the financial audit. What we want to impress on the Hon. Minister and the Government is that it is high time that we not only go into the financial projections but also go into a management or an audit system. We must immediately move into an audit programme in management. If we do not do that, I am very sorry to say that we might not be able to get the best out of the monies that we are going to invest and, furthermore if we do not strengthen the internal audit section in that Ministry and in that Board, monies can go astray. We will have to be very careful about the money that we are putting into tea because that is the life-blood of our country.

The World Bank report says that we have got US $300 million as profit or excess profit because of the high price of tea. I think that is equivalent to the entire quantum of our debt service.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

How long will you take, hon. Member ?

ලක්ෂ්මන් ජයකොඩි මහතා
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)
(Mr. Lakshman Jayakody)

Another ten minutes, Sir.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

Order, please ! Mr. Deputy Speaker will now take the Chair.

අනතුරුව කථානායකතුමා මූලාසනයෙන් ඉවත්වූයෙන්, නියෝජ්‍ය කථානායකතුමා [නෝමන් වෛද්‍යරත්න මහතා] මූලාසනාරූඪ විය.

அதன் பிறகு, சபாநாயகர் அவர்கள் அக்கிராசனத்திலிருந்து நீங்கவே, பிரதிச் சபாநாயகர் அவர்கள் [திரு. நோமன் வைத்யரத்ன] தலைமை வகித்தார்கள்.

Whereupon MR. SPEAKER *left the Chair, and* MR. DEPUTY SPEAKER [MR. NORMAN WAIDYARATNA] *took the Chair.*

ලක්ෂ්මන් ජයකොඩි මහතා
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)
(Mr. Lakshman Jayakody)

Sir, I was on this subject of – you may have been listening, Sir – the high price of tea and the quantum of money that we had accrued, totalling US $300 million. Therefore, Sir, with this high price of tea, the money that we are having, we have to spend very carefully. I think the JEDB have now liquidated all their debts to the banks and now they are free of debt. They are now not dependent on any bank loan. They are free from all Treasury loans also. But I am made to understand that they have deposited this money in some profit-making ventures or perhaps even in fixed deposits where they get interest. Is that true ? Can you do that ? Have you done that with permission ? Because if you are going to invest in fixed deposits, I believe you have to go through the government sector, namely, the Treasury.

As I said before, I am aware that they have not paid 50 per cent of their profits to the Treasury. In 1983, you might recollect, we made them income-tax free through the Budget. We have also given them a very decent price level for all their activities in tea. But, of late, there is a fear that the tea prices are going to collapse completely. Even though the Hon. Minister of Public Administration and Minister of Plantation Industries said that it is going to last till the turn of the century, our tea prices collapsed very recently and we are just above the cost of production mark so that we can just break even. The hon. Member for Kotmale says that they are just below the COP price. That is very dangerous. If it is below the COP price, I do not know what you are going to do ? You are going to run at a loss. But I personally feel that it cannot be below the COP price because the bigger the out-turn the bigger the COP has to be.

I do not know whether very soon there is going to be a reduction in the export duty or rather a reduction in the ad valorem tax. All this means, Sir, that we have to be extra careful because the time ahead is not so rosy as we thought. It is going to be rather bleak in the future. Therefore, Sir, we have to be very careful about monitoring this investment.

Are we geared to monitor all these investments that we are having ? Is the Auditor-General or anyone else geared to monitor this investment of Rs. 5,000 million ? It is not a small amount. You must be always on the ball, Sir. When you have to shift money for various programmes within the same organization, you should know very carefully to what areas you should shift money because the normal condition would be for you to shift the money from a productive area to a service area. This is the normal tendency that people have – to shift from a productive area to a service area.

Are we putting in more money for replanting ? Are we putting in more money for infilling ? Are we putting in more for soil conservation ? What quantum are we putting in for estate development ? What quantum are we putting in for machinery development ? What quantum are we putting in for factory development ? Are we putting up more factories for which we have not got the quantum of tea ? We all know that the tea prices have gone up, but the production of tea has come down. That is a known factor.

Of course, in the Central Bank report in one place they say that it is due to inclement weather ; in another place they say it is a favourable production of tea. In one place they say that the paddy has come down ; in another place they say that the paddy has gone up.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

There are various reports. The Central Bank reports are contradictory. I have never seen such a contradictory report as this. In the same paragraph you find two contradictory sentences. Therefore we find it rather difficult to follow them. We would like the Central Bank reports to be more factual and truthful. Today we find that Central Bank reports are not so factual and also not so truthful. Perhaps they want to paint a rosy picture then to the world abroad. The World Bank team has completed its task, but yet I want to say this. We have to monitor these investments very carefully.

Secondly, Sir, according to the Indian auction prices we find that more and more rubbishy teas are coming into the market today. It was very good some time ago. We had the CTC teas coming in a good way. But very recently we found that the tea that are rubbishy are coming into the market. Therefore the prices are coming down obviously. So one has to be extra careful to produce more quality-tea. While we agree to increase all these and bring the tea organization like the JEDB into a proper footing, we must always remember that this money has to be expended very carefully.

The JEDB controls a lot of coconut and very little rubber. The rubber prices are just squaring up. The hon. Deputy Minister of Social Services is here. He can talk more about coconut than I do. He comes from a very good coconut area and he knows what has happened to the cocount industry there. I do not know how the JEDB is going to face all these. Therefore it is a very serious situation. The hon. Deputy Minister in charge of the JEDB is also the Minister of Coconut Industries. And according to the JEDB reports that we get here the costs of production of DC per kg., of copra and coconut oil are so fluctuating that the nut producer's price has come down to about Rs. 910 per thousand according to the ARPI reports that have been produced. It is a very serious matter. The wholesale price is fluctuating now. In 1982 it fluctuated round about Rs. 1,335. Therefore, Sir, I think the Hon. Minister should consider a little more on coconut because all the coconut seems to be under the JEDB. It is not under the SPC. JEDB controls all the coconut.

Therefore, I would like to submit to the Hon. Minister the average wholesale price and cost of production of coconut products in 1983 and 1984, mainly for his activities of JEDB. The cost of production of desiccated coconut is Rs. 17.85 per kilogramme and the wholesale price of DC is Rs. 18.12. The cost of production of coconut oil is Rs. 17.57 per kilogramme and the wholesale price is Rs. 19.47. Copra is Rs. 9.38 per kilogramme and the average wholesale price is Rs. 13.15 per kilogramme. I am not going to talk about poonac. Ultimately, if you take the whole average price for the year, one thousand nuts for desiccated coconut cost Rs. 2,302 – that is not now. But when you sell copra the average price is Rs. 1,930 per thousand nuts. Now see the difference ! You can sell for Rs. 2,302 per thousand nuts for DC but for copra the price is only Rs. 1,930 per thousand nuts. If you sell your nuts to a DC organization they are not going to pay you Rs. 2,300 but they will pay you the lower figure of Rs. 1,900 and the miller gets the whole benefit. This is what is happening. Therefore the prices are coming down.

I will give you the current figures for 1985. The cost of production of DC is Rs. 16.35 and the sale price is Rs. 16.96. You can see what a small margin there is today. The cost of production of coconut oil is Rs. 15.84 and the wholesale price is Rs. 17.60 per kilogramme. Copra is Rs. 9.23 COP, and the sale price is Rs. 11.15 per kilogramme. A thousand nuts for DC you can sell for Rs. 1,500. But if you sell one thousand nuts of copra you get only Rs. 900 to Rs. 1,100. If you offer your nuts for sale they do not pay you the DC price of Rs. 1,500 ; they pay you the copra price of Rs. 900 or Rs. 1,100. Therefore, you can just imagine what a massive profit the middleman, the miller, is making from the producer.

Therefore, I suggest to the Hon. Minister to start a campaign. I am very happy that he is getting more and more nuts into the market to run his mills, but now we have found that he must go in for an intensive system of making more and more copra. Make all copra sheds uptodate in those areas. Have more and more copra sheds so that in case the producers find that the DC prices are coming down, they could shift over to copra, and if copra prices come down, shift over to DC. I believe if that is done, the trader cannot play havoc with the producer. The drop in prices is obviously due to higher production. There are no two words about it.

There is also another factor. That is the decrease of the local price as well as the foreign price. That is also a problem. That is why I originally said in this House, the Hon. Minister should concentrate more and more on the production angle so that he will be able to produce the copra which can be done at a producer level and then gear it to the market. If he does not do that, I feel that the prices of coconut will be high in Colombo and low in areas like Kuliyapitiya and Divulapitiya. In Kuliyapitiya a nut is 75 cts., but when you come to Colombo a nut is Rs. 2 or Rs. 2.50. [*Interruption*]. I am giving you a rational figure. I am not going to boost it up and say it is Rs. 3.50. A 75 cts. nut in our area is Rs. 2 here. That increase of Rs. 1.25 is the transport charge plus the cost of husking. The profit is to the wholesaler and to the retailer. In other words the producer gets 75 cents when all others up to the consumer level get Rs. 1.25. We are not benefited as producers and the consumers in Colombo are also not benefited on that price. It is the middleman who gets the benefit.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ලක්ෂ්මන් ජයකොඩි මහතා]

Therefore I would like the Hon. Minister to look into this factor. I do not say that he should transport his good nuts from Nattandiya because Nattandiya gives a very good outturn. I am not asking him to bring the Nattandiya nuts. He can turn them into copra. But there are nuts available on the fringe of the Kurunegala District. More towards Deduru Oya going right up to the North of Kurunegala, the Ibbagamuwa area, and the Wariyapola area coconut is very cheap – it is 75 cents. They do not get the advantage.

එන්. ඒ. සෙනෙවිරත්න මහතා (කෑගල්ල දිසා ඇමතිතුමා)
(திரு. என். ஏ. செனெவிரத்ன — கேகாலை மாவட்ட அமைச்சர்)
(Mr. N. A. Seneviratne–District Minister, Kegalle)

It is Rs. 1.75 !

ලක්ෂ්මන් ජයකොඩි මහතා
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)
(Mr. Lakshman Jayakody)

I will give it to you at 75 cents in Wariyapola [*Interruption*]. Maybe in the Kuliyapitiya town. That is why I say, Sir, you must do an intensive study of this subject because you have to deal with copra, you have to deal with oil, you have to deal with desiccated coconut. You have to give a steady market to the producer, a steady market to the JEDB and a steady market also to the person who consumes. And my submission today is that the coconut grower gets a low price while the consumer pays a high price, and it is the middleman who is making the profit.

පූ. භා. 11.21

ආනන්ද දසනායක මහතා (කොත්මලේ)
(திரு. ஆனந்த தஸநாயக்க — கொத்மலை)
(Mr. Ananda Dassanayake–Kotmale)

නියෝජ්‍ය කථානායකතුමනි, ජනවසමේ ප්‍රාග්ධනය රුපියල් ලක්ෂ 100 සිට ලක්ෂ 12,000 දක්වා වැඩි කිරීම සම්බන්ධයෙනුයි, මේ යෝජනාව ඉදිරිපත් කර තිබෙන්නේ. ඒ විධියට ප්‍රාග්ධනය වැඩි කිරීම ගැන අපේ කිසිම ප්‍රශ්නයක් නැහැ. ඒ විධියට ඒ මූලික ප්‍රාග්ධනය නැංවීම ඒ තරම් ප්‍රශ්නයක් නොවෙයි. ඒ සම්බන්ධයෙන් මා කථා කරන්න යන්නේ නැහැ, අත්තනගල්ලේ ගරු මන්ත්‍රීතුමා (ලක්ෂ්මන් ජයකොඩි මහතා) පැහැදිලි විස්තරයක් කළ නිසා.

මම විශේෂයෙන් කථා කරන්න ඕනෑ කරන්නේ වැවිලි කර්මාන්තය එක–එක අංශවලට, එක–එක අමාත්‍යාංශවලට බෙදා තිබීම ගැනයි. ඒ වතු එක–එක අමාත්‍යාංශවලට, එක–එක සංස්ථාවලට බෙදා තිබෙනවා. ඒ වතු සම්බන්ධයෙන් ඒ ඒ අමාත්‍යාංශය, ඒ ඒ සංස්ථාව ගන්නා තීරණ එකිනෙකට වෙනස්. සමහර විට එස්. පී. සී. එකෙන් ගන්නා තීරණ ජේ.ඊ.ඩී.බී. එකෙන් ක්‍රියාත්මක කෙරෙන්නේ නැහැ. ඒ වාගේම වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයෙන් ගන්නා තීරණ සමහර විට ජේ.ඊ.ඩී.බී. එකෙන් හෝ එස්.පී.සී. එකෙන් ක්‍රියාත්මක වන්නේ නැහැ. හුඟක් තැන්වල එකම දේ සම්බන්ධයෙන් අනුගමනය කෙරෙන වැඩ පිළිවෙළේ පරස්පර විරෝධතා තිබෙනවා.

ඒ මදිවාට ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂමට අයත්ව තිබුණු වතු ඉහත සඳහන් කළ කොටස්වලට බෙදා දී තිබෙනවා. කලින් සඳහන් කළ ඒවා මදිවාට ළඟකදී ඇති කර තිබෙනවා, ' Lanka Estates Development Limited කියා එකකුත්. ඒ විධියට මේ වැවිලි අංශයට සම්බන්ධ කොටස් ගණනාවක් තිබෙනවා. සමහර විට මන්ත්‍රීවරයෙකුට නම් ලැයිස්තුව අතට අරගෙන හොයා ගන්න පුළුවන් වෙයි, " අසුවල් වත්ත අයිති කාටද ? " කියා. නමුත් සාමාන්‍ය පුද්ගලයෙකුට නම් " මේ වත්ත අයිති කාටද, එහි පාලනය තිබෙන්නේ කාටද, අසුවල් වැඩ කටයුතු කෙරෙන්නේ මොන අමාත්‍යාංශයෙන්ද, අසුවල් සංස්ථාවෙන් පාලනය වන්නේ මොන වත්තද " කියා හොයා ගන්න පුළුවන්කමක් නැහැ. කිසිම සාමාන්‍ය පුද්ගලයෙකුට හොයා ගන්න බැරි තරමට වැවිලි අංශය එක–එක කොටස්වලට බෙදා දී තිබෙනවා. ඒ නිසා, මේ අංශයේ කටයුතු සම්බන්ධයෙන් කණ්ඩායම් ගණනාවක් තබා ගන්නේ නැතිව එකක්—දෙකක් පමණක් තබා ගන්නවා නම් එය ඉතා වැදගත් දෙයක් හැටියට මම සලකනවා.

හොයා බැලුවාම අපට පෙනුණා, ' Lanka Estates Development Limited ' එකෙන් කෙරෙන්නේ වෙන දෙයක් නොවෙයි, ඉඩම් විකිණීමය කියා. පසුගිය ආණ්ඩුව ඉඩම් පවරා ගත්තා. එසේ පවරා ගත් වතු ටික හොඳට දියුණු කර ඒවා සරුසාර වතු බවට පත් වුණාට පස්සේ දැන් ඒවා පුද්ගලයන්ට විකුණනවා. මගේ ආසනයේ උතුරු පුත්ඩළුඹය තිබුණා, රජයෙන් රුපියල් ලක්ෂ 40 ක් පමණ වියදම් කොට දියුණු කළ ෆැක්ටරියකුත් සහිත වත්තක්. දැන් එය කොම්පැණියකට විකුණා තිබෙනවා. මම දන්නේ නැහැ, ඒක කීයකට විකුණුවාද කියන එක ගැන. කොහොම වුණත් බොහොම අඩු ගණනකට වෙන්න ඕනෑ. මට ඒ මිල හොයා ගන්න බැරි වුණා. ඒ වාගේ දේවල් හොයා ගන්න බොහොම අමාරුයි. රම්බොඩ වත්ත බොහොම හොඳ වත්තක්. ඒ ෆැක්ටරියත් බොහොම හොඳ ෆැක්ටරියක්. කිසිම පාඩුවක් නැතිවයි, පසුගිය කාලයේ ඒක පවත්වා ගෙන ගියේ. මගේ ආසනයේ තිබෙන හොඳ සරුසාර වත්තක් ඒක. නුවරඑළියට රම්බොඩ පාස් යන විට හමුවන පළමු වැනි වත්ත, ඒකයි. දැනට අවුරුද්දකට පමණ උඩදී ඒක වික්කා. කොත්මලේ ජලාශය වැනි මහවැලි සංවර්ධන යෝජනා ක්‍රමයට අදාළ කටයුතු ඉඩම් නැතිවුණ අයට ඉඩම් බෙදා දීම සඳහා ඒ වත්ත ලබා දෙන්නය කියා පසුගිය කාලයේ අපිත්, මහවැලි සංවර්ධන අමාත්‍යාංශයත් ඉල්ලා සිටියා. ඒ ඉල්ලුවෙත් නිකම් නොවෙයි, මහවැලි අමාත්‍යාංශයෙන් සල්ලි දී ලබා ගන්නටයි. ඒවා යම්කිසි මුදලකටයි ඉල්ලුවේ. නමුත් දුන්නේ නැහැ. ඇත්ත වශයෙන්ම එල්.ඊ.ඩී.එල්. එක ඒ වතු තමන්ට ඕනෑ විධියට තව අයට විකුණනවා නම් වඩා වැදගත් ප්‍රශ්නය මොකක්ද කියන එකයි බලන්නට ඕනෑ. ඒ ප්‍රදේශයේ මිනිසුන්ට තිබුණු ඉඩම් ටික ගත්තා. නමුත් ඒ මිනිසුන්ගෙන් ඒ ප්‍රදේශයේම පදිංචි වෙන්නට ඕනෑ කෙනෙකුට ඉඩමක් ගන්නට දෙන්නේ නැහැ. ඒවා මුදලට ඉල්ලුවත් ලැබෙන්නේ නැහැ.

ඒ විතරක් නොවෙයි, ඊළඟට විශාල මුදලක් යොදවා වැවැත්ඩන් වත්තේ කර්මාන්තශාලාව හොඳට දියුණු කළා. එහෙම දියුණු කරලා ඒ වත්තත් ඒ වාගේම කර්මාන්තශාලාවත් පුද්ගලික අංශයට වික්කා. ඒ වාගේම නුවරඑළිය පැත්තට යනවිට පාර අයිනේම තිබෙන ග්ලැන්ලොක් ෆැක්ටරිය නුඹලාත් නාත්සේලා දන්නවා. විශාල මුදලක් රජයෙන් වියදම් කර හරියටම කියනවා නම් ආදර්ශ ෆැක්ටරියක් හැටියට ඒක සකස් කළා. විශේෂ ක්‍රමයකට තේ පැකට් සකස් කර එතැනින් දුන්නා. ඒ ෆැක්ටරියත්, වත්තේ කොටසකුත් පුද්ගලික අංශයට වික්කා. මොනවා කරන්නට යනවාද කියන්නට මම නම් දන්නේ නැහැ. විශේෂයෙන් යම්කිසි ප්‍රමාණයකට පාඩුවට දුවන වතු තිබෙනවා නම් ඒ පිළිබඳව සොයා බලා විශාල ලාභයක් ගන්නට පුළුවන් ක්‍රමයකට විකුණනවා නම් ඒකේ ප්‍රශ්නයක් නැහැ. ඒකට අපට කමක් නැහැ. නමුත් රජයෙන් වියදම් කළ මුදල් ප්‍රමාණය ගැනවත් සලකන්නේ නැතිව මේවා ඉතාම අඩු ගණන්වලටයි දී තිබෙන්නේ. ඒකයි මෙහි තිබෙන වරද. ඒ නිසා මෙහෙම තිබෙන ඉඩම් රජයට ගන්නට පුළුවන් බව මම කියන්නට කැමතියි. ඒවායේ අයිතිය තිබෙන්නේ " ලෑන්ඩ් රිෆෝම් " එකටයි. ඒවා ඒ ප්‍රදේශයේ මහජනතාවගේ ඉඩම්. මේවා කාගෙන්වත් ගෙනා ඒවා නොවෙයි.

දැන් බලන්න, " කැන්ඩියන් පෙසන්ට්‍රි කොමිෂන් " එකෙන් යෝජනා කළා එකම එක දෙයක්වත් ක්‍රියාත්මක වෙන්නේ නැහැ. ඒ උඩරට ගැමි පුනරුත්ථාපන කොමිසමට විශේෂයෙන් මධ්‍යම පළාතත්, ඌව පළාතත් යන පළාත් දෙක අයතියි. දැන් වයඹ පළාතත් අයිතියි. මම හිතන විධියට සබරගමු පළාතත් ඒකට අයත් කරන්නට තීරණය කර තිබෙනවා. එහෙම නම් එහි පරමාර්ථය මොකක්ද ? ඒ කොමිෂන් සභාව පත් කළේ කවුද ? 1951 දීයි, එය පත් කළේ. ඒ කොමිෂන් වාර්තාවේ මෙය හොඳට පැහැදිලි කර තිබෙනවා. ඒ ප්‍රදේශවල ගැමියන්ගේ ඉඩම් ටික අරගත්තා. 1840 දී පමණ ඒක කළේ සමහරවිට අක්කරයකට ශත විසිපහක තරම් මුදලක් ගෙවලයි. සුදු මිනිසුන්ට රු.කියා දෙන්නටත්, ඔවුන්ගේ බලය මෙහි තබා ගැනීමටත් ඔවුන් කළේ මුඩුබිම් පනතක් ගෙනැවිත් 1840 දී මේ ඉඩම් සියල්ලක්ම අඩු මුදලකට ගැනීමයි. ඒවා සියල්ලක්ම ඒ ප්‍රදේශයේ ගැමියන්ගේ ඉඩම්. ඒ අයට ඔප්පු තිබෙනවා, ප්ලෑන් තිබෙනවා. ඒ අය ඒ කාලයේදී කළේ කුඹුරු වැඩ කරන එකයි. කුඹුරු වැඩ ඉවර වුණාට පසුව තමයි, හේනට යන්නේ. හේනට ගිහින්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

හේත් ගොවිතැන් කරනවා. ඊළඟට කුඹුර වපුරන්නට ඕනෑ වන විට නැවතත් අර හේන කැලෑ වෙන්නට අරිනවා. කැලෑ වෙන්නට ඇරියාම ඒක පොහොර වෙනවා. පොහොර සැපයෙන්නෙත් කැලෑවෙන්මයි. ඊළඟට තමයි, කැලෑව කපා, නැවතත් ඒක ශුද්ධ කර වගා කරන්නට උත්සාහ කරන්නේ. නමුත් ඒ සියලුම ඉඩම් මුඩුබිම් පනතට යටත් කර සුද්දන් අරගත්තා. එහෙම නම් ඒ ගත්තා වූ ඉඩම්වල මුල් අයිතිකරුවන් හොයා, ඒ මුල් අයිතිකරුවන්ට — ඒ ගම්බද ජනතාවට — ගැමි කොමිසමේ තිබෙන යෝජනා අනුව, ඒවා නැවත ලබා දීමට බැරි ඇයිද කියන එකයි අපේ ප්‍රශ්නය ?

මම හිතන විධියට ඒ උඩරට ගැමි පුනරුත්ථාපන කොමිෂන් වාර්තාව පිටු දහසක් පමණ තිබෙනවා. මම එය කියවනවිට මගෙනුත් ඉල්ලාගෙන ගිහිත් පසුගිය කාලයේ බදුල්ලේ ගරු මන්ත්‍රී, නියෝජ්‍ය ප්‍රාදේශිය සංවර්ධන ඇමතිතුමාත් එය කියැවූ බව මම සඳහන් කරන්නට කැමතියි. මම හිතන විධියට එතුමාත් කරුණු හුඟක් දැනගෙන ඇති. සමහරවිට එතුමා ඒවා ඉදිරිපත් කරයි. අපි මේකට යම්කිසි වැඩ පිළිවෙළක් ගන්නට ඕනෑ. මේ විධියට කොමිෂන් පත් කරලා ඒවායේ වාර්තා විශ්ව විද්‍යාල පුස්තකාලයක හෝ, වෙනත් 'ලයිබ්‍රරි' එකක තැබූ තරමින් ක්‍රියාත්මක වෙන්නේ නැහැ. ඇත්ත වශයෙන්ම කියනවා නම් 1951 එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුවක් තිබෙන කාලයේදියි මේ කොමිසම පත් කළේ. දැන් අවුරුදු 34 ක් පමණ ගත වී තිබෙනවා. අවුරුදු 34 ක් තුළ උඩරට ගැමි පුනරුත්ථාපන කොමිසමෙන් කෙරුණු වැඩ මොනවාද කියා අපි බලන්නට ඕනෑ. බොහොම සුළු ප්‍රමාණයක් වැඩ කෙරී තිබෙනවා. ඒ කොමිසම ගම් පුළුල් කිරීමට බොහොම හොඳ, ප්‍රශස්ත යෝජනා ඉදිරිපත් කර තිබෙනවා. ඒවා ඉදිරිපත් කර තිබෙන්නේ කිසි කෙනෙකුට රිදවන්නට නොවෙයි. මගේ ආසනයේ තිබුණ ඉඩම්වලින් කොටස් මහවැලියට යට වුණා. හිතුවක්කාර විධියට කැපූ පාරවල්වලට ඉතිරි ඉඩම් ටික යට වුණා. දැන් මගේ කොට්ඨාශයේම හතළිස් පොළක පමණ නායයෑම් සිදුවෙනවා. මම ඊයේ හවස දොන්සයිඩ් එකේ ඒ වගේම රෙවන්ස් ක්‍රේග් එකේ නාය යෑම් බලන්න ගියා. ඒ ස්ථානවලට යන්න බැහැ. මඩ ගොඩවල් උඩින් යන්න ඕනෑ. පාරවල් කැඩිල. යන්න ක්‍රමයක් නැහැ. පයින්ුත් යන්න සිදු වුණා. හතළිස් පොළක පමණ නායයෑම්, ගිලාබැසීම් සිදුවී තිබෙනවා. ගහ බැඳීම උඩත් ඕනෑ නැති විධියට පාරවල් කැපීම නිසාත් මේ තත්ත්වය ඇතිවී තිබෙනවා. මම මේ ගැන ගරු ජනාධිපතිතුමාට කරුණු ඉදිරිපත් කළා. ගරු අගමැතිතුමාට කරුණු ඉදිරිපත් කළා. ගරු ඉඩම් ඇමතිතුමාට කරුණු ඉදිරිපත් කළා. නමුත් ඒ එක්කෙනෙකුගෙන්වත් මෙයට තවමත් පිළියමක් යෙදුනෙ නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කියන්නත් කනගාටුයි, අනේ අපේ වස්තුවලට මොකද වුණේ, කියල මිනිසුන් අඬනවා. තිබුණ ඉඩම් ටික විනාශයි. නමුන්නාන්සේලාට ජේ.ඊ.ඩී.බී. එකෙන් වැඩක් කරන්න හම්බ වෙන්නෙ නැහැ. එස්. පී. සී. එකේ ඉඩම් ඉතුරු වෙන්නෙ නැහැ. ඔක්කොම ගසාගෙන යනවා. අපේ ගරු නියෝජ්‍ය රාජ්‍ය ඇමතිතුමාට අයිති ඉතාමත් හොඳ වටිනා ඉඩමක් තිබුණා. හොඳට වවල තිබුණ එම ඉඩමෙන් අක්කර 15 ක පමණ ප්‍රදේශයක් මේ පාර කැපීම නිසා ගසාගෙන ගිහින් තිබෙනවා. පාරත් සමගම ගසාගෙන ගිහින් තිබෙනවා. එම පාර නැවත හරිගස්සන්න අඩුම ගණනේ කෝටි 10ක්වත් නැතිව බැහැ. පාර තඩත්තු කරන්න නොවෙයි, පාර සටහන් කරන්න පමණක් රුපියල් කෝටි ගණනක් වුවමනා කරනවා. මම ඒ ප්‍රදේශයට ගිහින් බැලුවා. ඒ තරම් විශාල මුදලක් නැතිව එය හදන්න බැහැ. විශාල ප්‍රදේශයක් ගසාගෙන යනවා. මට දැන් යන්න විධියක් නැහැ. පාරක් නැහැ. නාය යන ප්‍රදේශවල සිටි පවුල් දෙකක් අපි රෙවන්ස්ක්‍රේග් එකේ පදිංචි කෙරෙව්වා. ඒ. ජී. ඒ. මහත්මයාගෙන් ලැබුණ නියෝගයක් පිට හදිසියේම ඒ අය පදිංචි කෙරෙව්වා. ලයින් කාමරයක් දෙකක් අරගෙන පෙරෙයිද ඒ අය පදිංචි කෙරෙව්වා. ඒ නායගිය පළාත්වල පාරවල් සියල්ලම ගසාගෙන යනවා. ඊළඟට ගෙවල් දොරවල් ආදිය කඩාගෙන යනවා. අඩි තුන හතර තරම් පළලට ඉරී යන තරමට දෙදරුම් කෑ තැන් තිබෙනවා. ඒ විධියට දෙදරුම් කැව තැන් හැම තැනම වාගේ තිබෙනවා. මේ සම්බන්ධයෙන් වහාම පියවරක් නොගත්තොත් මුළු ප්‍රදේශයම නාස්ති වීගෙන යනවා. මම විශේෂයෙන්ම වතු අධිකාරිවරුන්ට කියන්න කැමතියි, වතු මගින් හෝ මේ සම්බන්ධයෙන් යම්කිසි වැඩපිළිවෙලක් යෙදිය යුතුය කියා. එහෙම නොකළොත් ඒ ප්‍රදේශයේ තේ වතු ඉතිරි වේවිය කියා මම හිතන්නේ නැහැ. ඒ ප්‍රදේශයේ තේ වතු ඉතිරි වෙන්නෙ නැහැ. හරන්ගල්ල වත්ත නාය යනවා නම්, තිස්පනේ වත්තෙන් කොටසක් නාය යනවා නම් මොකද වෙන්නෙ ? ඒවා ජේ. ඊ. ඩී. බී. එකට අයිතිද, එස්. පී. සී. එකට අයිතිද කියා මම දන්නෙ නැහැ. ඒ වගේම රම්බොඩ වත්තෙ කොටසක් නාය යනවා. රම්බොඩ පාස් එක ළඟ මේ මෑතදී කඩාගෙන ගිහින් තිබෙනවා. මම හිතන විධියට අපේ විරුද්ධ පක්ෂයේ නායකතුමාත් දන්නවා, රම්බොඩ පාරේ කවදාවත් ගිලා බැහැපු නැති ස්ථානයක මෙවර දම්වැල් තුන හතරක් ගිලා බැහැලා තිබෙනවා. ඒත් වතු ආශ්‍රිත ප්‍රදේශමයි. වතු ආශ්‍රිත ප්‍රදේශ සම්පූර්ණයෙන්ම කඩාගෙන යනවා. එහෙම නම් මේවාට යම්කිසි වැඩපිළිවෙළක් යොදන්න ඕනෑ. දැන් නමුන්නාන්සේ මූලධනයත් වැඩි කර ගන්නවා නම් අපට මීට වැඩියෙන් වැඩ කොටසක් කරගන්න පුළුවන් වේවිය කියා මා සිතනවා.

ඒ වගේම මම තේ සම්බන්ධයෙන් යම් දෙයක් කියන්න කැමතියි. තේ නිෂ්පාදනය සම්බන්ධයෙන් එස්. පී. සී. එකෙන් යම්කිසි පියවරක් අරගෙන තිබෙනවා. තේ පැකැට් කර පාරිභෝගිකයන්ට හොඳ තේ පැකැට් ලබා දීමේ වැඩපිළිවෙළක් ආරම්භ කර තිබෙනවා. අපි ඒ සම්බන්ධයෙන් උපදේශක කාරක සභාවේදී සාකච්ඡා කළා. මම ඒ වැඩපිළිවෙලට කැමතියි. මොකද රොඩු තේ, 'රබිෂ්' තේ 'ස්වීපිංස්' කියල අරගත්තා තේ මාර්කට් එකට පැමිණි විට සමහර විට යම් කෙනෙක් ඒවා අරගෙන මිළ වැඩිවෙන තෙක් 'ස්ටොක්' කර තියා ගන්නවා. ගණන් වැඩි වෙන විට වෙළඳ පොළට දමනවා. සමහර විට මේ විධියට එකම තේ තොගය කීප වතාවක් විකුණන අවස්ථා තිබෙනවා. ඒ බවට සාක්ෂි තිබෙනවා. එකම තේ තොගය කීප වතාවක් විකුණනවා. ඒ නිසා සමහර විට හිතනවා තේ නිෂ්පාදනය වැඩිය කියා. නමුත් නිෂ්පාදනයේ වැඩිවීමක් නැහැ. මේ කරුණු ගැන හරියට සොයා බලනවා නම් තේ නිෂ්පාදනය වැඩිවී තිබෙන්නේ ඉතාම සුළු ප්‍රමායකින් බව පෙනී යනවා ඇති.

තේ නිෂ්පාදනය විශාල වශයෙන් වැඩි වුණේ කොහොමද ? මා සඳහන් කළ විධියට රොඩු තේ ආදිය ගේනවා. ඒවාට නොයෙක් මිශ්‍රණ යොදනවා. සමහර වෙලාවට ඒවා කළු කරන්න හුණු දනවා. සමහර විට ෆැක්ටරිවල දිරා ගිය ඒවා ගෙනත් සකස් කරනවා. ඒවා තමයි අපේ තේ ඔක්ෂන් එකට ගෙනත් දමන්නේ. එහෙම දැපුවාම මොකද වෙන්නේ ? අපේ හොඳ තේවලට ඒවා මිශ්‍ර වුණාට පසු අපේ තේවල මිළ ඉදිරිපත් කළාම අපේ තේවල රස අඩුයි. ගුණ අඩුයි, සුවඳ අඩුයි යන කරුණු උඩ ඔක්ෂන් එකේදී කවුරුවත් අපේ තේ ඉල්ලන්නේ නැහැ.

මේ නිසා අපේ තේ විධිමත්ව සකස් කරන්න ඕනෑ. අද මේ රටේ පාරිභෝගිකයන් බොන තරමක් බොන්නේ ඒ රොඩු තේ. මම හිතන හැටියට අපේ කඩවල වැඩියෙන් තිබෙන්නේ ස්වීපිං කියා විසි කරන ඒවායින් සකස් කර ගත් තේ. [බාධාකිරීමක්] වංගෙඩි පැකෝ වාගේ ජාති තමයි. ඒවා ටිකක් අඩු මිලට දෙන්න පුළුවන්. ඉස්ටෝරුවලින් ගන්නේත් බොහොම සුළු ගණනටයි. ඒවා අරගෙන මම කලින් කිව්වා වාගේ හුණු වාගේ දේවල් දමා ජනතාවගේ සෞඛ්‍ය තත්ත්වයට හානිකර විධියට සකස් කරලා වෙළඳ පොළට එවනවා. ඒවා තමයි අපේ ගම්බද කඩවලට ගන්නේ. ගම්බද මිනිසුන් ගන්නේ ඒවායි. ලංකාවේ හෝටල්වලට වැඩි ප්‍රමාණයක් ගන්නේත් ඒ තරක රොඩු තේ.

අපි තේ නිෂ්පාදනය කරනවා නම් අපේ ජනතාවට හොඳ තේ එකක් හද ගෙන බිම සඳහා හොඳ තේ කුඩු ටිකක් දෙන්නට අපට බැරි ඇයි ? ඒක කරන්න ඕනෑ. එතකොට අපට වාසියක් වෙනවා. කසල තේ පැත්තකට දන්න පුළුවන්. හොඳ තේවලට ප්‍රචාරයක් දෙන්න ඕනෑ. එස්. පී. සී. එක ජේ. ඊ. ඩී. බී. එක ඒවාගේම එල්. ඊ. ඩී. බී. හා ලෑන්ඩ් රිෆෝම් ආදී කොටස් කීපයක් ප්ලාන්ටේෂන් මිනිස්ට්‍රි එකට තියෙනවා. ඒ හැම එකක්ම එකතු වෙලා කරන්න තියෙන්නේ රටේ ප්‍රයෝජනයට ගන්න තේ ප්‍රමාණය වැඩි කිරීමයි. රටේ ප්‍රයෝජනයට ගන්න තේ ප්‍රමාණය වැඩි වෙන කොට විකිණෙන හොඳ තේ ප්‍රමාණය වැඩි වේයයි මම හිතනවා. හොඳ තේ තිබෙන විට ඒවා සඳහා ගැණුම්කරුවන් පිටරට වලින් ඇදී එයි. කරන්න තියෙන්නේ හොඳ ක්‍රමයකට සකස් කිරීමයි.

අපිට තේ කිලෝ එකක් ලැබෙන්නේ රුපියල් තිහක පමණ මිලට. ඒ ලැබෙන මිල රුපියල් තිස් පහක්ය කියා අපි හිතමු. පැකට් කිරීමේ වියදමටත් සකස් කිරීම් ආදියටත් පොඩි කොටසක් තියා කිලෝ එකක මිල රුපියල් හතළිහකට තිබ්බොත් කිසිම කෙනෙක් ඒ පැකට් එකක් ගන්න අකමැති වෙයි කියා මම හිතන්නේ නැහැ. ඒවායින් සමහර විට කාලේ පැකට් හදන්න පුළුවනි. බාගයේ පැකට් හදන්න පුළුවනි. කිලෝ එකේ පැකට් හදන්න පුළුවනි. ඒ විධියට කළොත් ඒවා ලංකාවේ හැම පුද්ගලයා අතටම යවන්න පුළුවන් වෙනවා. ජේ. ඊ. ඩී. බී. එකටත් එස්. පී. සී. එකටත් මෙය කරන්න පුළුවනි. එස්. පී. සී. එක දැන් ඒ පියවර අරගෙන තිබෙනවා. අපි ඒ ගැන සාකච්ඡා කර තිබෙනවා. මම ඒකට කැමතියි. ඒක හොඳ යෝජනාවක්. ඒවාගේම ප්‍රයෝජනවත් යෝජනාවක්. රටේ තේ වල මිල බැස්ම අඩුකිරීමට තිබෙන හොඳ යෝජනාවක් ඒක. දැන් එය එස්. පී. සී. එකෙන් ක්‍රියාත්මක වෙනවා. ජේ. ඊ. ඩී. බී. එක මගිනුත් මේ ක්‍රමය යොදන්න ඇමතිතුමාට පුළුවන් බව මම

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ආනන්ද දසනායක මහතා]

කියනවා. [බාධාකිරීමක්] ඒකේ තවම නැහැ. අපි කතා වුණේ සමුපකාර සමිති මගින් කරන්නයි. සමුපකාර සමිති මගින් පමණක් නොව මාකට්ං ඩිපාට්මන්ට් එකෙනුත් කරන්න පුළුවනි. ඒ ගොල්ලන්ට යම්කිසි කොමිස් එකක් දීලා. බොහෝම ලේසියෙන් කරන්න පුළුවන්. මාකට්ං ඩිපාට්මන්ට් එකට දූන් වෙළඳමට දේවල් නැතිව ඉන්නවා. ඒ අයගේ ස්ටෝල්ස් වහගෙන යනවා. ඒ නිසා ඒ ස්ථානවලට මේ තේ සෑහෙන ප්‍රමාණයක් හොඳට පැකට් කර දෙන්න පුළුවනි. එතකොට අපේ ජනතාවට ක්ෂය රෝගය ආදී රෝග බෝවීම අඩු වෙනවා. සෞඛ්‍ය තත්තවයෙන් බලන විට එය අවශ්‍යයි.

අනෙක් ප්‍රශ්නය මේකයි. අපට හුඟාක් විදේශ ආධාර ලැබෙනවා. නොරාඩ් එකෙන් කොටසක් ලැබෙනවාය කිව්වා. ඒවාගේම ලෝක බැංකුව ආදී තවත් ආයතන ගණනාවකින් ආධාර ලැබෙනවාලු. අයි.ආර්.ඩී.බී එකෙනුත් තේ වැවීම, තේ නිෂ්පාදනය, තේ දළු එකතු කිරීම ආදී දේවලට උදවු දෙනවා. ඒ හැම උදව්වක්ම ලැබෙනොත් මූලික දේ වශයෙන් තිබෙන්නේ මෙයයි. අමාත්‍යාංශයට එස්.පී.සී. අයිතියි. ජේ.ඊ.ඩී.බී. එකේ යම් යම් කොටසුත් අයිතියි. මේ දෙක පමණක් නඩත්තු කිරීම නොවෙයි, අවශ්‍ය වෙන්නේ. නමුත්නාත්සේලාගේ වැයම විය යුත්තේ ' ප්ලාන්ටේෂන් මිනිස්ට්‍රි ' එක යටතේ තිබෙන සුළු තේ වතු සුළු රබර් වතු, සුළු පොල් වතු ආරක්ෂා කිරීමයි. අපේ රටේ, අපේ ආර්ථිකයේ ජීවනාලිය එතැනයි තිබෙන්නේ. ඒ කියන්නේ ස්වාධීනව යම්කිසි විධියකින් තේ, රබර්, පොල් අක්කර 10 ක් 15 ක් 20 ක් 25 ක් වවාගෙන එයින් ජීවත්වන පිරිසට යම්කිසි සහනයක් සලසන්නට ඕනෑ. මේ වැවිලි කර්මාන්ත ආයතන දෙක මගින්. ඒවාට දෙන ආධාර අඩු කර හෝ මේ සුළු තේ වතුවලට දෙන ආධාර වැඩි කරන්නට ඕනෑ. තේ මිල ගැරැන්ටි ප්‍රයිස් එකකට, මිනිමම් ප්‍රයිස් එකකට තියා ගන්න වෙනවා. නැත්නම් අපහසු තත්ත්වයක් ඇති වෙනවා. අපි ඔක්කොටම මේ ප්‍රශ්නය ගැන කථා කරන්න වෙනවා. අද තේ මිල හොඳටම බැහැලයි තියෙන්නේ. මම හැමදම විරුද්ධ වන දෙයක් තමයි, බදු රාශියක් පැනවීම. ' සෙස් ' එක ගැන නම් මගේ විරුද්ධත්වයක් නැහැ. ඒක අවශ්‍යයි. තේ වතු සංවර්ධනය සඳහා එය අවශ්‍යයි. ' ටී සෙස් ' බද්ද අවශ්‍යයි. ඒක තියෙන්නට ඕනෑ. ඒක තව පොඩි කොටසක් වැඩි කළත් කමක් නැහැ. පසුගිය කාලයේත් වැඩි කළා. එසේ කළාට එච්චර හානියක් නැහැ. ඒකෙන් යම්කිසි ආධාරයක් දෙනවා, තේ නිෂ්පාදනය කරන පුද්ගලයාට. පොහොර ගැනීමට ආධාර දෙනවා. පස් සේදී යාම වළක්වන්නට ආධාර දෙනවා. නැවත පැළ සිටුවීමට ආධාර දෙනවා. පාලු සිටුවීමට ආධාර දෙනවා. ඔය විධියේ යෝජනා අපි සකස් කර තිබෙනවා. ' ටී සෙස් ' එක තවත් ප්‍රමාණයකින් වැඩි කළත් ඒතරම් හානියක් වන්නේ නැහැ. ඒ මුදලින් පුළුවන් සුළු තේ වතු හිමියන්ට උදව් කරන්න.

ඊළඟට මේ 'ඇඩ්වලෝරම් ටැක්ස්' එක. විකිණෙන මිළ ප්‍රමාණය අනුව, අපිට දූන් දී තිබෙන්නේ රු. 32 යි. පසුගිය කාලයේ සමහර අවස්ථාවල තේ කිලෝවක් රු. 110 ටත් නැග්ගා. 'ඔක්ෂන්' එකේදී සමහරවිට අවම මිළ රු. 75 හෝ 85 පමණ ගණනක් වුණා. 'ඇවරේජ්' එක ඒහෙම යි. අපට ලැබුණේ රු. 32 යි. සුළු තේ වතුවලටත් එහෙමයි. 'ජේ. ඊ. ඩී. බී.' එකටත් රු. 32 යි 'එස්. පී. සී.' එකටත් රු. 32 යි. එහෙත් තේ කිලෝවක් නිෂ්පාදනය සඳහා රු. 39 ක් යනවා. එසේනම් රු. 32 ක් සුළු තේ වතු හිමියන්ට දුන්නාම ඒ පුද්ගලයාගේ වත්ත දියුණු කරන්නේ කොහොමද ? ඔහුට ආදයම අඩුවන විට ඔහු කරන්නේ කුමක්ද ? ඔහුට ණය වන්නට ක්‍රමයක් නැහැ. ඔහුට ණය දෙන ආයතනයක් නැහැ. ඔහුට ණය ගන්නට පුළුවන් කමක් නැහැ. මන්ද, ඒ සඳහා සහතික කරන්නට ඇප කරුවන් ඕනෑ. ඇප කරුවන් සොයා ගැනීම අමාරු ප්‍රශ්නයක්. අක්කර කාලක් බාගයක් හෝ අක්කරයක් දෙකක් තිබෙන එක්කෙනාට එය කර ගන්නට වෙන්නේ නැහැ. අක්කර 10, 15, 20, 30 තිබෙන අයට නම් පුළුවන්.

සුළු තේ වතු හිමියන් තමයි, මේ රටේ ජීවනාලිය හැටියට අපි සලකන්නට ඕනෑ. සුළු රබර් වතු හිමියා තමයි, සුළු පොල් වතු හිමියා තමයි මේ රටේ ජීවනාලිය. ඒ අයට ලැබිය යුතු වරප්‍රසාද අඩු වෙනවා. එමනිසා අලුතෙන් වගා කිරීම සඳහා දෙන සබ්සිඩි එක — ආධාරය — දෙන ලෙස මම ඉල්ලා සිටිනවා. 'ජේ.ඊ. ඩී. බී.' එකේ, 'එස්. පී. සී.' එකේ ආචාර්ය මහත්වරු නමුත්නාත්සේලාගේ වාර්තාවෙන්ම කිව්වා, හෙක්ටයාර් එකක් වවන්න රුපියල් එක් ලක්ෂ හතළිස් හත්දහක් පමණ 1982, 1983 වර්ෂවලදී ගිය බව. අද ඊටත් වඩා ද්‍රව්‍ය මිළ වැඩිවී තිබෙනවා. ජීවන වියදම වැඩි වී තිබෙනවා. සේවකයන්ට පඩි වැඩියෙන් දෙන්න සිදු වී තිබෙනවා. ඔය විධියට තිබෙන නිසා මම හිතන්නේ නැහැ, එක් ලක්ෂ පණස් දහට අඩුවෙන් හෙක්ටයාර් එකක් වවන්නට පුළුවන්ය කියා. ඔය කියන ක්‍රමයට වවන්න බැහැ. නමුත්නාත්සේලා කීයද දෙන්නේ ? රුපියල් හතළිස් නව දහක් පමණයි. රුපියල් 49,000 ක් දීලා කියනවා, අක්කරයක් වවන්න කියා. එවිට ඒ කාලය තුළ — තිබෙන තේ උදුරා නැවත වගා කරන කාලය තුළ — ඒ අක්කරයෙන් ලැබෙන්න තිබෙන ආදයම අවුරුදු හතකට ලැබෙන්නේ නැහැ.

හැරල්ඩ් හේරත් මහතා
(திரு. ஹரல்ட் ஹேரத்)
(Mr. Harold Herath)

We are not paying the subsidies. That is done by the Plantations Ministry.

ආනන්ද දසනායක මහතා
(திரு. ஆனந்த தஸநாயக்க)
(Mr. Ananda Dassanayake)

That is true but we have to talk even with regard to the Plantations Ministry.

හැරල්ඩ් හේරත් මහතා
(திரு. ஹரல்ட் ஹேரத்)
(Mr. Harold Herath)

You can talk. We are prepared to listen.

ආනන්ද දසනායක මහතා
(திரு. ஆனந்த தஸநாயக்க)
(Mr. Ananda Dassanayake)

I am not prepared to divide and rule. You can have your divisions. This is the tea industry. We are discussing the tea industry.

හැරල්ඩ් හේරත් මහතා
(திரு. ஹரல்ட் ஹேரத்)
(Mr. Harold Herath)

We are only a management agency. We are only managing.

ලක්ෂ්මන් ජයකොඩි මහතා
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)
(Mr. Lakshman Jayakody)

No, no.

හැරල්ඩ් හේරත් මහතා
(திரு. ஹரல்ட் ஹேரத்)
(Mr. Harold Herath)

Why do you say no ?

ලක්ෂ්මන් ජයකොඩි මහතා
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)
(Mr. Lakshman Jayakody)

You are the owners.

ආනන්ද දසනායක මහතා
(திரு. ஆனந்த தஸநாயக்க)
(Mr. Ananda Dassanayake)

That is correct. For your convenience you have divided the Ministry of Plantations into a number of ministries. We are not worried.

හැරල්ඩ් හේරත් මහතා
(திரு. ஹரல்ட் ஹேரத்)
(Mr. Harold Herath)

I will answer you only from my side.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ආනන්ද දසනායක මහතා
(திரு. ஆனந்த தஸநாயக்க)
(Mr. Ananda Dassanayake)

That is left to you but the Government must also reply.

මන්ත්‍රීවරයෙක්
(அங்கத்தவர் ஒருவர்)
(A Member)

පොල් කටුවලට ගිහින්.

ආනන්ද දසනායක මහතා
(திரு. ஆனந்த தஸநாயக்க)
(Mr. Ananda Dassanayake)

පොල් කටුවලට ගිහින් තමයි දූන් තියෙන්නේ. පොල් කටු කරේ බැදගෙන යන්න තියෙන්නේ.

හැරල්ඩ් හේරත් මහතා
(திரு. ஹரல்ட் ஹேரத்)
(Mr. Harold Herath)

පොල් කටුව තමුන්නාන්සේගේ ඔළුව උඩයි තිබෙන්නේ.

ආනන්ද දසනායක මහතා
(திரு. ஆனந்த தஸநாயக்க)
(Mr. Ananda Dassanayake)

මගේ ඔළුව උඩ තියෙන්නේ. තමුන්නාන්සේගේ බෙල්ලේ දල තියෙන්නේ.

අපි කියන කොටසට පමණක් තමුන්නාන්සේ උත්තර දෙන්න. අපට අවශ්‍ය නැහැ බෙදීම් ගැන. මේවා අමාත්‍යාංශවලට බෙදලා බෙදලා එහි සීමා කොහේද තිබෙන්නේ කියා කියන්න අපි දන්නේ නැහැ. මෙය ප්ලාන්ටේෂන් ඉන්ඩස්ට්‍රි එක. මේවා වැවිලි කර්මාන්තයට අයිති කොටස්. අපට බලන්න වෙනවා මේ කොටස් කාටද අයිති කියා. ඒ තරම් අමාරු තත්ත්වයකට අද මේවා බෙද දී තිබෙනවා. ඒ අනුව අපට ජේත අහන්න වෙනවා මේ වතු කාටද අයිති කියා සොයා ගන්න. මේ වත්ත ජේ. ඊ. ඩී. බී. එකට අයිතිද, මේ වත්ත එස්. පී. සී. එකට අයිතිද, මේ වත්ත ප්ලාන්ටේෂන් ඉන්ඩස්ට්‍රි එකට අයිතිද, මේ වත්ත එල්. ආර්. සී. එකට අයිතිද කියා බලන්න අපට ජේත අහන්න වෙනවා.

මා විශේෂයෙන්ම කියන්න කැමතියි ඇඩ්වලෝරම් ටැක්ස් එක අඩු කිරීම ගැන. නියෝජ්‍ය වැවිලි කර්මාන්ත ඇමතිතුමා පොරොන්දු වුණා එය අඩු කිරීම සඳහා කැබිනට් සංදේශයක් යවනවාය කියා. එය යැව්වාද නැද්ද කියා කියන්න මා දන්නේ නැහැ. එතුමා තවම ආවේ නැහැ. එතුමා අසනීපයෙන් ඉන්නේ. මා හිතනවා නියෝජ්‍ය ජනතා වතු සංවර්ධන ඇමතිතුමාත් මේ සම්බන්ධයෙන් පියවරක් ගනියි කියා. සුළු තේවතු, රබර් වතු, පොල් වතු ආදී සුළු වතු හිමියන්ගේ බාධක ඉවත් කිරීමට පියවර ගනියි කියා මා බලාපොරොත්තු වෙනවා. මේ බාධක ඉවත් කිරීම සඳහා මා කියූ විධියට, නිෂ්පාදනය වැඩිවීමේදී නිෂ්පාදන වියදම අඩු කරන්න ක්‍රම යොදන්න පුළුවන්. එසේ නොකර, ඒ අයගේ ආදායම බදු මාර්ගයෙන් ලබාගෙන, එය භාණ්ඩාගාරයට යවලා නැවත වරක් ' සබ්සිඩි ' වශයෙන් එය දෙනවා. අද දෙන ' සබ්සිඩි ' එකෙන් සමහරවිට අක්කර කාලකුත් වවන්න බැහැ. මේ ' සබ්සිඩි ' එක වැඩි කර තිබෙනවා. ඒ ගැන මා ස්තුතිවන්ත වෙනවා. නමුත් වියදම ගැන බැලුවාම ඒ වියදමට සරිලන විධියට නොවෙයි එය වැඩි කර තිබෙන්නේ. ඒ ලැබෙන මුදලින් අක්කර බාගයක්වත් වවන්න බැහැ. එම මුදල් ප්‍රමාණයට ජේ. ඊ. ඩී. බී. එකට වවන්න බැරි නම්, එස්. පී. සී. එකට වවන්න බැරි නම් ඒ අය මෙපමණ ප්‍රමාණයක් වෙනවාය කියා කියනවා නම්, එම මුදලට සුළු තේ වතු හිමියෙක්, සුළු රබර් වතු හිමියෙක්, සුළු පොල්වතු හිමියෙක් කොහොමද වවන්නේ ? ඒ දෙන මුදල අනුව ඒ අයට වවන්න බැහැ. මෙහි ආදායමෙන් ලැබූ මුදල් වෙනත් ආයතනවල තැන්පත් කර තිබෙනවාද කියා අපේ අත්තනගල්ල ගරු මන්ත්‍රීතුමා (ලක්ෂ්මන් ජයකොඩි මහතා) ප්‍රශ්නයක් ඇහුවා. එහෙම තැන්පත් කර තිබෙනවා නම්, මේ ' සබ්සිඩි ' එක තව ටිකක් වැඩි කරන්නේ නැත්තේ ඇයි ? අද සමහර සුළු තේවතු හිමියන් ' සබ්සිඩි ' එක ගන්නට බිය වන්නේ ඇයි ? ' සබ්සිඩි එක ' ගත්තොත් වගාව සම්පූර්ණයෙන්ම ගලවා දමන්නට වෙනවා. එවිට අවුරුදු හතකට ඔහුට ලැබෙන ආදායම නැතිවී යනවා. ඒ නිසා ඔහුට කිසිවක් කරගන්නට බැරි වෙනවා. මේ ගැන අපි කථා කර තිබෙනවා. ඒ නිසා මේ ක්‍රමය වෙනස් කිරීමට තමුන්නාන්සේලාත් කැමතියි. එසේ තිබියදී මෙය වෙනස් නොකරන්නේ ඇයි කියන එකයි ප්‍රශ්නය.

වැවිලි කර්මාන්ත ඇමතිතුමාත් මේ තත්ත්වය ගැන හොඳට දන්නවා. හැම කෙනෙකුටම මේ සම්බන්ධයෙන් හැඟීමක් තිබෙනවා. එසේ නම් මේ සබ්සිඩි එක එක්කෝ වැඩි කරන්න ඕනෑ, නැත්නම් රජයේ පාලනය යටතේ සම්පූර්ණ ගෙවීමක් කරන්න ඕනෑ. ජේඊඩීබී එකේ උපදේශකයින් යොද එහි පාලනය යටතේ අක්කරය හමාර අක්කර දෙක තුන වශයෙන් ඇති අයට ඒවා සම්පූර්ණයෙන් වවා දෙනවා නම් ඊට වඩා වැදගත් නැද්ද ? මේ ක්‍රමය යටතේ මිනිස්සු අතරමං වෙනවා. සමහර අයට කර ගන්නට බැරිව වගාව උදුරා අවුරුදු 3 ක් 4 ක් නිකම් සිටිනවා. ගෝනමාලා වගා කරන්නට මුදල් නැතිව බලා සිටිනවා. රජයෙන් දෙන මුදල ලබා ගන්නට පරණ වගාව උදුරනවා. එසේ කර පළමු වැනි පියවරට දෙන මුදල ගත්තාට පසුව දෙවැනි පියවරට දෙන මුදල ගන්නට නොහැකිව සිටිනවා. තුන්වැනි පියවර වශයෙන් ගෝනමාලා කපා සුද්ධ කරන්නට බැරිව එහෙමම සිටිනවා. 4 වැනි පියවර වශයෙන් ඉඩම සුද්ධ කර කානු කපා බිම සකස් කරන්නට මුදල් නැතිව බලා සිටිනවා. ඒ ඒ වැඩ කොටස් ඉටු කළාට පසුවයි, මුදල් ලැබෙන්නේ. සමහර අවස්ථාවල වැඩ කොටස කළත් ඉක්මණින් මුදල් ලැබෙන්නේ නැහැ. එහෙත් ඒ වැඩවල නිරතවූ කම්කරුවන් එදිනෙද ජීවත් වන්නට මුදල් ඕනෑ කියමින් පස්සෙන් එනවා. එවිට ඔවුන්ට මුදල් ගෙවන්නට සිදු වෙනවා. එසේ ගෙවූ මුදල ලබා ගන්නත් මාස කීපයක් ගත වෙනවා. රජයේ රෙගුලාසි අනුව ඒ ගැන කරන්නට කිසිවක් නැහැ. ඒ නිසා ඒ ක්‍රමය වෙනස් කරන්නට ඕනෑ.

ජේඊඩීබී එකට නම් රුපියල් ලක්ෂ ගණනක් වුණත් යොදවා ඒ කටයුත්ත කරන්නට පුළුවන්. එහෙත් සාමාන්‍ය පුද්ගලයෙකුට රුපියල් හාර පන් දහසක් යොදවනවාය කියන එකත් ලොකු දෙයක්. මේ ගැන අපි කල්පනා කරන්නට ඕනෑ. උඩරට ගැමි කොමිසමේ පරමාර්ථයත් ඒකයි. පුංචි පුංචි වතු දියුණු කළේ නැත්නම් කවදවත් රට හදන්නට බැහැ. රට හැදෙන්න නම් ගම හදන්නට ඕනෑ යයි අපේ අගමැතිතුමා හැමදම කියනවා. අපි එය පිළිගන්නවා. එහෙම නොකළොත් ගම හැදෙන්නේ නැහැ. එතුමා කරන්නේ එතුමාගේ අංශයේ වැඩ කටයුතු ටික ඉටු කිරීමයි. [බාධා කිරීමක්] ගෙවල් හද දෙනවා. එය සංවර්ධනයක් යයි අපි හිතමු. ඒ අතරම මිනිසුන්ගේ පොකැට්ටුවත් තර වෙන්නට ඕනෑ. ගෙවල් හදීම උඩම ඒ ප්‍රශ්නය විසඳෙන්නේ නැහැ. ඔවුන්ගේ පොකැට්ටුව තර වෙන්නට ඕනෑ නම්, ඔවුන්ගේ ආදායම වැඩි වෙන්නට ඕනෑ නම්, ඔවුන්ගේ බැංකු ගිණුම් ටිකෙන් ටික තගා සිටුවන්නට නම්, ඔවුන්ට පහසුවෙන් ජීවත්වීමට අවශ්‍ය ද්‍රව්‍ය ටික ලබා ගන්නට පුළුවන් තත්ත්වයකට පත් කිරීමට නම්, අපි කළ යුත්තේ අර ගම්බද පුංචි කොටස් දියුණු කරන්නට ක්‍රම යෙදීමයි. අන්න එසේ දියුණු කිරීම පිණිස දූන් මේ කරන සබ්සිඩි දීමේ ක්‍රමය ඉවත් කරන්නට ඕනෑ. මේ ආයතන දෙකටම හොඳට මුදල් තිබෙනවා නම්, තෝරාඩ් එකේ මුදල් තිබෙනවා නම්, අයිආර්ඩීබී එකට මුදල් ලැබී තිබෙනවා නම් අපි කරන්නට ඕනෑ මොකක්ද ?

පසුගිය සිකුරාද අපි වතු සම්බන්ධයෙන් කථා කළා. එද කථා කළේ වතුවල සෞඛ්‍ය දියුණු කිරීම, ජලනල අලුතින් ලබා දීම, " රෙක්‍රියේෂන් ක්ලබ් " ආදිය ඇති කර සේවකයින්ට විනෝද පහසුකම් ලබාදීම, තැන් තැන්වල අලුතින් සෞඛ්‍ය මධ්‍යස්ථාන පිහිටුවීම, තව තවත් ඩිස්පෙන්සරි පිහිටුවීම, මාතෘ නිවාස පිහිටුවීම, ළමා නිවාස පිහිටුවීම ආදිය ගැනයි. ඒ සඳහා කෝටි 19 ක් පමණ දීලා තිබෙනවා. එය වහාම ක්‍රියාත්මක කර මේ අවුරුද්ද සඳහා තිබෙන මුදල වහාම යොදවන්නට අපි සාකච්ඡා කළා. මමත් ඒ සාකච්ඡාවට ගියා. එවිට ජේඊඩීබී එකටත් එස්පීසී එකටත් වැඩ ගොඩක් අඩුවන බව අපට පෙනෙනවා. එහෙම නම් එස්පීසී එකත් ජේඊඩීබී එකත් වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය සමඟ සාකච්ඡා කර යම් වැඩපිළිවෙළක් ඇති කරන්නට ඕනෑ. මෙහි මුදල් තිබෙනවා. ඒ මුදල් බැංකුවල යෙදීම හෝ පෞද්ගලික හෝ පොදු වෙනත් ආයතනයක තැන්පත් කිරීම අවශ්‍ය නැහැ. එම මුදල්වලින් ප්‍රයෝජන ගන්න. එයින් අපේ ගම්බද දියුණු කරන්න. ගම්බද අයට අත දෙන්න අපේ මේ ඇමතිතුමාටත් ඕනෑ කරනවා. අපටත් ඕනෑ කරනවා. ඇමතිතුමා ගමේ කෙනෙක්. මමත් ගමේ කෙනෙක්. මෙතන ඉන්න මන්ත්‍රීතුමන්ලාගෙන් වැඩි දෙනෙක් ගම්බද අය. නගරබද අය දෙතුන් දෙනෙකුට වැඩිය නැහැ. කෙසේ වුණත් අපට ඕනෑ කරන්නේ මොකක්ද ? ගමේ හැම දෙයකටම මේ " සබ්සිඩි " ක්‍රමය ක්‍රියාත්මක වෙනවා. මුළු වියදමින් සියයට විසි පහකින් පමණ ආධාර දී සියයට හැත්තෑ පහක ඉතිරි ප්‍රමාණය—විශාල ප්‍රමාණයක්—කරන්නටය කියා කියනවා. ඉතින් සියයට විසි පහකින් පමණ ආධාර දී ඉතිරි සම්පූර්ණ වැඩ කොටස කර ගෙන යන්නේ කොහොමද ? මේ නිසා කළ වැඩ කොටසත් අතරමග නතර වෙනවා. සමහර අයට ගෙවල් හදන්නට ආධාර දෙනවා. ඉතින් ගේ හද ගෙන යනවා. උළුවහු ආදිය තබනවා. නමුත් ඉන් එහාට වැඩ කර ගෙන යන්නට ඒ අයට ශක්තියක්,

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ආනන්ද දසනායක මහතා]

පුළුවන්කමක් නැහැ. මේ නිසා රජයෙන් ලැබුණු " සබ්සිඩි " එකත් ඉවරයි. ගත්ත ණය ආපසු ගෙවා ගන්නටත් බැහැ. මේ නිසා අවසානයේදී ඔහු අතරමං වෙනවා. ඔන්න ඔය විධියේ තත්ත්වයකයි මේ වැවිලි කර්මාන්තයත් ගම්බද ප්‍රදේශවල පවතින්නේ. විශේෂයෙන් සුළු තේ වතු හිමියන්, සුළු රබර් වතු හිමියන්, සුළු පොල් වතු හිමියන් මේ තත්ත්වයට මුහුණ දී සිටිනවා. එම නිසා මෙන්න මේ ගැටළු ලිහන්නට ක්‍රියා කරන ලෙස මා විශේෂයෙන්ම ඉල්ලා සිටිනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ ඇමතිතුමා මා බොහොම ප්‍රිය කරන ඇමතිවරයෙක්. එතුමා මේ කටයුතු ගැන බොහොම උනන්දුවක් දක්වනවා. එම නිසා අඩුපාඩුකම් ගැන සඳහන් කළාට, ඒ අපේ ඇමතිතුමාට විරුද්ධව කියන දේවල් නොවෙයි. විශේෂයෙන්ම එතුමාගේ අවධානය මා යොමු කරවන්නේ අපේ රටේ සංවර්ධන කටයුතු ගම්බදට බරව කර ගෙන යාමේ වැදගත්කම ගැනයි. එමගින් අපේ ගම්බද මිනිසුන්ගේ සාක්කුවලට වැඩි වැඩියෙන් මුදල් ගලා එන්නට ඒ වැඩ ටිකත් තමුන්නාන්සේ කළොත්, තමුන්නාන්සේගේ කාලය තුළදී ගම්බද ජනතාවට යම්කිසි සේවාවක් කළාය කියා තමුන්නාන්සේගේ නම ඉතිහාස ගත වනවා ඇති.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(Mr. Deputy Speaker)

Order, please. The sitting is suspended till 2 p.m.

රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත්සිටුවන ලදින්, අ. භා. 2 ට නැවත පවත්වන ලදී.

அதன்படி அமர்வு பி. ப. 2 மணிவரை இடைநிறுத்தப்பட்டு, மீண்டும் ஆரம்பமாயிற்று.

Sitting accordingly suspended till 2 p.m. and then resumed.–

හැරල්ඩ් හේරත් මහතා (ඇමතිතුමා සහ නියෝජ්‍ය ජනතා වතු සංවර්ධන ඇමතිතුමා)
(திரு. ஹரல்ட் ஹேரத் — அமைச்சரும் ஜனதா தோட்ட அபிவிருத்திப் பிரதி அமைச்சரும்)
(Mr. Harold Herath Minister and Deputy Minister of Janata Estates Development)

Mr. Deputy Speaker, the Resolution which was placed before the House was to increase the authorised capital of the JEDB but the hon. Members of the Opposition have covered the entire subject of the plantation sector and I feel it my duty to reply to some of the important points that were raised specially by the hon. Member for Attanagalla. He wanted a clarification as to what we were doing with the surplus funds, the profits we have made, and I wish to state temporarily the surplus funds are with the Bank of Ceylon, specially reserved for the payment of tax on the profits of 1984 which will become payable in November 1985.

The Treasury is aware of the JEDB short-term investments which are being made pending the payment of taxes. It is expected to pay the tax on profits for 1984 and thereafter the dividend to the Treasury will be paid. Regarding, dividend to the Treasury, though he said there is a circular that 50 per cent has to be paid by all corporations and boards, it is negotiable, depending on the investment the Corporation is making. Special concessions are given to the two plantation Corporations like the State Plantations Corporation and the JEDB and for 1983 we have been called upon to pay Rs. 30 million, which we have done, as a contribution.

Now, there were some other matters which were raised by the hon. Member for Attanagalla about the on-going projects. We have three projects which are in the stages of conclusion. Those are the two projects in Hatton and the one in the Badulla area. Then we have the Medium Term Investment Programme which has just started. As regards the two projects which are being concluded this year, that is, the two in Hatton and the one in Maskeliya, we have had very favourable reports from the visiting mission of the World Bank – the IDA, International Development Asociation – that the Planning Division of the JEDB has done very well and that the projects are being very well monitored. The comments made by the mission are very favourable.

The fourth project has only just started. The earlier three projects have done a vast amount of field development, factory development, modernizing of factories. The welfare of the workers has been greatly looked into ; Investment has been made in building cottage-type houses for the workers. We have up-graded the existing dispensaries ; schools have been re-done and repaired. I think a vast amount of work has been concluded on the earlier three projects.

The final project which has just started is a composite project. We have had aid from various organizations. I would like to mention one special feature in that project : there is a separate component for the small-holders in whom the hon. Member for Kotmale was very keen that we should take special interest, specially the two Corporations. We have a special division to look into, not only the manufacture of tea but also distribution of fertilizer and even transport of their tea snd various other matters which the small-holders on their own would find it difficult.

Sir, I think this Bill is seeing the light of day after much deliberation in the Cabinet. I can recollect that this Bill really came up sometime ago for ratification in the Cabinet and there had been certain misconceptions and problems that arose pertaining to the activities in the cultural sphere for the simple reason that we do not know what the Government's intention is in splitting up the cultural activities of this country to various components. We are feeling very sorry in one way because we find that if we can bring some sort of ethnic relationship between various communities that are existing in this country it is by the development of culture. Therefore I am opposed to this system. To tell you very frankly it has created more divisions than anything else by having various cultures of this country divided into various Ministries. Sir, it is a very unfortunate situation that a Minister for Regional Development is in charge of Hindu culture we are also very sorry to find there is a little Department of Muslim Cultural Affairs in the Ministry of Transport.

සරත් මුත්තෙට්ටුවෙගම මහතා
(திரு. சரத் முத்தெட்டுவெகம)
(Mr. Sarath Muttetuwegama)

That is because it is a moving culture !

ලක්ෂ්මන් ජයකොඩි මහතා
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)
(Mr. Lakshman Jayakody)

That is a very apt phrase used by my hon. Friend. I thlink it is quite correct, (*Interruption*) It is not a Ministry. This is exactly what the Deputy Miniser does not understand. There is no Ministry called the Hindu Cultural Ministry. Nor has a Ministry called a Muslim Cultural Ministry been gazetted.

සරත් මුත්තෙට්ටුවෙගම මහතා
(திரு. சரத் முத்தெட்டுவெகம)
(Mr. Sarath Muttetuwegama)

Muslim Affairs ?

ලක්ෂ්මන් ජයකොඩි මහතා
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)
(Mr. Lakshman Jayakody)

No. It is only a Department coming under the Ministry of Transport Boards and Ministry of Private Ominibus Transport and also there is something looked on again, that is some security organization with commercial activity (*Interruption*) No, that is also a Ministry now. Now, how does the Muslim culture fit into this framework ?

සරත් මුත්තෙට්ටුවෙගම මහතා
(திரு. சரத் முத்தெட்டுவெகம)
(Mr. Sarath Muttetuwegama)

That is the rollling stock !

ලක්ෂ්මන් ජයකොඩි මහතා
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)
(Mr. Lakshman Jayakody)

See what has happened to the Catholics very recently. Every August while we go to Kandy for our *Perahera* and while in each area they have the *Esala peraheras* and everything, the Catholics of this country go to Madhu. The people in my electorate, the Divulapitiya area, irrespective of the fact whether they are Catholics or not have been used to that. We have a blended culture. Even Buddhists go to Madhu. You know in certain areas like in Colombo, even Buddhists and Muslims go to St. Anthony's Church in Kochchikade. So there is a synthesis of cultures that has taken place.

Now this year how did the Catholics celebrate the Madhu feast ? They went to a place called Mattakotuwawella or some place and called it a Kuda Madhu. The Hon. Minister for Coconut Industries had been there and they celebrated the Madhu feast in that place. Of course, that place is also quite venerated. It has been there for the last 80 odd years, but you can just imagine the situation ! We have to have a rehabilitation progamme for that little church there and just imagine with all these ethnic problems even the Catholics cannot go to that area. I do not know whether they ever had this Madhu festival even among the Tamils. I do not think they had it. (*Interruption*) So ultinmately what happened was this. Because of this a vlery learned Catholic priest from the Chilaw area I believe, has written in the press today that they want to have another Ministry for Christian Affairs. Very soon you might find that that is also being broken up into various sections.

සරත් මුත්තෙට්ටුවෙගම මහතා
(திரு. சரத் முத்தெட்டுவெகம)
(Mr. Sarath Muttetuwegama)

That will be given to Sports.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ලක්ෂ්මන් ජයකොඩි මහතා
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)
(Mr. Lakshman Jayakody)

Pentecostals would like to have one, the Baptists would like to have one, the wesleyans would like to have one, the Salvation Army would like to have another; then the Methodists would like to have one, the Church of Ceylon would like to have one and various little Protestant churches also will start –(*Interruption*). The hon. Member for Kalawana is suggesting that we should give the Salvation Army to the Ministry of National Security. Anyway, Sir, you can just imagine what is going to happen. The next thing would be that these will get divided into various sects. There will be the Shia Muslim and the Shunni Muslim. You will find that happening.–(*Interruption*). They are called Shia and Shunni Muslims.

What I suggest is for God's sake, bring some rationale into what you are doing. Let there he one Cultural Ministry and in that Cultural Ministry have various departments; have the denominational heads of those religions to man those deparments. Let the Cultural Ministry be the head. Let there be a department of Muslim Affairs, a department of Catholic Affairs, a department of Christian Affairs; have Moulavis or priests or Reverend Bhikkus or Maha Theras in these organiztions and then let them be the advisory bodies. Let there be a very good Catholi as the head of the Catholic organization, a very good Buddhist as the head of the Buddhist organization, a very good Hindu as the head of the Hindu organization, a very good muslim in the Muslim organization and then let there be a blend. I could tell you very frankly that during the last government there was a wonderful sector; we had in the Ministry of Cultural Affairs a Muslim music section.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(Mr. Deputy Speaker)

Order, please! the Deputy Chairman of Committees will take the Chair now.

අනතුරුව නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වුයෙන්, නියෝජ්‍ය කාරක සභාපතිතුමා [එඩ්මන්ඩ් සමරවික්‍රම මහතා] මූලාසනාරූඪ විය.

அதன் பிறகு, பிரதிச் சபாநாயகர் அவர்கள் [திரு. எட்மண் சமரவிக்ரம] தலைமை வகித்தார்கள்.

Whereupon MR. DEPUTY SPEAKER *left the Chair, and* MR. DEPUTY CHAIRMAN OF COMMITTEES [MR. EDMUND SAMARAWICKREMA] *took the Chair.*

සරත් මුත්තෙට්ටුවෙගම මහතා
(திரு. சரத் முத்தெட்டுவெகம)
(Mr. Sarath Muttetuwegama)

Hear! Hear! You are coming at the right time. We are talking about culture.

ලක්ෂ්මන් ජයකොඩි මහතා
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)
(Mr. Lakshman Jayakody)

We are very happy that you have taken that Chair because you are one of those fit and proper persons to become the head of the Buddhist sector. After all, Pelana Vajiragnana Maha Thera was a very revered priest that we had in this country and you are a direct descendant of him. You have learnt at his feet in the holy shrine of Vajirarama and, Sir, we must have people like you who are good Buddhists who will really stick to the tenets of Buddhism.

සරත් මුත්තෙට්ටුවෙගම මහතා
(திரு. சரத் முத்தெட்டுவெகம)
(Mr. Sarath Muttetuwegama)

The suggestion is that we will lose a good Deputy Chairman of Committees.

ලක්ෂ්මන් ජයකොඩි මහතා
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)
(Mr. Lakshman Jayakody)

The second matter is this. At the moment this Ministry of Regional Development –

සරත් මුත්තෙට්ටුවෙගම මහතා
(திரு. சரத் முத்தெட்டுவெகம)
(Mr. Sarath Muttetuwegama)

What is the Ministry you are offering to the Deputy Chairman?

ලක්ෂ්මන් ජයකොඩි මහතා
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)
(Mr. Lakshman Jayakody)

Buddhist Affairs.

සරත් මුත්තෙට්ටුවෙගම මහතා
(திரு. சரத் முத்தெட்டுவெகம)
(Mr. Sarath Muttetuwegama)

What do you say?

ලක්ෂ්මන් ජයකොඩි මහතා
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)
(Mr Lakshman Jayakody)

Because he follows the *pancha seela* so well.

එතුමා දාන, ශීල, භාවනා යන පුණ්‍යකර්මවල යෙදෙනවා. සමහර අවස්ථාවලදී සමාධියට සමවදිනවා. එතුමාට ඥානය තිබෙනවා; ප්‍රඥව තිබෙනවා;– තමුන්නාන්සේලාට වාගේ විඥානය විතරක් නොවෙයි. එතුමාට තිබෙන්නේ. එතුමා පංච ශීලය හොඳට ආරක්ෂා කරන්නාවූ ඉතාමත් හොඳ බෞද්ධ උපාසකයෙක්. ඒ වාගේම එතුමා දක්ෂයි.

Let me come back. There is another important matter that I would like to bring to your notice. We would like to know from the Hon. Minister how he has moved the monies that had been voted for the Regional Development Ministry to this sector of Hindu Affairs. I am made to understand that there is a Department of Tamil Affairs and there is a Department of Hindu Affairs. There are two departments.

සරත් මුත්තෙට්ටුවෙගම මහතා
(திரு. சரத் முத்தெட்டுவெகம)
(Mr. Sarath Muttetuwegama)

What department is –

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ලක්ෂ්මන් ජයකොඩි මහතා
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)
(Mr. Lakshman Jayakody)

I cannot understand this division within that Ministry. When we pass the Budget, we find that there are Programmes, Projects and Objects. We later find that sometimes the money that is voted for Projects and Objects get moved into Programmes without proper sanction. This, I fear, does happen. What safeguard do you have to ensure that people will not divert these funds without Cabinet approval ? Please check up on this. I would like the hon. Deputy Minister to check up on this and find out whether moneys voted by this House have been moved to various Programmes and Objects, quite contrary to the purposes of the Budget.

The other day I went to Kandy and on the way I saw a huge construction on the left-hand side. It was very well done. It is called the Hindu Cultural Centre in Kandy. From where did they get the money to put up this building ? The hon. Deputy Minister must let us know from where the Hindu Cultural Centre got this money ? We are very happy that they have a culturl centre of that nature. It is excellent but we would like to know from where they got the money.

Then, there is a huge mosque coming up in the Wellawatte area. From where did they get the money ? Does the Hon. Minister of Muslim Cultural Affairs know from where they got the money ? Therefore, when you legislate for one particular religion you must see that you have similar organisations for other religions too. If not there will be clashes of opinion, instability in the country and people will find that certain orgnisations are developing in one way and other orgnisations are developing in another way. The hon. Member for Akmeemana (Mr. Richard Pathirana) had to bring out certain aspects of the problem before this House. I think the hon. Deputy Minister should consider them. We would like to know how these moneys have been spent.

I had a glance through this Bill and it says that the Board shall consist of a certain number of members. There is going to be a Fund and there is going to be Board. Five of these members will be appointed by the Minister. Of the three ex-officio members, one is to be the Secretary to the Ministry in charge of the subject of Hindu Affairs. Very good ! He has to be there. The other two ex-officio members are the Director of Hindu Affairs and the Director of Tamil Affairs. –(*Interruption*). They are two separate departments. I would like to know whether all Tamils are Hindus or whether all Hindus are Tamils ? I know of a Sinhala family who are Hindus. Why do you not have a Sinhalese who is a Hindu on this board ? A Sinhalese can be a Muslim. Please appoint at least two Sinhalese to this Board. Do not make a fully pan-Tamil Board. I say this for the reason that if you try to do that you will be bringing in the idea of compartmentalisation, which is not a very good thing. There should not be caste or creed differences. There should not be ideas of that nature. we must blend and synthesize the cultures because that is the way culture can grow in this country.

Then, there is money coming in from local and foreign sources. I do not know whether money coming from local or foreign sources should come through the External Resources Department of the Ministry of Finance. It can be a Buddhist organisation or any other organisation. Whatever organization it may be, please see – I urge this Government to see to it – that foreign capital received by all voluntary organisations is routed through the Department of External Resources of the Ministry of Finance because that is one place where you can check whether the money is going into an organisation or not.

Those are the comments that I wanted to make. We are not going to object to this Bill. We like the establishment of this Fund and we will even help you to collect funds for Hindu cultural activity because there is a closeness between Buddhism and Hinduism.

It is high time that we stopped dividing into various Ministries of this nature. We would urge you to see that you bring all these Cultural Departments – it is a good thing that you are having for various cultures – into one central Ministry, and obviously that has to be the Ministry of Cultural Affairs.

Then, Sir, we have the Buddhist Temporalities Ordinance which is operative and there is this Fund. To this fund certain powers have been given and there may be clashes. So, in order to avoid them bring all of them under one Ministry.

අ. භා. 3.13

පී. බී. කවිරත්න මහතා (නියෝජ්‍ය පුද්ගලික බස් ප්‍රවාහනය පිළිබඳ ඇමතිතුමා)
(திரு. பீ. பி. கவிரத்ன—தனியார் பஸ் போக்குவரத்துப் பிரதி அமைச்சர்)
(Mr. P. B. Kaviratne – Deputy Minister for Private Omnibus Transport)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. හින්දු සංස්කෘතිය පිළිබඳ අරමුදලක් පිහිටුවීම සඳහා වන මේ පනත ඉදිරිපත් කරන මේ අවස්ථාවේදී ඒ පිළිබඳව වචන ස්වල්පයක් කථා කිරීමට මම කල්පනා කරනවා. අත්තනගල්ලේ ගරු මන්ත්‍රීතුමා (ලක්ෂ්මන් ජයකොඩි මහතා) මේ පනත පිළිබඳව කථා කරමින් හොඳ අදහසක් ඉදිරිපත් කළා. මේ අරමුදල පිළිබඳ මණ්ඩලය පත් කරන විට අඩු තරමින් බෞද්ධ සංස්කෘතිය හා හින්දු සංස්කෘතිය යන මේ සංස්කෘතීන් දෙකම පිළිබඳ යම් විශාරද දැනුමක් තිබෙන ද්‍රවිඩ උගතුන් මෙන්ම සිංහල උගතුන් පත් කරන ලෙස එතුමා ඉල්ලීමක් කළා.

සංස්කෘතිය බෙදන එක වැරදියි. සංස්කෘතිය යනු මිනිස් වර්ගයාගේ පාරම්පරික උරුමයක්. ඒ උරුමය කාලානුරූපව සමාජ වාතාවරණයේ යම් යම් වෙනස්කම් හා සිතුම් පැතුම්වල වෙනස්කම් අනුව වෙනස් වුවත් මානව වර්ගයාගේ පාරම්පරික උරුමය පිළිබඳ මූලික අවශ්‍යතා මූලික දැනුම හා මූලික වටිනාකම් එකයි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

හින්දු සංස්කෘතිය පිළිබඳ අරමුදලක් මේ වාගේ වකවානුවක ඇති කිරීම යුතුයි. මන්ද ? විවිධ ජාතීන්, විවිධ භාෂා, විවිධ කලා ශිල්ප, විවිධ සංස්කෘතීන් ඇති අප රටේ සංකීර්ණත්වය ගැන සලකා බලන විට මේ හැම සංස්කෘතියකම මානව වටිනාකම අගය කරන ජනතාවක් බවට පරිවර්තනය වීමට ප්‍රබුද්ධ ජනතාව විශේෂයෙන් තැබුරු විය යුතුයි. එසේ නොමැතිව තමතමන්ගේ සංස්කෘතිය පිළිබඳ යම් උඟ දක්වීමක් කර අන්‍ය සංස්කෘතීන් පහතට දැමීමට කෙනෙක් කල්පනා කරතොත් එය අප ජාතියක් වශයෙන් යන මේ ඉදිරි ගමනට බාධාවක් වේයයි මම කල්පනා කරනවා.

අද අපි කථා කරන මේ මොහොත වන විට මේ රටේ ජන වාර්ගික ප්‍රශ්නය පිළිබඳ වැදගත් සාකච්ඡාවක්, තීරණාත්මක සාකච්ඡාවක් ඉතිහාසය පිළිබඳ යම් වෙනස්කමක් ඇති කරන සාකච්ඡාවක් ඇති වෙගෙන යනවා. මේ රටේ සිංහල හා බෞද්ධ සංස්කෘතීන් සමග එකට ඇදී සම්බන්ධ වී ගිය හින්දු සංස්කෘතිය පිළිබඳව අපේ පාර්ලිමේන්තුව අපේ ජනතාව යම්කිසි ඇල්මක් හිතට එකඟව අවංකව ඇති කරගෙන සිටින බව අපි එය අගය කරන බව ලෝකයාට පෙන්වීම යුතුයි සුදුසුයි අවස්ථානුකූලයි කියන එකයි, මගේ කල්පනාව. හින්දු සංස්කෘතිය මේ රටේ බෞද්ධ සංස්කෘතිය සමඟ, මේ රටේ සිංහල සංස්කෘතිය සමග එකට සම්බන්ධ වී එකට මිශ්‍ර වී ගමන් කළ බව ඉතිහාසයෙන් පැහැදිලි වෙනවා. අනුරාධපුර යුගයේ සිංහල කලා ශිල්පීන් බෞද්ධ කලා ශිල්පීන් කෙටූ සඳකඩපහණේ තිබෙන රූප අතර ගොනාගේ රූපය අතුලත් වී තිබෙනවා. නමුත් පොළොන්නරු යුගයට එන විට සිදු වී තිබෙන විශේෂ වෙනසක් පැහැදිලිව දකින්න තමුන්නාන්සේලාට පුළුවන් වෙයි. පොළොන්නරු කැටයම් දෙස බලන විට, ඒ කැටයම් විශ්ලේෂණය කොට, විමර්ශනය කොට බලන විට පෙනෙයි, මා මුලින් සඳහන් කළ අර රූප අතරින් වූවමනාවෙන්ම වාගේ ගොනාගේ රූපය — විශේෂයෙන් ඒ සඳකඩපහණින් — ඉවත් කිරීමට සිංහල කලා ශිල්පියා කටයුතු කර තිබෙන බව.

ඒ වකවානුව වන විට සිංහල, බෞද්ධ කලා ශිල්පවලට හා සංස්කෘතියට තදබල බලපෑමක්, ආභාෂයක් හින්දු සංස්කෘතියෙන් ලැබී තිබුණා. හින්දු සංස්කෘතියෙන් ඒ ආභාෂය ලැබී තිබුණේ අපේ කලා ශිල්පවලට, සාහිත්‍යයට, චාරිත්‍ර - වාරිත්‍රවලට හා බෞද්ධාගමට පමණක් නොවෙයි, විශේෂයෙන් ඒ කාල සීමාව තුළදී අපේ ආවාහ - විවාහවලට පවා ඒ බලපෑම, ආභාෂය ලැබී තිබුණා. අපේ චාරිත්‍ර - වාරිත්‍රවලට හින්දු සංස්කෘතියෙන් ලැබුණු ඒ බලපෑම ඉවත් කරන්න පුළුවන් විධියේ එකක් නොවෙයි. ක්‍රි. පූ. 5 වැනි ශත වර්ෂය වන විට භාරතයේ, දඹදිව, ඉන්දියාවේ — විශේෂයෙන් දකුණු ඉන්දියාවේ — කලා ශිල්ප, නැටුම්, සංගීතය, සාහිත්‍යය ආදී මේ සියල්ලක්ම සිංහල කලා ශිල්ප කෙරෙහි බලපෑවා. ක්‍රි. පූ. 5 වැනි ශතවර්ෂය වන විට දකුණු ඉන්දියාවේ වාසය කළ බෞද්ධ උගතුන් තමයි, ලංකාවට ඇවිත් පාලි භාෂාවෙන් අටුවා ග්‍රන්ථ ලිව්වේ කියන එක කල්පනා කරන විට අපට හිතා ගන්න පුළුවනි, මේ සංස්කෘතීන් දෙක අතරේ මොන තරමේ සබැඳියාවක් තිබුණාද කියා.

නියෝජ්‍ය සභාපතිතුමනි, ද්‍රවිඩ සාහිත්‍යයේ ඉතාම වැදගත් කවියෙකු වශයෙන් සලකන්න පුළුවන් ඉලංගෝ අඩිකල් නමැති කවියා ලියූ කාව්‍යයක් පූජ්‍ය පණ්ඩිත හිස්සැල්ලේ ධම්මරතන ස්වාමීන් වහන්සේ විසින් "පත්තිනි දෙයියෝ" නමින් සිංහලයට පෙරලා තිබෙනවා.

ලක්ෂ්මන් ජයකොඩි මහතා
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)
(Mr. Lakshman Jayakody)

ඒ කාව්‍යය තමයි, සිලප්පදිකාරම්.

පී. බී. කවිරත්න මහතා
(திரு. பீ. பி. கவிரத்ன)
(Mr. P. B. Kaviratne)

අත්තනගල්ලේ ගරු මන්ත්‍රීතුමා (ලක්ෂ්මන් ජයකොඩි මහතා) මතක් කළා, සිලප්පදිකාරම් කාව්‍යය ගැන. ඒ කවියාගේම මණිමේකලෙයි කාව්‍යයත් සිංහලයට පරිවර්තනය වී තිබෙනවා.

මා කලින් සඳහන් කළ ස්වාමීන් වහන්සේ මේ රටේ සිටි හොඳ ප්‍රවීණ ද්‍රවිඩ උගතෙක්. අර ඉලංගෝ අඩිකල් කවියා ද්‍රවිඩ භාෂාවෙන් රචිත ඒ කාව්‍යයේ අඩංගු සම්පූර්ණ කථාවම උන් වහන්සේ ඒ විධියට " පත්තිනි දෙයියෝ " නමින් සිංහලට පරිවර්තනය කර තිබෙනවා. ඒ කාව්‍ය කියවන විට මැනවින් පැහැදිලි වෙනවා, බෞද්ධ බලපෑම කොයි තරම් දුරට තිබෙනවාද කියා, ද්‍රවිඩ කාව්‍ය සාහිත්‍යය කෙරෙහි ; ද්‍රවිඩ සාහිත්‍යකරුවන් කෙරෙහි.

ඒ නිසා කෙටියෙන් වුණත් ඒ තත්ත්වය ගැනත් සාකච්ඡා කරන්න සිද්ධ වෙනවා. සිංහල හා ද්‍රවිඩ ජාතීන් අතර පමණක් නොවෙයි, සංස්කෘතීන් අතරත් තිබුණු ඒ සම්බන්ධය සුළු - පටු විධියට සලකා, මැන, තක්සේරු කොට දක්වන්න පුළුවන් එකක් නොවෙයි. පුදුම විධියේ ඒකාබද්ධතාවක්, ඒකාග්‍රතාවක්, සම්බන්ධයක් මේ සංස්කෘතීන් දෙක අතර පවතිනවා. ඒ නිසා ඒ සම්බන්ධය ගැන කල්පනා කර බලා, ඓතිහාසික වැදගත්කම් ගැන මෙනෙහි කර බලා ප්‍රාදේශීය සංවර්ධන ඇමතිතුමා මේ පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීම පිළිබඳව අපේ ගෞරවය එතුමාට පුද කරනවා. අවසාන වශයෙන් සිංහල සංස්කෘතියේ උන්නතිය බලාපොරොත්තු වන, ප්‍රාර්ථනා කරන උගතුනුත්, හින්දු සංස්කෘතිය පිළිබඳ ප්‍රවීණ දැනුමක් තිබෙන උගතුනුත් යන දෙපක්ෂයෙන්ම මේ මණ්ඩලය සමන්විත කරවීමට කටයුතු කරනු ඇතැයි බලාපොරොත්තු වෙමින් මා නිහඬ වෙනවා.

ප. ව. 5. 30

ඩී. වින්සන්ට් ඩයස් මහතා
(திரு. டீ. வின்சன்ட் டயஸ்)
(Mr. D. Vincent Dias)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අක්මීමන ගරු මන්ත්‍රීතුමා (රිචඩ් පතිරණ මහතා) ප්‍රකාශ කළා, ගාල්ලේ බෞද්ධ සිද්ධස්ථානයක් ගැන. මම දන්නේ නැහැ එතුමා ප්‍රදේශයේ මන්ත්‍රීවරයා හැටියට ඒ සිද්ධස්ථානය සම්බන්ධයෙන් කොපමණ දුරට කටයුතු කර තිබෙනවාද කියා. දිසා අමාත්‍යාංශ මාර්ගයෙන් කෙරෙන ආධාර, දිවයිනේ නොයෙකුත් දානපතියන්ගෙන් පුණ්‍යායතන සඳහා කෙරෙන ආධාර සංස්කෘතික දෙපාර්තමේන්තුවට යොමු කෙරෙනවා. පුනරුත්ථාපන කටයුතු සඳහා කෙරෙන එවැනි ආධාර ආදායම් බද්දෙන් නිදහස් වෙනවා. ඒ වාගේම සංස්කෘතික දෙපාර්තමේන්තුව යටතේ බෞද්ධ සංස්කෘතික අරමුදලක් පිහිටුවා තිබෙනවා. මම දන්නේ නැහැ, එතුමා ඒ ගැන දන්නවාද කියා. ඒ අංශයටත් විශාල වශයෙන් ආධාර මුදල් ලැබෙනවා. ඒ සෑම මුදලක්ම ආදායම් බද්දෙන් නිදහස් වෙනවා.

රිචඩ් පතිරණ මහතා
(திரு. றிச்சட் பத்திரன)
(Mr. Richard Pathirana)

මම ගරු නියෝජ්‍ය ඇමතිතුමාට කියන්නට කැමතියි, මම මේ සම්බන්ධයෙන් අමාත්‍යාංශයෙනුත් සොයා බැලුවා. වැඩිම ගණන දෙන්නේ රුපියල් දෙදහස් පන්සියයයි.

ඩී. වින්සන්ට් ඩයස් මහතා
(திரு. டீ. வின்சன்ட் டயஸ்)
(Mr. D. Vincent Dias)

ඒ දෙන්නේ දැනට අමාත්‍යාංශය මගින් ඒ ඒ ආසනවල මන්ත්‍රීවරයාගේ අනුමැතිය අනුව යම් විහාරස්ථානයක හෝ දහම් පාසලක යම්කිසි සංවර්ධන කටයුත්තක් සඳහායි. ඒක ඉතාම සුළු මුදලක්. නමුත් විශේෂ ඉල්ලීමක් තිබෙනවා නම් ඒ ගැන අමාත්‍යාංශයේ සැලකිල්ල යොමු කරනවා. අපේ අමාත්‍යාංශයෙනුත් අපේ ගරු ඇමතිතුමා මුදල් වෙන් කර දැනට කතරගම සංස්කෘතික මධ්‍යස්ථානයක් සාද ගෙන යනවා. බදුල්ලේත් සංස්කෘතික මධ්‍යස්ථානයක් සඳහා ඉදිරි අනාගතයේදී මුදල් යොදවන්නට මම බලාපොරොත්තු වෙනවා. ඒ සඳහා විශාල මුදලක් අප බලාපොරොත්තු වෙනවා. මුදල් අමාත්‍යාංශයේ පාලනයෙන් තොරව කිසිම විදේශීය ආධාර මුදලක් කිසිම ඒජන්සියකට ලබා ගන්නට බැහැ. ඒ හැම මුදලක්ම සඳහා මුදල් අමාත්‍යාංශයෙන් අනුමැතිය ඇතිවයි, ඒ ඒ අංශවලට ලැබෙන්නේ. මම දැනුවත්ව එහෙමයි කෙරෙන්නේ. එම නිසා මහා භාණ්ඩාගාරය නොදැනුවත්ව මේ රටට, කිසිම ආයතනකට කිසිම ආගමික හෝ පුණ්‍යායතනයකට විදේශ රටවලින් මුදල් ලැබෙන්නේ නැහැ. ඒ විධියට මහා භාණ්ඩාගාරයේත් මුදල් අමාත්‍යාංශයේත් පාලනයක් තිබෙනවා.

මෙම අරමුදල පිහිටුවීම ගැන වැදගත් සාකච්ඡා ඇති වුණා. මම ගරු ඇමතිතුමාට මේ කාරණය සඳහන් කර මණ්ඩලය පත් කිරීමේදී ඒ සඳහා විශේෂඥයින්ගේ සහාය ලබා ගැනීමට කටයුතු යෙදීමට ඇමතිතුමාගේ අවධානය යොමු කිරීමට මම බලාපොරොත්තු වෙනවා. මේ මණ්ඩලයට පස් දෙනෙක් ගරු ඇමතිතුමා විසින් නම් කරනවා. තිලබලයෙන්ම පත්වන හින්දු කටයුතු පිළිබඳ අධ්‍යක්ෂවරයාත්, ඒවාගේම දෙමළ කටයුතු පිළිබඳ අධ්‍යක්ෂවරයාත්, අමාත්‍යාංශයේ ලේකම්තුමාත් හැරුණු විට අමාත්‍යතුමා විසින් සභාපතිතුමා නම් කරනු ලබනවා. තවත් සාමාජිකයෙකු පත් කිරීමට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඩී. වින්සන්ට් ඩයස් මහතා]

ඉඩ තිබෙනවා. එම නිසා තමුන්නාන්සේලා සඳහන් කළ කාරණා ගැන ගරු ඇමතිතුමාත් සමඟ සාකච්ඡා කර ඒ මණ්ඩලය පත් කරන අවස්ථාවේදී ඒ පිළිබඳව සැලකිල්ල යොමු කරන බව මම මේ අවස්ථාවේදී සඳහන් කරන්නට කැමතියි.

මේ ගැන තවදුරටත් කථා කරන්නට වුවමනා යයි මම හිතන්නේ නැහැ. නියෝජ්‍ය පුද්ගලික බස් ප්‍රවාහන ඇමතිතුමා සඳහන් කළ පරිදි මේ වගේ අවස්ථාවක අද රට මුහුණ පා තිබෙන තත්ත්වය අනුව, මේ වගේ අරමුදලක් පිහිටුවීම ඉතාම වැදගත් වෙනවා. හින්දු භක්තිකයන්ට ඒ අය අදහන ඒ අයගේ දර්ශනය ඒ අයගේ විශ්වාසය අනුව මෙය වැදගත් වෙනවා. අපේ බෞද්ධයන් තුළත් යම් යම් හින්දු පූජනීය ස්ථාන සහ ඒ දර්ශනය පිළිබඳ විශ්වාස රැදී පවතිනවා. මෙවැනි වකවානුවකදී මේ විධියේ අරමුදලක් තුළින් ඒ ජනතාවගේ විශ්වාසය සහ දර්ශනය තහවුරු කිරීම පිණිස ඒ ඇදහිලි පුදපූජා පැවැත්වීම පිණිස ඒ අයට නොයෙකුත් පහසුකම් ඇති කිරීම ඉතාම වැදගත් වෙනවා ; කාලෝචිත වෙනවා. මගේ ගරු ඇමතිතුමා වෙනුවෙන් හින්දු සංස්කෘතික අරමුදල් පනත මෙම ගරු සභාවෙන් සම්මත කර ගැනීමට අවස්ථාව ලැබීම ගැන මම බෞද්ධයකු වශයෙන් ඉතාම සන්තෝෂ වෙනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

පනත් කෙටුම්පත ඊට අනුකූලව දෙවන වර කියවන ලදී.

வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.

அதன்படி, சட்டமூலம் இரண்டாம் முறையாக மதிப்பிடப்பெற்றது.

Question put, and agreed to.
Bill accordingly read a Second time.

මතු පළවන යෝජනාව සභාසම්මත විය.:

"පනත් කෙටුම්පත පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවකට පැවරිය යුතුය.–[එම්. වින්සන්ට් පෙරේරා මහතා]

தீர்மானிக்கப்பட்டது :

" சட்டமூலம் முழுப் பாராளுமன்றக் குழுவுக்குச் சாட்டப்படுமாக. " [திரு. எம். வின்சன்ற் பெரேரா]

Resolved :

"That the Bill be referred to a Committee of the whole Parliament." – [*Mr. M. Vincent Perera*]

කාරක සභාවෙහිදී සලකා බලන ලදී.

[නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනාරූඪ විය.]

குழுவில் ஆராயப்பட்டது.

[குழுக்களின் பிரதித் தலைவர் அவர்கள் தலைமை வகித்தார்கள்.]

Considered in Committee.

[MR. DEPUTY CHAIRMAN OF COMMITTEES *in the Chair.*]

1 සිට 18 තෙක් වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

ප්‍රඥප්ති වගන්තිය සහ නාමය පනත් කෙටුම් පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

පනත් කෙටුම්පත, සංශෝධන රහිතව, වාර්තා කරන ලදී.

1 ஆம் வாசகத்திலிருந்து 18 ஆம் வாசகம்வரை சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.

சட்டமாகு வாசகமும் தலைப்பும் சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.

சட்டமூலம் திருத்தமின்றி அறிக்கை செய்யப்பட்டது.

Clauses 1 to 18 ordered to stand part of the Bill.

Enacting Clause and Title ordered to stand part of the Bill.

Bill reported without Amendment.

එම්. වින්සන්ට් පෙරේරා මහතා
(திரு. எம். வின்சன்ற் பெரேரா)
(Mr. M. Vincent Perera)

I move,

"That the Bill be now read the Third time".

ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

පනත් කෙටුම්පත ඊට අනුකූලව තුන්වන වර කියවා සම්මත කරන ලදී.

வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.

அதன்படி, சட்டமூலம் மூன்றும் முறையாக மதிப்பிடப்பெற்று நிறைவேற்றப் பெற்றது.

Question put, and agreed to.

Bill accordingly read the Third time, and passed.

කල්තැබීම
ஒத்திவைப்பு
ADJOURNMENT

එම්. වින්සන්ට් පෙරේරා මහතා
(திரு. எம். வின்சன்ற் பெரேரா)
(Mr. M. Vincent Perera)

I move,

"That the Parliament do now adjourn".

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

வினா எடுத்தியம்பப்பெற்றது.

Question proposed.

සරත් මුත්තෙට්ටුවේගම මහතා
(திரு. சரத் முத்தெட்டுவெகம)
(Mr. Sarath Muttetuwegama)

I have given notice of a question to be asked from the Hon. Minister of Posts and Telecommunications. It is a fairly serious matter. It is about the bugging of telephones. The information that I have, Sir, is that a large number of telephones in the country are being bugged, that even the telephones of very, very important people are being bugged. It is bad enough that the telephones of people in the Opposition are being bugged, but fairly important people in th Government also are having their telephones bugged. I have given notice of this question, but I do not see the Hon. Minister here.

I also want to know, Sir, whether on the 3rd January 1983 some equipment for tapping telephones was paid for when the bill was sent to Mr. W. T. Jayasinghe, Secretary, Ministry of Foreign Affairs, Republic Building, Colombo, through the Embassy for Sri Lanka in Bonn. The following items were ordered :

1 SIPE Super
1 SIPE Ricegrain
1 SIPE 1000-s
1 SIPE COM

I have the descriptions given by the manufacturers. They are all for telephone-tapping. They are all telephone bugs.

Now, the Sri Lanka Government could not have ordered telephone-bugging equipment, which was delivered to the Sri Lanka Embassy in Bonn and the bill

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

made out to Mr. W. T. Jayasinghe, for curiosity value. They could not have been getting this bugging equipment just to have a look at what it is or to learn how to make it. This is being used for bugging telephones. I am also given to understand that three people had been specially flown down from West Germany some time ago because the first consignment of this SIPE super, SIPE Ricegrain and other bugging equipment got burnt because of wrong installation. Subsequently some people were brought, and this equipment is now installed. The bugging is going on, and the God only knows whose telephones are being bugged. There are all sorts of guarantees and freedoms given in the Constitution. I have asked the Hon. Minister of Posts and Telecommunications whether telephones are being tapped, whether he is aware of it, whether anybody has given and order, an what is being done with this equipment. The Hon. Minister is not here. I do not know whether he has been bugged.

I am tabling a photocopy of this bill from SIPE Electronic Special Equipment, GMBH Export, West Germany, sent to the Sri Lanka Embassy in West Germany and addressed to Mr. W. T. Jayasinghe*.

ලක්ෂ්මන් ජයකොඩි මහතා
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)
(Mr. Lakshman Jayakody)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මා ඉතාමත් ඉක්මණින් මගේ ප්‍රශ්න ටික ගරු ජාතික ආරක්ෂක ඇමතිතුමාගෙන් ඇසීම පිණිස ඉදිරිපත් කරන්න කැමතියි. මගේ පළමුවන ප්‍රශ්නය මෙයයි :

ග්‍රාමාරක්ෂක භටයින්ට තුවක්කු නිකුත් කිරීමෙන් පසු රටේ නොයෙකුත් ස්ථානවල එම අයගෙන් තුවක්කු පත්තුවී අසරණයින් කිහිප දෙනෙක්ම මරුමුවට පත් වී ඇති බව පුවත්පත් වාර්තාවල සඳහන් වේ. මෙම තුවක්කු නිකුත් කිරීමට පෙර ඔවුනට තුවක්කු පාවිච්චිය පිළිබඳව පුහුණුවක් ලබා දී තිබේද ? එම අය තුවක්කු පාවිච්චි කිරීමට සුදුසු මානසික සහ සමාජීය තත්ත්වයක සිටින බවට පරීක්ෂා කරන ලද්දේද ? එම අයට තුවක්කු නිකුත් කිරීමේදී මීට වඩා සුරක්ෂිත ක්‍රමයක් අනුගමනය කරනවාද ?

මා මේ විධියට අහන්නේ තුවක්කුවක් කියන එක දෙන්නේ එසේ මෙසේ කෙනෙකුට නොවන නිසයි. එම තැනැත්තා හොඳින් පරීක්ෂා කර බලා, ඔහුගේ මානසික තත්ත්වය කෙසේද කියා පරීක්ෂා කර බලා, එවැනි ආයුධයක් පාවිච්චි කරන්න සුදුසුද කියා සොයා බැලීමෙන් පසුවයි, එවැනි ආයුධයක් දිය යුත්තේ. ගම්වල සිටින සමහර ග්‍රාමාරක්ෂක භටයින් තුවක්කු පාවිච්චි කිරීම නිසා කිහිප දෙනෙක් මරුමුවට පත් වූ බව අපි පුවත්පත් මාර්ගයෙන් දක්කා.

1985 ජූනි මස 13 වැනි දින "දිවයින" පුවත්පතේ මේ විධියට තිබෙනවා :

"ග්‍රාමාරක්ෂක භටයකුගේ වෙඩි පහරින් මගියෙක් මරුට

හලාවත පොලීසිය පවසන අන්දමට මෙම සිද්ධිය වී ඇත්තේ වෙන්නප්පුව පොලිස් වසම තුළය."

මේ එක සිද්ධියක්. ග්‍රාමාරක්ෂක භටයින්ට තුවක්කු දීම භයානක බව ගලගෙදර මන්ත්‍රී සහ සංස්කෘතික කටයුතු පිළිබඳ නියෝජ්‍ය ඇමතිතුමා ප්‍රකාශයක් කර තිබෙනවා. එවැනි ප්‍රකාශයක් කිරීම ගැන මා එතුමාට ස්තුතිවන්ත වෙනවා වගේම ඒ ගැන ආඩම්බර වෙනවා. එතුමා සඳහන් කළ ඒ ප්‍රකාශය 1985 ජූනි මස 15 වැනි දින "දිවයින" පුවත්පතේ මේ විධියට සඳහන් වෙනවා :

"ග්‍රාමාරක්ෂක කොමිටි නිලධාරීන්ට තුවක්කු බලපත්‍ර ලබා දුනහොත් තත්ත්වය මීට වඩා භයානක විය හැකිය. එම නිසා තුවක්කු රහිත ග්‍රාමාරක්ෂක කොමිටි පිහිටුවීම මගේ අරමුණයි."

බලන්න මේ අන්දමට තුවක්කු පාවිච්චි කිරීම කොයි තරම් භයානක දෙයක්ද කියා. ඇත්තවශයෙන්ම එතුමාට සංස්කෘතියක් තිබෙනවා. මා ඉතිරි හරිය කියන්න යන්නේ නැහැ. ඊළඟට මේ විධියට සඳහන් වෙනවා :

"ග්‍රාමාරක්ෂක කොමිටිවලට විනය ගරුක නීති ගරුක නිලධාරීන් බඳවා නොගතහොත් ග්‍රාමාරක්ෂක නිලධාරීන් ගම්වැසියනට නයාට අඳුකොළ හා සමාන විය හැකියි."

තමුන්නාන්සේ දන්නවානේ නයාට අඳුකොළ දුන්නොත් මොකක්ද වෙන්නේ කියා. එමනිසා එයට එතුමා විරුද්ධත්වය ප්‍රකාශ කර තිබෙනවා.

ඊළඟට ගම්පහ මූලස්ථාන පොලිස් පරීක්ෂක නිමල් කාරියවසම් මහතා මේ ප්‍රශ්නය ගැන වැදගත් නිවේදනයක් නිකුත් කර තිබෙනවා. මා සොයා බැලුවා මෙය පොලිසියෙන්ද නිකුත් කර තිබෙන්නේ කියා. මොකද, මෙය ඒ තරම් ඥනාන්විත නැති ප්‍රකාශයක්. එම ප්‍රකාශයෙහි මේ විධියට සඳහන් වෙනවා :

". . . . . මෙම ප්‍රදේශයට අයත් නැති මෙම ප්‍රදේශයේ මාර්ගවල නොදුවන පෞද්ගලික බස් රථයක් හෝ යාපනය, වවුනියා, මන්නාරම, ත්‍රිකුණාමලය, මඩකලපුව, පොලොන්නරුව, අනුරාධපුරය හා පුත්තලම වැනි ප්‍රදේශවල ලංගම ඩිපෝවලට අයත් බස් රථයක් හෝ ගම්පහ ප්‍රදේශයට හෝ ගම්පහ නගරයට ඇතුළුවීමේදී මේ පිළිබඳව විශේෂ අවධානයක් යොමුකර බලා එවැනි සැක සහිත වාහනයක් හෝ පුද්ගලයින් දුටුවොත් වහාම ළඟම ඇති පොලීසියට හෝ රජයේ කාර්යාලයකට හෝ ග්‍රාමසේවක නිලධාරි තැනට හෝ වගා නිලධාරි තැනට හෝ විශේෂ සේවා නිලධාරි තැනට හෝ ළඟම ඇති විදුහලේ විදුහල්පතිවරයාට හෝ පංසලේ පල්ලියේ පූජකවරයාට හෝ එම අවට පදිංචිකරුවන්ට හෝ වහාම දැන්විය යුතුය, ඒ මඟින් පිරිස් රැස්කරවා එම වාහනය පිළිබඳව පොලීසිය මඟින් හෝ වෙනත් ආරක්ෂක අංශයන් මඟින් හෝ මහජනයා විසින්ම හෝ පරීක්ෂාකර බලා සැක හැර ගන්නා තෙක් එම වාහනය හෝ පුද්ගලයින්ට නගරයෙන් හෝ ඔබේ ගමෙන් පිටවීමට ඉඩ නොදී ආරක්ෂාකර ගන්න. මේ සඳහා ඔබ කැමති කුමන ආයුධයක් හෝ ඔබේ ආරක්ෂාව සඳහාත් ත්‍රස්තවාදීන් මෙල්ල කිරීම සඳහාත් පරිහරනය කළාට වරදක් නැත."

මිනිහෙක් ගම්පහට එනවා හලාවත ඉඳලා. එහෙම නැත්නම් මිනිහෙක් පුත්තලමේ සිට ගම්පහ නගරයට එනවා. එහෙමත් නැත්නම් පුද්ගලයෙක් අනුරාධපුරයේ සිට එනවා. අපි හඳුනන්නේ නැහැ. මගේ ගමට එවැනි යම් පුද්ගලයෙක් ආවොත් ඇත්තවශයෙන්ම මම නම් හඳුනන්නේ නැහැ. නමුත් මේ ප්‍රකාශයේ හැටියට එවැනි කෙනෙක් අසුවූ හැටියේම කරන්නේ මොකක්ද ? තුවක්කුවක් අතට අරගෙන, ඌ අල්ලා ගෙන, යන්නට දෙන්නේ නැහැ කියා තර්ජනය කර තබාගෙන ඉන්නවා. එහි තුන් වැනි පිටුවේ මෙන්න මෙහෙම තිබෙනවා :

" ත්‍රස්තවාදී කොටි පැමිණිය හැකි වාහනය කුමන ආකාරයකින් හෝ ඔවුන්ට ගෙන යාමට නොහැකි වන පරිදි අබලන් කිරීම නවත් හොද වැඩකි. මේ සඳහා එම වාහනයට ගල් මුල් වලින් ගසා හෝ වෙනත් වාහනයක් හැප්පීමෙන් හෝ කී තොකී වෙනත් ඕනෑම සුදුසු ක්‍රමයක් යොද ගැනීම සුදුසුය. එමෙන්ම නගරයේ ඇති වාහනවල යතුරු ත්‍රස්තවාදීන්ට ලබා ගැනීමට නොහැකි වන පරිදි රියැදුරන් ළඟම තබා ගත යුතුය."

ඊළඟට මෙන්න මෙහෙමත් තිබේනවා :

" බොරු ආරංච පතුරුවන්නන්ගෙන් ඉතා ප්‍රවේශම් විය යුතුය. ජනතා විමුක්ති පෙරමුණට සම්බන්ධ පුද්ගලයින් දැන් ත්‍රස්තවාදීන් කොටින්ට එකතු වී ඇති බවට ආරංචි ලැබී ඇති නිසා එම පක්ෂයේ අයවලුන් පිළිබඳව හොඳ පරීක්ෂාවකින් සිටිය යුතුය.

නිමල් කාරියවසම්,
මූලස්ථාන පොලිස් පරීක්ෂක,
ගම්පහ."

මෙය ඇත්තද කියා මම අසා බැලුවා. මෙය මුද්‍රණය කර තිබෙන්නේ හෙළදිව මුද්‍රණ ශිල්පියෝ—ගම්පහ. මම අච්චු කන්තෝරුවෙනුත් ඇහුවා. හැබැයි එකක් තිබෙනවා. ගම්පහ පොලීසියේ එස්.පී. මහතා—උඩුගම්පොල මහතා—යාපනයට මාරු කර තිබෙනවා. ඉහළින් පැමිණි අණක් නිසා යාපනයට යන්නට සිදුවී තිබෙනවා. මා හිතන්නේ එතුමාට මේ සම්බන්ධව හොඳින් දැන ගන්න පුළුවන් වෙලා තියෙනවා.

ඊළඟට 1985 ජූනි මාසයේ 7 වැනි ද සභාව කල් තබන අවස්ථාවේ ජාතික ආරක්ෂක ඇමතිතුමාගෙන් අසන ලද ප්‍රශ්නයට පිළිතුරක් ලැබුණේ නැහැ. එම ප්‍රශ්නය අසන ලද්දේ දැනට අනාථ කඳවුරුවල සිටින සිංහල දෙමළ මුස්ලිම් හා වෙනත් අයගේ සංඛ්‍යාව සම්බන්ධයෙනුයි. එම ප්‍රශ්නයට වත්මන් සංඛ්‍යා ලේඛණ ඉදිරිපත් කරනවාද කියන එකයි. මම එද ඇසුවේ. ඒ ප්‍රශ්නයට පිළිතුරු දෙන්නට ඒ අවස්ථාවේ එතුමා මෙහි සිටියේ නැහැ. ඒ වකවානුවේදී ත්‍රිකුණාමලයේ අනාථයින් 11,000 ක් ඉක්මවා සිටිනවා යයි කියා තිබෙනවා. එමෙන්ම ඒ ප්‍රදේශයේ ගොවීන් හැටියට සිටි අපේ උදවිය හුඟක් දෙනා ගම්බිම් බලා පිටත්වෙන වකවානුවකයි, මම ඒ ප්‍රශ්නය ඇසුවේ. එම නිසා ඒ සම්බන්ධයෙන් අද තිබෙන තත්ත්වය අපට දැන්වුවොත් මා කෘතඥ වෙනවා.

* පුස්තකාලයේ තබා ඇත.
நூனிலயத்தில் வைக்கப்பட்டுள்ளது.
Placed in the Library.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ලක්ෂ්මන් ජයකොඩි මහතා]

තවත් එක කරුණක් එතුමාගෙන් දැන ගන්නට කැමතියි. එනම් මේ කාරණයයි: "1985 ජූනි මස 25 වන අඟහරුවාද "ඇත්ත" පත්‍රයේ පළමුවැනි පිටුවේ සඳහන් වූ 'හමුදා ඇඳුමින් මැරකම් කරලා' යනුවෙන් වූ ප්‍රවෘත්තිය සම්බන්ධව ගරු ඇමතිතුමා පරීක්ෂණයක් පවත්වන ලද්දේද ? එසේනම් එම වාර්තාව සභාව ඉදිරියේ තියවනවාද ? නොඑසේ නම් ඒ මන්ද ?"

අපට ටැලිග්‍රෑම් එකක් ලැබුණා. ජනාධිපතිතුමාටත් එය යවා තිබෙනවා. ගරු ජාතික ආරක්ෂක ඇමතිතුමාටත් යවා තිබෙනවා. මෙය සිදුවී තිබෙන්නේ අපේ ගම් ප්‍රදේශයේ.

"I, Mrs. Wimalawathie Wickramaarchi, Teacher, Maha Vidyalaya, Kongodamulla, Katana, humbly beg your intervention and ensure and inquiry instituted forhwith and redress my grievance".

I am happy that the Hon. District Minister for Gampaha is here.

"and ensure that my life is not endangered. On the 20th June, 1985 at 1435 hours an army jeep bearing identity No. 5071 with four army personnel arrived at my home at Desagawatta, Katana and threatened bodily harm to me and my husband and fired their guns into the sky and threatened to us."

ආරියරත්න ජයතිලක මහතා (ගම්පහ දිසා ඇමතිතුමා)
(திரு. ஆரியரத்ன ஜயதிலக்க — கம்பஹ மாவட்ட அமைச்சர்)
(Mr. Ariyaratne Jayatillake–District Minister, Gampaha)

සමාවී මට අවස්ථාවක් ලබා දෙනවා නම් ඒ ගැන වචනයක් දෙකක් කියන්නම්.

ලක්ෂ්මන් ජයකොඩි මහතා
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)
(Mr. Lakshman Jayakody)

පසුව පුළුවන්.

"Our lives are now at stake. Please, therefore, I beg you to intervene and institute an inquiry without delay."

That is what she is asking for. I would like to submit it because it appeared in the "Aththa" paper also on the 25th of June, 1985.

ඊළඟට මම ගරු අධිකරණ ඇමතිතුමාගෙනුත් ප්‍රශ්නයක් අසා තිබෙනවා. ප්‍රශ්නය මෙයයි :

"1985 ජූනි මස 8 දින 'දිවයින' පුවත්පතේ සඳහන් වූ 'සේපාල ඒකනායකට හිරගෙදරදී පහර දීලා' යන මැයෙන් වූ ප්‍රවෘත්තිය සම්බන්ධව පරීක්ෂණයක් පැවැත්විද ? එසේ නම් එම වාර්තාව සභාවට ඉදිරිපත් කරනවාද ?"

මම මෙයට පිළිතුරක් බලාපොරොත්තු වෙනවා.

ඒවාගේම 1985 ජූනි මස 16 වන දින එම පත්‍රයේම පළ වූ 'තරුණියන්ගේ මළ සිරුරු කෙළසන බෞද්ධ රටක්' මැයෙන් වූ ප්‍රවෘත්තිය සම්බන්ධයෙන් පරීක්ෂණයක් පවත්වනවාද , එසේ නම් එම පරීක්ෂණ වාර්තාව සභාවට ඉදිරිපත් කරනවාද, එසේ නොවේ නම් ඒ මන්ද ? කියන ප්‍රශ්නය සෞඛ්‍ය ඇමතිතුමාගෙන් අසනවා. මා හිතන හැටියට ගරු ඇමතිතුමා ඒ ප්‍රශ්න කියවන්නට ඇති. එම නිසා ඒවාට කරුණාකර පිළිතුරු ලබා දෙන ලෙස ඉල්ලා සිටිනවා.

ආරියරත්න ජයතිලක මහතා
(திரு. ஆரியரத்ன ஜயதிலக்க)
(Mr. Ariyaratne Jayatillake)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ජූලි මස 7 වන ඉරිද 'රිවිරැස' පත්‍රයේ පළ වී ඇති ප්‍රවෘත්තියකට තමුන්නාන්සේගේ අවධානය යොමු කරවන්නට බලාපොරොත්තු වෙනවා. ඒ ප්‍රවෘත්තියේ තිබෙනවා, මන්ත්‍රීවරුන්ට නැවත වරක් සුඛෝපභෝගී කාර් රජයෙන් ගෙනැවිත් දෙන්නට යනවාය කියා. ඒ සමගම අසනීප තත්ත්වයේ සිටින මන්ත්‍රීවරුන්ට බෙන්ස් කාර් ගෙනැවිත් දෙන්නට යන බවත් සඳහන් කර තිබෙනවා. ඒවා ලැබෙනවා නම් අපට බොහොම සතුටුයි. නමුත් මා හිතන්නේ මේ වාර්තාකාර මහත්මයා යම්කිසි වැරදීමකින් වෙන්නට ඇති, ඒ විධියට සඳහන් කර තිබෙන්නේ. මීට කලිනුත් මන්ත්‍රීවරුන් භුක්ති විඳින වරප්‍රසාද සම්බන්ධයෙන් යම් යම් වැරදි ප්‍රකාශ කර තිබුණා. මේ සම්බන්ධයෙනුත් මහජනතාව තුළ වැරදි අදහස් ඇති වෙන්නට ඉඩ තිබෙනවා.

මෙහිදී 1985.06.03 වන දින 'දිවයින' පත්‍රයේත්, 1985.05.26 වන දින දිවයින පත්‍රයේත් 1985.05.31 වන දින දිවයින පත්‍රයේත් පළ වී ඇති වාර්තා තුනක් ගැනත් ඔබතුමාගේ අවධානය යොමු කරන්නට මා කැමතියි. විශේෂයෙන්ම මැයි 31 වනද පත්‍ර වාර්තාවේ තිබෙනවා, හැම මන්ත්‍රීවරයකුටම රුපියල් දෙලක්ෂ පණස් දහසක පමණ හිඟ මුදලුත් සමග පඩි ලැබෙන්නට යනවාය කියා. බොහොම අමාරුවෙන් ජීවත් වන නිසා අපි වාගේ මන්ත්‍රීවරුන්ට නම් ඒවා ලැබුණත් කමක් නැහැ. නමුත් මේ වාර්තාවල යම් යම් අඩුපාඩුකම් ඇති බව පෙනෙන්නට තිබෙනවා. එම නිසා මේ කාරණා සම්බන්ධයෙන් නිවැරදි තත්ත්වය රටට දැනගන්නට අවශ්‍ය නිසා, ඒ පිළිබඳව තමුන්නාන්සේ කිසියම් පියවරක් ගන්නවා ඇත කියා මා බලාපොරොත්තු වෙනවා. විශේෂයෙන්ම කාර් සම්බන්ධ, පඩි සම්බන්ධ සහ හිඟ පඩි සම්බන්ධව ප්‍රවෘත්ති ගැන කථානායකතුමා විසින් මෙතෙක් මොන අන්දමේ පියවර ගෙන තිබෙනවාද කියා අපි දන්නේ නැහැ. කෙසේ වුණත් සමස්තයක් වශයෙන් මන්ත්‍රීවරුන් වන අප කවුරුත් භුක්ති විඳින වරප්‍රසාද සම්බන්ධයෙන් වැරදි අදහස් රටට මේ ආකාරයෙන් කියන්නට ගියාම ඇත්ත වශයෙන්ම අපේ තත්ත්වයත් ඉතාම භයානක අතට හැරෙන්නට ඉඩ තිබෙනවා. එම නිසා, තමුන්නාන්සේ මේවා සම්බන්ධයෙන් ගරු කථානායකතුමාට දැනුම් දී, මෙම වැරදි අදහස් නිවැරදි කිරීමට සුදුසු යම්කිසි පියවරක් ගන්නවා ඇතැයි මා බලාපොරොත්තු වෙනවා.

රිචඩ් පතිරණ මහතා
(திரு. றிச்சட் பத்திரன)
(Mr. Richard Pathirana)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මගේ පළමුවන ප්‍රශ්නය යොමු කර තිබෙන්නේ ගරු අධ්‍යාපන ඇමතිතුමාටයි. එතුමා හෝ එතුමාගේ නියෝජ්‍ය ඇමතිතුමා මේ සභාවේ දැන් පෙනෙන්නට නැහැ. එසේ වුණත් ළමයකු පාසලට ඇතුළත් කර ගැනීම සම්බන්ධයෙන් මෙම ප්‍රශ්නය එතුමාට යොමු කරනවා. මම එම ප්‍රශ්නය කියවන්නම් :

ගල්කිස්ස, හුලුදගොඩ පාරේ, අංක 65/4 පදිංචි කේ. ඩී. රෝහිනී මහත්මියගේ දරුවා වන අකුරලියගේ නාලක සමත්, කොළඹ දකුණ හේන පාර කණිෂ්ඨ ද්විතික විද්‍යාලයේ බාලාංශ පංතියට ඇතුළත් කිරීම සඳහා අයදුම් පතක් ඉදිරිපත් කර ඇති අතර, ඒ සඳහා කරන ලද පරීක්ෂණයේදී එහි විදුහල්පතිවරයා විසින් පදිංචි සහතිකය සම්බන්ධව විශ්වාස නොකර මෙවැනි සහතික රු. 10/– ගෙවා ඕනෑතරම් ගත හැකි බව පවසා ප්‍රතික්ෂේප කර ඇත. මෙයට විරුද්ධව රෝහිනී මහත්මිය විසින් 03.09.1984 දින අභියාචනයක් ඉදිරිපත් කළ අතර ඒ පිළිබඳ විභාගයක් 10.10.1984 දින එම විදුහල්පතිවරයා ඇතුළත් අභියාචනා මණ්ඩලයක් විසින් පවත්වන ලද අතර මේ දක්වා කිසිදු පිළිතුරක් නැත. ප්‍රදේශයේ ග්‍රාම සේවා නිලධාරී විසින් 1984.07.23 දින නිකුත් කරන ලද පදිංචි සහතිකය 1984.07.24 දින නුගේගොඩ සහකාර ආණ්ඩුවේ ඒජන්ත විසින් සහතික කර ඇත. මෙවැනි නීත්‍යානුකූල සහිතක ප්‍රතික්ෂේප කිරීමට ඇති හේතුව කුමක්ද ? එම සහතිකය ව්‍යාජ බවට විදුහල්පතිවරයා තීරණය කරන ලද්දේ කිනම් පදනමක් යටතේද ? එම දරුවා ඇතුළත් කර ගැනීමට නුසුදුසු වූයේ එම සහතිකයේ ව්‍යාජත්වය නිසා නම් ඒ පිළිබඳව පරීක්ෂණයක් පවත්වා එම දරුවා හේන පාර විදුහලට ඇතුළත් කර ගන්නා ලෙසට එම විදුහල්පතිවරයාට උපදෙස් දෙනවාද ? එසේ නොවේ නම් ඒ මන්ද ?

මේ ප්‍රශ්නයට අධ්‍යාපන ඇමතිතුමාගෙන් පිළිතුරක් මා බලාපොරොත්තු වෙනවා.

මීට කලිනුත් අධ්‍යාපන අමාත්‍යාංශයට අදාළ ප්‍රශ්න කීපයක්ම මා අසා තිබෙනවා. නමුත් අපට තවම ඒ පිළිතුරු ලැබී නැහැ. එමනිසා මම ඔබතුමාගෙන් ඉල්ලන්නට කැමතියි, අප අසන ප්‍රශ්නවලට පසුව හෝ පිළිතුරක් ලබා දෙන්නට කටයුතු කරන්නය කියා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

මම ඊළඟ ප්‍රශ්නය යොමු කරන්නට කැමතියි ගරු ආහාර හා සමූපකාර කටයුතු පිළිබඳ ඇමතිතුමා වෙත, සීනි මිල සම්බන්ධයෙන්. අපට දැන ගන්නට තිබෙන විධියට ලෝක වෙළඳ පොළේ සීනි මිල අඩුවෙලා තිබෙනවා. දැනට ලංකාවේ මුදලින් කිලෝවක් රුපියලකට ආසන්න මිලකට සීනි මිල බැස තිබෙනවා. නමුත් ලංකාවේ සීනි කිලෝවක් විකුණන්නේ රුපියල් 12.50 ටයි. මේ නිසා රජයට විශාල ලාභයක් ලැබෙනවා. මේ සීනි මිල අඩු කරන්නට නොහැකිවී තිබෙන්නේ – අපට දැන ගන්නට තිබෙන විධියට – රජය, පැල්වත්ත හා මොනරාගල සීනි සමාගම් සමග ඇති කරගෙන තිබෙන ගිවිසුමක් නිසා. ඒ සමාගම් මගින් නිෂ්පාදනය කරන සීනි කිලෝවක් රු. 15.65 බැගින් ගැනීමට රජය එකඟ වෙලා ඒ සමාගම් සමග ගිවිසුමකට එළඹිලා තිබෙනවා.

ඩබ්ලිව්. පී. බී. දිසානායක මහතා (මහනුවර දිසා ඇමතිතුමා)
(திரு. டபிள்யு. பீ. பி. திஸாநாயக்க — கண்டி மாவட்ட அமைச்சர்)
(Mr. W. P. B. Dissanayake District Minister, Kandy)

ඒ සමාගම්වල සීනි තවම හදන්නේ නැහැ නේ?

රිචඩ් පතිරණ මහතා
(திரு. றிச்சட் பத்திரன)
(Mr. Richard Pathirana)

තමුන්නාන්සේ දන්නේ නැති ඒවා ගැන කතා කරන්නෙ නැතුව ඉන්නකෝ පොඩ්ඩක්. හැමදේම දන්නවා කියා හිතන්න එපා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, පසුගිය අයවැය විවාදයේදී අපි ගරු ඇමතිතුමාගේ අවධානය මේ ගැන යොමු කළා. මේ ගිවිසුම නිසා ලෝක වෙළඳපොළේ සීනි මිල කොතරම් අඩුවුනත් ලංකාවේ පාරිභෝගිකයන්ට සීනි අඩුමිලට දෙන්නට බැරි තත්ත්වයක් ඇතිවෙනවා කියා අපි කිව්වා. අද ඒ තත්ත්වය මතුවෙලා තිබෙනවා. එමනිසා මම ගරු ආහාර හා සමූපකාර ඇමතිතුමාගෙන් ඉතාමත්ම කරුණාවෙන් ඉල්ලන්න කැමතියි ලෝක වෙළඳපොළේ සීනි මිල අඩුවීමේ වාසිය ලංකාවේ පාරිභෝගිකයින්ට ලැබෙන ආකාරයට සීනි මීට වඩා අඩු මිලකට දෙන්නට කටයුතු කරන්න කියා.

ගරු වෙළඳ ඇමතිතුමාත් සිටින නිසා එතුමාට බලපාන ප්‍රශ්නයකුත් මම ඒකට එකතු කරනවා. පරිප්පු මිල අඩුකරනවා කියා පුවත්පත්වල පළකර තිබුණා. නමුත් පරිප්පු ටැක්ස් එක අඩුවුණාට කඩවල නම් පරිප්පු මිල අඩුවෙලා නැහැ. තවමත් විකුණන්නේ පරණ ගණනටමයි. ඒක නිසා කරුණාකරලා ඒකත් තමුන්නාන්සේලාගේ උත්තරයට එකතු කරලා පිළිතුරු දෙනවා නම් හොඳයි. මේ පුවත පත්‍රවල දැකලා මිනිස්සු අඩු ගණනට පරිප්පු ගන්නට ගියත් විකුණන්නේ පරණ ගණනටමයි. අපට ආරංචියි සතොසට ගෙනා තොග අවස්වන තුරු [බාධා කිරීමක්] තමුන්නාන්සේට පරිප්පු නැතිව බත් කන්න බැරි ලෙඩක් තිබෙනවා නේ. ඒක නිසා පිනට වුනත් ගන්නාට කමක් නැහැ. [බාධා කිරීමක්] එමනිසා මම ඉල්ලනවා කරුණාකරලා පරිප්පු මිල අඩුකර දෙන්න කටයුතු කරන්න කියා.

මම අනිත් ප්‍රශ්නය යොමුකර තිබෙන්නේ සමාජ සේවා ඇමතිතුමාටයි. පසුගිය දවස්වල දකුණු පළාතේ සුළි සුළං, ගංවතුර, මුහුදුකැම ආදිය නිසා පවුල් විශාල සංඛ්‍යාවක් අනාථවෙලා සිටිනවා.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுப் பிரதித் தலைவர் அவர்கள்)
(The Deputy Chairman of Committees)

Order, please! You have not given notice of that Question.

රිචඩ් පතිරණ මහතා
(திரு. றிச்சட் பத்திரன)
(Mr. Richard Pathirana)

මම ඒක හෙට ඉදිරිපත් කරන්නම්.

සුනේත්‍රා රණසිංහ මහත්මිය (වනිතා කටයුතු හා ශික්ෂණ රෝහල් පිළිබඳ ඇමතිතුමිය)
(திருமதி சுனேத்திரா றணசிங்க—மாதர் அலுவல்கள், கற்பித்தல் வைத்தியசாலைகள் அமைச்சர்)
(Mrs. Sunethra Ranasinghe – Minister of Women's Affairs and Teaching Hospitals)

1985.06.16 දින ඉරිද "දිවයින" පත්‍රයේ පළවූ "තරුණියකගේ මළ සිරුර කෙළසන බෞද්ධ රටක්" යන මැයෙන් වූ ප්‍රවෘත්තිය සම්බන්ධව අපි පරීක්ෂණයක් පවත්වා තිබෙනවා. නමුත් ඒ වාර්තාව මේ සභාවට ඉදිරිපත් කරන්නට මට ක්‍රමයක් නැහැ. මොකද, වාර්තාවේ සඳහන් කරුණු සනාථ කිරීමට, පත්‍ර වාර්තාවේ සඳහන් කරුණු සනාථ කිරීමට, මෙතෙක් කිසිම සාක්ෂියක් ඉදිරිපත්වෙලා නැහැ. පරීක්ෂණ නිලධාරියා විසින් මේ ප්‍රවෘත්තිය සකස් කරන ලද පුවත්පත් වාර්තාකරු වන ඉන්ද්‍රදාස නානායක්කාර මහතාගෙන්ද ප්‍රකාශයක් ලබාගැනීමට දැඩි උත්සාහයක් ගත්තේ වී නමුත් ඒ මහතාද තවම ඉදිරිපත්වී නැහැ. තවද, ප්‍රවෘත්තියේ සඳහන් කරුණු ගැන සාක්ෂි තවදුරටත් ලබාගන්නා හෙයින් ඕනෑම අයකුට පරීක්ෂණ නිලධාරියා වෙත ඉදිරිපත්වී එහි සඳහන් කරුණු ගැන සාක්ෂි ඉදිරිපත් කිරීමට තවමත් ඉඩකඩ තිබෙන බව මතක් කරන්න කැමතියි.

ලක්ෂ්මන් ජයකොඩි මහතා
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)
(Mr. Lakshman Jayakody)

පරීක්ෂණය කළේ කවද?

සුනේත්‍රා රණසිංහ මහත්මිය
(திருமதி சுனேத்ரா றணசிங்ஹ)
(Mrs. Sunethra Ranasinghe)

අපේ අමාත්‍යාංශයේ නිලධාරියෙක්. එමනිසා තුන්වැනි ප්‍රශ්නය පැන නගින්නෙ නැහැ.

ලලිත් ඇතුලත් මුදලි මහතා
(திரு. லலித் அத்துலத்முதலி)
(Mr. Lalith Athulath Mudali)

The hon. Member for Attanagalla asked me a number of questions. I hope I got them all correct. I think the first one was about Home Guards. The position about Home Guards is that they are given a training in the use of guns before they are issued to them and they are examined to see whether they are temperamentally and socially desirable people. Before issuing guns to them security precautions are taken. But as you are aware the decision to give weapons to Home Guards was taken in rather special circumstances when we were facing terrorist attacks on civilians and at that time it was important that we acted quickly. So that was done. A lot of good work has been done by Home Guards, but there have also been one or two incidents which have been rather unfortunate. Taking that into account fresh instructions have been issued by His Excellency the President to say that the Home Guards must act chiefly under the police and that two police officers must be present whenever the Home Guards are deployed in any special way like at road blocks or something like that. You find in some are as the Home Guards are the people who come to the fore-front before anybody else. We are also trying to work out a system by which they have to work under the Grama Sevaka and make them generally Peace Officers, but Peace Officers only when called upon to act, not Peace Officers all the time. So that scheme is being worked out. But I want to assure you that the need for the Home Guards to be armed still exists, because if the gome Guards were disarmed and they were removed then the terrorists would once again think of attacking those villages. In fact, on could say quite frankly that the presence of Home Guards has prevented the terrorists attacking innocent civilians in those villages. But once we have got the scheme worked out better we shall certainly inform Parliament.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ලලිත් ඇතුලත්මුදලි මහතා]

Then, Sir, the next matter was about I think the number of refugeers. I have a table of the number of refugees who adre in camps. The total number of camps :

ශුභසාධක මධ්‍යස්ථාන සංඛ්‍යාව 63 යි. ජුලි මාසයේ 4 වන දට පුද්ගලයන් සංඛ්‍යාව 48,227 යි. එයින් ජාතීන් අනුව සංඛ්‍යාලේඛනවල ගණන මෙහෙමයි. සිංහල අය 17,112 යි. ද්‍රවිඩ අය 30,355 යි. මුස්ලිම් අය 760 යි. එකතුව 48,227 යි.

වැඩියෙන්ම සිටින්නේ ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේයි. ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ කඳවුරු 24 ක් තිබෙනවා.

මන්ත්‍රීවරයෙක්
(அங்கத்தவர் ஒருவர்)
(A Member)

ඇයි, මඩකලපුවේ ?

ලලිත් ඇතුලත් මුදලි මහතා
(திரு. லலித் அத்துலத்முதலி)
(Mr. Lalith Athulath Mudali)

